BLUEPRINT 3.0

# උසස් සමාජ වෙළෙඳපොළ ආර්ථිකයක් කරා



සමගි ජන සන්ධානය

සජිත් ප්‍රේමදාස

සැමට ජයක් සමගි රටක්

Blueprint හි මුල් ප්‍රකාශනය වර්ෂ 2022 අගෝස්තු මස 12 වන දින පාර්ලිමේන්තුවේ දී සභාගත කළ අතර, එමගින් ආර්ථිකය ස්ථායී කිරීමෙහිලා අපගේ දැක්ම සවිස්තරාත්මකව ඉදිරිපත් කරන ලදී. Blueprint 2.0 වර්ෂ 2023 පෙබරවාරි මස 14 වන දින ප්‍රකාශයට පත් කළ අතර එමගින් ස්ථායීතාවයෙන් ඔබ්බට ගොස් තිරසර සහ සියල්ල ඇතුළත් සංවර්ධනයක් (inclusive growth) ලඟා කර ගත හැකි ආකාරය විස්තර කරන ලදී.  Blueprint 3.0 මගින් මෙම දැක්ම තවදුරටත් පුළුල් කර ඇති අතර එය ශ්‍රී ලංකාවට සැමට ප්‍රතිලාභ ලැබෙන  (shared prosperity) ලගා කර ගැනීමෙහිලා පවතින සාකල්‍ය ආර්ථිකය සැලැස්මක් වශයෙන් හැඳින්විය හැකිය.

[1] “Blue print” හර්ෂ ද සිල්වා, කබීර් හෂීම් සහ එරාන් වික්‍රමරත්න යන මහත්වරුන්ගෙන් සමන්විත සමගි ජන බලවේගයේ ආර්ථික විද්‍යා ඒකකය විසින් සකස් කරන ලද අතර ඒ සදහා මහාචාර්ය ප්‍රේමචන්ද්‍ර අතුකෝරාල, මහාචාර්ය ප්‍රසන්න පෙරේරා, මහාචාර්ය අමින්ද මෙත්සිල පෙරේරා ඇතුළු විද්වතුන්ගේ වටිනා දායකත්වය කෘතවේදීව සිහිපත් කරමු.මේ සදහා කැපවීමෙන් ක්‍රියාකළ චේතනා රණතුංග, දමින්ත ගුණසේකර, යාසුචී කරුණාරත්න, කේ.ඩී විමංග, සෙලීනා පීරිස් සහ වෙනුර වෙලගෙදර යන කණ්ඩායම වෙත විශේෂ ස්තූතිය පිරිනමමු. මෙම ලේඛනයෙහි අධ්‍යාපනය, සෞඛ්‍ය, අධිකරණ හෝ එවැනි වැදගත් ක්ෂේත්‍රයන්හි ප්‍රතිසංස්කරණ පිළිබඳ ගැඹුරු දැක්මක් ඇතුළත් කර නැත.

සැමට
ජයක්
සමගි
රටක්

BLUEPRINT 3.0

# උසස් සමාජ වෙළෙඳපොළ ආර්ථිකයක් කරා

සජිත් ප්‍රේමදාස

සමගි ජන සන්ධානය

සමගි ජන සන්ධානය



# විධායක සාරාංශය

ශ්‍රී ලංකාවේ පවතින අධික ණයබර, දුර්වල ප්‍රතිපත්තිමය තීරණ සහ දුර්වල පාලනය හේතුවෙන් මේ දක්වා මුහුණ දුන් දරුණුතම ආර්ථික අර්බුදයට තවමත් මුහුණ දෙමින් සිටී. මෑතකාලීනව ගෙන ඇති පියවර ආධාරයෙන් උද්ධමනය අඩුවීම සහ විදෙස් සංචිත වැඩි වීම සිදුවී ඇති නමුත් ආර්ථිකය පූර්ණ වශයෙන් යථාවත් කිරීමේ සහ උසස්භාවයට පැමිණවීමේ මාර්ගය තවදුරටත් ඉතා අභියෝගාත්මක තත්වයක පවතී. අධික මිල ගණන්, ඉහල දැමූ බදු සහ බලාපොරොත්තු විරහිතභාවය සමග පොරබදමින් මෙම ආර්ථික අර්බුදයේ පීඩාව දරා ගැනීමට සාමාන්‍ය ශ්‍රී ලාංකිකයන්ට සිදුව ඇත.

අපගේ Blueprint 3.0 මගින් මෙම අභියෝග ජය ගනිමින් අපගේ සමාජ ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ පුළුල් දේශපාලන මතවාදය තුළ පිහිටා, සමාජ වෙළෙඳපොළ ආර්ථික මූලධර්ම මත සියල්ල ඇතුළත් සංවර්ධනයක් (inclusive growth) ඔස්සේ ආර්ථිකය නැවත නගා සිටුවීම උදෙසා සහ සැමට සමෘද්ධියමත් අනාගතයක් සුරක්ෂිත කිරීම සඳහා උපායමාර්ගික සැලැස්මක් ඉදිරිපත් කර ඇත.

මෙම සැලැස්මේ මූලික පදනමක් වනුයේ දූෂණය පිටුදැකීම අත්‍යවශ්‍ය කරුණක් වන නමුත්, එය ප්‍රමාණවත් විසඳුමක් නොවන බවයි.

තිරසර වර්ධනයක් ලගාකර ගැනීම උදෙසා අපට කොටස් දෙකකින් සමන්විත ප්‍රවේශයක් අවශ්‍ය වේ: ප්‍රථමයෙන් ආර්ථිකය වඩා තරගකාරී කිරීමට සහ ගෝලීය වශයෙන් සම්බන්ධ කිරීම සඳහා ආර්ථික ප්‍රතිසංස්කරණයක් සිදු කළ යුතුය. මෙමගින් මහජනයා අතර ධනය නිර්මාණය කරනු ඇත. දෙවනුව අප විසින් අවදානමට ලක්වූවන් ආරක්ෂා කිරීම වෙනුවෙන් ඉලක්කගත සහනාධාර සමග ශක්තිමත් සමාජ ආරක්ෂණ ජාලයක් තුළින් ආර්ථික යුක්තිය සහ සාධාරණත්වය තහවුරු කළ යුතුය.

රජය සහ පුරවැසියන් සම්බන්ධකරන සියලු ප්‍රතිසංස්කරණ සහ සමාජ ආරක්ෂණයන්ට යටින් පුළුල් ඩිජිටල් වේදිකාවක් පැවතිය යුතුය.

**සමගි ජන බලවේගය (SJB)** සියලු පුරවැසියන් අතර සමෘද්ධිය පෝෂණය කිරීම සඳහා අවශ්‍ය නායකත්වය ලබා දීමට කැපවී සිටී.

---

**සටහන්: වචන අරුත් දැක්වීම**

කෙටිකාලීන S : (වසර එකකි), මධ්‍යකාලීන M : (වසර තුනකි), හෝ දීර්ඝකාලීන L : (වසර දහයකි).

# පෙළගැස්ම


| | |
|---|---|
| විධායක සාරාංශය | 04 |
| ආර්ථිකමය බිඳවැටීම සහ එය නැවත ගොඩ නැගීමේ ගැනීමේ මාර්ගය. | 06 |
| අපගේ ප්‍රවේශය: යුක්තිසහගත සහ සමෘද්ධියමත් සමාජ වෙළෙඳපොළ ආර්ථියක් ගොඩ නැගීම. | 08 |
| BLUEPRINT 3.0 සියල්ල ඇතුළත් තිරසර වර්ධනයක් සඳහා පියවර 10 සැලැස්ම. | 09 |
| 1. විනිවිදභාවය සහ වගවීම | 10 |
| 1.1 දූෂණය මුලින් උපුටා දැමීමේ නිවැරදි නෛතික රාමුව: අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශණ කොමිෂන් සභාව බලගැන්වීම. | 10 |
| 1.2 ස්වාධීන මහජන අභිචෝදක කාර්යාලය | 10 |
| 1.3 රාජ්‍ය ප්‍රසම්පාදනය (Procurement) සඳහා යාන්ත්‍රණය | 11 |
| 1.4 වත්කම් අයකර ගැනීම සඳහා නව නීති | 11 |
| 1.5 රාජ්‍ය මූල්‍ය කළමනාකරණයේ විනිවිදභාවය සහ වගවීම. | 12 |
| 2. ස්වෛරී ණය අර්බුදය කළමනාකරණය කිරීම | 13 |
| 2.1 ණය ප්‍රතිව්‍යුහගතකරණය කිරීමේ කතිකාව අඛණ්ඩව පවත්වා ගෙන යාම. | 13 |
| 2.2 විස්තීරණ ණය පහසුකමේ (EFF) කොන්දේසි පිළිබඳව නැවත සාකච්ඡා කිරීම සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග සම්බන්ධව කටයුතු කිරීම. | 14 |
| 2.3 අක්‍රීය ණය (NPL) අර්බුදය සමග කටයුතු කරන අතරතුර ආර්ථික පද්ධති ස්ථායීතාව පවත්වාගෙන යාම තහවුරු කිරීම. | 15 |
| 3. මූල්‍ය සහ විනිමය අනුපාතික ප්‍රතිපත්තිය | 16 |
| 3.1 මහ බැංකුවේ සහ පොලී අනුපාතිකවල ස්වාධීනතාවය සහ විනිවිදභාවය ශක්තිමත් කිරීම. | 16 |
| 3.2 විනිමය අනුපාතික ප්‍රතිපත්තිය | 17 |
| 4. ආදායම් ඒකාබද්ධකරණය | 18 |
| 5. වියදම් පාලනය | 23 |
| 5.1 රාජ්‍ය වියදම් තාර්කිකකරණය | 23 |
| 5.2 රජය සතු ව්‍යාපාර ප්‍රතිසංස්කරණය කිරීම. | 26 |
| 6. වර්ධනය දිරිමත් කිරීම | 27 |
| 6.1 වෙළෙඳ සහ සෘජු විදේශ ආයෝජන (FDI) ප්‍රතිපත්තිය. | 26 |
| 6.2 කෘෂිකාර්මික, ධීවර සහ පශු සම්පත් බහුමාන ප්‍රතිසංස්කරණ | 32 |
| 6.3 කාර්මික සංවර්ධනය: ගෝලීය අගය දාමයට සම්බන්ධ වීම. | 36 |
| 6.4 සේවා: ප්‍රධාන ආර්ථික ධාවකය | 43 |
| 6.5 ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර (MSMEs) සහ ආරම්භකයින් | 46 |
| 6.6 හරිත සංවර්ධනය: දේශගුණික ක්‍රියාකාරී යෝජනාවලිය | 48 |
| 7. රාජ්‍ය අංශය කළමනාකරණය සහ ඩිජිටල්කරණය | 49 |
| 7.1 රාජ්‍ය අංශය ප්‍රතිසංස්කරණය කිරීම | 49 |
| 7.2 රාජ්‍ය අංශය ඩිජිටල්කරණය සඳහා මූලපිරීම | 50 |
| 8. බලශක්ති සහ උපයෝගිතා ප්‍රතිසංස්කරණ | 52 |
| 8.1 කාර්යක්ෂම සහ විනිවිදභාවයෙන් යුතු බලශක්ති වෙළෙඳපොළක් | 52 |
| 8.2 පුනර්ජනනීය බලශක්තිය | 53 |
| 9. සාධක වෙළෙඳපොළ ප්‍රතිසංස්කරණ | 54 |
| 9.1 ශ්‍රමික: කුසලතාවයෙන් යුක්ත සහ තරගකාරී ශ්‍රම බලකායක් බිහි කිරීම. | 54 |
| 9.2 භූමිය: ඵලදායිතාව වැඩිදියුණු කිරීම සහ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම. | 56 |
| 9.3 ප්‍රාග්ධනය: ගලා ඒම වැඩි කිරීම සහ දේශීය වෙළෙඳපොළ ශක්තිමත් කිරීම | 57 |
| 10. ශක්තිමත් සමාජ ආරක්ෂණ ජාලය | 59 |
| සාරාංශය: සැමට ප්‍රතිලාභ ලබාදෙන මාවතක් | 63 |

# ආර්ථිකමය බිඳවැටීම සහ එය නැවත ගොඩනැගීමේ කර ගැනීමේ මාර්ගය

**නිදහසින් පසු ගත වූ වසර 76 ක කාලය තුළ මානව අයිතිවාසිකම් පිළිබඳ ගැටලු සහ ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ හිඩැස් තිබියදීත් ශ්‍රී ලංකාව මානව සංවර්ධනයෙහිලා සැලකිය යුතු දියුණුවක් අත්පත් කරගෙන ඇත.කෙසේ නමුත් අපගේ ආර්ථික ක්‍රියාකාරිත්වය අභියෝගාත්මක තත්ත්වයක පවතින අතර වර්ෂ 2021-2022 අතර කාලයේදී පැවති දරුණු අර්බුදය එය ඉතිහාසයේ පැවති පහලම මට්ටම සලකුණු කරන ලදී.**

**අර්බුදයට හේතු:** දශක ගණනාවක් පුරා සිදුවූ වැරදි මූල්‍ය කළමනාකරණය,දේශීය සහ විදේශීය ණය කළමනාකරණයේ දුර්වලතා,සහ ප්‍රතිපත්ති හේතුවෙන් අර්බුදය 2022 වසරේදී උච්චතම මට්ටමට ළඟාවන ලදී. කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් එම තත්වය තවත් දරුණු අතට හැරුණු අතර සංචාරක කර්මාන්තයට සහ දේශීය ආර්ථිකයට එමගින් දැඩි පහරක් එල්ල විය. ගෝඨාභය රාජපක්ෂ රජය විසින් 2019 වසරේදී බදු කපා හැරීමත්,2021 වර්ෂයේ දී හදිසියේම රසායනික පොහොර තහනම් කිරීමත් හේතුවෙන් තවදුරටත් ආර්ථිකය අස්ථායී තත්වයට පත් විය.දුර්වල මූල්‍ය,වෙළඳ සහ විනිමය අනුපාතික ප්‍රතිපත්ති හේතුවෙන් දරුණු විදේශ විනිමය අර්බුදයක් සහ විදේශ සංචිත ක්ෂය වීමක් සිදු වූ අතර, 2022 වර්ෂයේ අප්‍රේල් මාසය වන එය විට ණය ගෙවීම පැහැර හැරීමකටද තුඩු දෙන ලදී.

**නැවත යථා තත්ත්වයට පත්වීමේ ප්‍රයත්නයන් සහ IMF වැඩසටහන:** මූලික ප්‍රතිවිරෝධතාවයන්ගෙන් අනතුරුව, වර්ෂ 2022 මැයි මාසයේ දී ශ්‍රී ලංකා රජය ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහාය බලාපොරොත්තු විය.පුළුල් කතිකාවකින් අනතුරුව ඔවුන් විසින් වර්ෂ 2022 සැප්තැම්බර් මාසයේ දී කාර්යමණ්ඩල මට්ටමේ එකඟතාවයකට එළඹි අතර, 2023 මාර්තු මාසයේදී ඇමෙරිකානු ඩොලර් බිලියන තුනක විස්තීරණ ණය පහසුකමක් (ඈත) අනුමත විය.ඒ අනුව වසර හතරක (2023-2027) වැඩසටහනක් මේ වනවිට ක්‍රියාවට නංවා ඇත.එමගින් මූලික ක්ෂේත්‍ර පහක් ඉලක්ක ගත කර ඇති අතර ඒවා නම්: (1) බදු ප්‍රතිසංස්කරණ, (2) මහ බැංකුවේ (CBSL) ස්වාධීනතාවයද ඇතුළු මූල්‍ය ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණය, (3) උපයෝගීතා සහ ඉන්ධන සඳහා පිරිවැය මත පදනම් වූ මිලකරණය, (4) රජය සතු ව්‍යාපාර (SOE) ප්‍රතිසංස්කරණය ,සහ (5) පරිපාලන ප්‍රතිසංස්කරණ සිදු කිරීම වේ.

**පිළිගත හැකි යම් ප්‍රගතිය:** EFF වැඩසටහන ආරම්භ කිරීමෙන් පසු රජය විසින් යම් ප්‍රගතියක් ළඟා කරගෙන ඇත. සැබෑ පොලී අනුපාතික ඉහළ මට්ටමක පැවතියද එමගින් බදු ආදායම වැඩිවීම,ප්‍රාථමික අයවැය ශේෂය වැඩිවීම, උද්ධමනය අඩුවීම සිදුවිය.ආනයන සීමාකිරීම සහ ණය ආපසු ගෙවීම ප්‍රමාද කිරීම මත රුපියල ස්ථාවර වීමත්,විනිමය අනුපාතිකය ස්ථාවර වීමත් සිදුවූ නමුත් තවමත් එය ආර්ථික අර්බුදය ආරම්භ වීමට පෙර පැවැති තත්ත්වයට වඩා දුර්වල මට්ටමක පවතී.ඇතැම් ණය හිමියන් සමග එළඹුණු ගිවිසුම් හේතුවෙන් ණය ප්‍රතිව්‍යුහගතකරණය ද ඉදිරියට පැමිණ ඇත.ඊට අමතරව රජයට පවතින මූල්‍යමය භාරය අවම කිරීම සඳහා ඉන්ධන සහ විදුලිය සඳහා නව මිල යාන්ත්‍රණයක් ද සමග රජය විසින් බලශක්ති ක්ෂේත්‍රයේ ප්‍රතිසංස්කරණ සිදු කර ඇත.

**අභියෝග තවදුරටත්:** ශ්‍රී ලංකාව යම් ප්‍රගතියක් අත්කරගෙන ඇති නමුත් තවදුරටත් අභියෝග ගණනාවකට මුහුණ දෙමින් සිටියි. අර්බුදයේ උග්‍ර අවධිය පසුකර ඇති නමුත් අපගේ නැවත යථාවත් වීම දුර්වල මට්ටමක පවතී. දිළිඳුකම දෙගුණයකින් වැඩි වී ඇති අතර ජනතාවගෙන් මිලියන 07 එයින් පීඩාවට පත්වී ඇත.රජය සතු ව්‍යාපාර ප්‍රතිසංස්කරණය නතර වී ඇත.උද්ධමනය අඩු වී ඇති නමුත්,මිල ගණන් 2019 පැවති තත්ත්වයට වඩා 90% කින් වැඩි වී ඇත.ආර්ථිකය තවමත් දුර්වල මට්ටමක පවතින අතර දළ දේශීය නිෂ්පාදිතය 2019 වර්ෂයට වඩා ඉතා අඩු අගයක පවතින අතර 2023 ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය 2014 වර්ෂය සමඟ සැසදෙයි.ඊට අමතරව කුසලතාවයෙන් පිරිපුන් සහ වෘත්තීමය හැකියාවන්ගෙන් සමන්විත තාරුණ්‍යය බුද්ධිගලනයට ලක්වීම ඉතා තීව්‍ර වී ඇති අතර එය යථාවත් කර ගැනීම දිගුකාලීන අභියෝග යක් එල්ල කරයි. ණය තිරසර බවක් ළඟා කර ගැනීමද තවමත් දීර්ඝ අභියෝගයකි.අප විසින් තවමත් අන්තර්ජාතික ප්‍රාග්ධන වෙළඳපොළ වෙත නැවත ප්‍රවේශය හිමිකරගෙන නැත.දේශපාලන භූමිය සන්සුන් නමුත් දේශපාලනඥයන් සහ එකී ආයතන කෙරෙහි පවතින මහජන විශ්වාසය අවම මට්ටමක පවතී.

**ඉදිරි දැක්ම:** මෙය තීරණාත්මක සංධිස්ථානයකි.මේ වන විට පවතින අභියෝගය වනුයේ කල්පවත්නා ආර්ථික ස්ථාවරත්වයක් ලඟා කර ගැනීම සහ තිරසර, සියලු දෙනාම ආර්ථික වර්ධනයට සම්බන්ධ කර ගන්නා මාර්ගයකට අවතීර්ණ වීමයි. මේ සඳහා කෙටිකාලීන මූල්‍ය ඉලක්ක සපුරා ගැනීම පමණක් නොව දිගුකාලීන ගැටලු විසඳීම සඳහා ගැඹුරු ව්‍යවහාත්මක ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම ද අවශ්‍ය වේ. සමගි ජන බලවේගයේ ආර්ථික සැලැස්ම (BLUEPRINT) මෙම දුර්වලතා නිවැරදි කර දිගුකාලීන වර්ධනයක් සඳහා පුළුල් සැලසුමක් ඉදිරිපත් කරයි.එමගින් සමාජයේ සියලුම කොටස් නැවත යථාවත් වීම සහ අනාගත සංවර්ධනයෙන් ප්‍රතිලාභ ලබන බව සහතික කරමින් ඔරොත්තු දීමේ හැකියාව, නවෝත්පාදනය සහ සියල්ල ඇතුළත් සංවර්ධනය කරා යන මාවත නිරූපණය කරයි.

## අපගේ ප්‍රවේශය :

# යුක්තිසහගත සහ සමෘද්ධිමත් සමාජ වෙළෙඳපොළ ආර්ථිකයක් ගොඩනැගීම.

සමාජ ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ අපගේ දේශපාලන දෘෂ්ටිවාදය තුළ හිඳිමින්, සමාජ වෙළෙඳපොළ ආර්ථිකයක් පිළිබඳ අපගේ ආර්ථික ආකෘතිය සැමට ආර්ථික සාධාරණත්වය සහ සමාජ ආරක්ෂාව සහතික කරන අතරම වෙළෙඳපොළ බලය උපයෝගී කර ගනිමින් සාධාරණ සහ සියල්ල ඇතුළත් වර්ධනයක් ඇති කරනු ලබයි.

ආර්ථික නිදහස, නව්‍යකරණයට සහ වර්ධනයට අවශ්‍ය ජවය සපයයි. ජාත්‍යන්තර වෙළඳාම සහ ආයෝජන සඳහා තරඟකාරිත්වය සහ විවෘතභාවය ප්‍රවර්ධනය කිරීම සඳහා අප විසින් වෙළෙඳපළ ඉලක්ක කරගත් ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ වෙනුවෙන් පෙනී සිටින්නේ එබැවිනි. මෙම නිදහස රාජ්‍ය මූල්‍ය වගකීම, ස්ථාවර මුදල් ඒකකයක්, මිල ස්ථායීතාවය සහ නම්‍යශීලී ශ්‍රම වෙළඳපොළක් සමඟ අත්වැල් බැඳගෙන ගමන්කරන බව අපි විශ්වාස කරමු.

තනි පුද්ගල ආර්ථික මූලපිරිම්වලට බාධාවක් නොවන පරිදි මෙම ප්‍රතිලාභ සාධාරණ ලෙස බෙදා හැරීම රජය විසින් සහතික කළ යුතුය. ආර්ථික යුක්තිය සඳහා අවදානමට ලක් වූවන් ආරක්ෂා කරන සහ සම්පත් සාධාරණ ලෙස බෙදා හැරීම සහතික කරන ඉලක්කගත ප්‍රතිපත්ති අවශ්‍ය වේ. පුළුල් සහනාධාර මත පමණක් රඳා නොසිට, අවශ්‍යතා ඇති අයට සෘජුවම උපකාර වන කාර්යක්ෂම සමාජ ආරක්ෂණ ජාලයක් මෙයට ඇතුළත් වේ.

මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ශක්තිමත් ආයතනික රාමුවක් සමඟ ආර්ථික ප්‍රතිසංස්කරණ ඒකාබද්ධ කිරීමක් අවශ්‍ය වේ. මෙයට පාරදෘෂ්‍ය පාලනයක් සහ ස්වාධීන නියාමන ආයතන, විශේෂයෙන්ම දේශපාලන බලපෑමෙන් තොරව මහ බැංකුව පැවතීම ඇතුළත් වේ. දේපල අයිතිවාසිකම් (property rights) සහ ගිවිසුම් ආරක්ෂා කරන (Contract Enforcement) නීතියේ ආධිපත්‍යයේ ශක්තිමත් පදනමක් අපි අපේක්ෂා කරමු. විශේෂ ලෙස, අපි එහි මූලික කාර්යයන් කෙරෙහි ඵලදායී ලෙස අවධානය යොමු කරන කාර්යක්ෂම රාජ්‍යයක් වෙනුවෙන් පෙනී සිටිමු - එනම් අත්තනෝමතික අභිමතානුසාරී බලයට වඩා පැහැදිලි නීති මගින් මඟ පෙන්වනු ලබන අපක්ෂපාතීව ක්‍රියා කරන රාජ්‍යයකි.

## ආර්ථික වර්ධන අභියෝගය (The Growth Challenge)

ශ්‍රී ලංකාවේ දිගුකාලීන සංවර්ධන ගමන්මග සහ වත්මන් ආර්ථික අභියෝග අවබෝධ කර ගැනීම ඵලදායී වර්ධන විනිශ්චයක් ලබා ගැනීම සඳහා ඉතා වැදගත් වේ. නිදහස ලැබීමෙන් පසු ප්‍රථමයෙන්ම ශ්‍රී ලංකාව කොරියානු යුද්ධයෙන් රබර් සඳහා වූ බලපෑම හේතුවෙන් තාවකාලික ආර්ථික ශක්තියක් ලබා ගත්තේය. කෙසේ වෙතත්, 1950 දශකයේ මැද භාගයේ සිට 1977 දක්වා කාලය තුළ මධ්‍යගතකරණය සහ අභ්‍යන්තර ප්‍රතිපත්ති නිසා අපනයන වර්ධනය අඩාල විය. 1977 දී ලිබරල්කරණය මගින් මූලික ආයෝජන සහ වෙළඳාම දිරිමත් කළද, වර්ධනය බොහෝ දුරට ආනයන මත තීරණය විය. තවද අසම්පූර්ණ ආර්ථික ප්‍රතිසංස්කරණ න්‍යාය පත්‍ර, වැරදි මූල්‍ය කළමණාකරණය සහ සිවිල් ගැටුම් හේතුවෙන් ආර්ථික අසමතුලිතතා ආමන්ත්‍රණය කිරීමේ ප්‍රයත්න යටපත් විය.

මෙම අභියෝග මධ්‍යයේ වුවද ශ්‍රී ලංකාව 1990 සිට 2009 දක්වා 4.2% ක සාමාන්‍ය වාර්ෂික ඒකපුද්ගල දළ දේශීය නිෂ්පාදිත (GDP per capita) වර්ධනයක් අත්කර ගත්තේය. යුධ ගැටුමේ අවසානය සහ ගෝලීය ආර්ථික අවපාතය යථා තත්ත්වයට පත්වීම මූලික වශයෙන් එවැනි වර්ධනයක් ඇති වීම සඳහා ආයෝජකයින්ගේ විශ්වාසය ඉහල නැංවිය. කෙසේ වෙතත්, පාස්කු ඉරිදා ප්‍රහාරය ඇතුළු දේශීය ගැටලු හේතුවෙන් වර්ෂ 2019 මුල් භාගයේදී ආර්ථික වර්ධනය 2.6% කින් හැකිලුණි. Covid-19 වසංගතය හේතුවෙන් 2020 දී ආර්ථිකයේ 4.6% ක වාර්තාගත හැකිලීමක් ඇති කළේය. ණය අර්බුදයෙන් පසුව ආර්ථිකය වර්ෂ 2022 දී 7.3% කින් සහ වර්ෂ 2023 දී 2.3% කින් හැකිලී ගියේය.

අපි ඉදිරියට යන විට, අපගේ ආසන්නතම ඉලක්කය වන්නේ 2019 සිට පවතින ආර්ථිකය හැකිලීමෙන් මිදීම සහ මෙම අර්බුදයෙන් සම්පූර්ණ ප්‍රකෘති ස්වභාවයක් ළඟා කර ගනිමින් ආර්ථිකය දියුණු ආර්ථිකයක් කරා යන මාවතට යොමු කිරීමයි. ශ්‍රී ලංකාවට වර්ෂ 2029 සිට අඛණ්ඩව 10% ක වාර්ෂික වර්ධන වේගයක් වාර්තා කළ හැකි නම් (IMF සහ රජය එකඟ වූ වර්ධන වේගය ඒ වන විට 3.1% දක්වා පමණක් වැඩි වී ඇති බැවින්), වාර්ෂික ඒක පුද්ගල දළ ජාතික ආදායම (GNI per capita) ආසන්න වශයෙන් ඇමරිකානු ඩොලර් 23,000 ක ඉහළ ආදායම් තත්වයක් අපට වර්ෂ 2047 වන විට  ළඟා කරගත හැකිය.

අපගේ වර්ධන උපායමාර්ගය ප්‍රධාන ක්ෂේත්‍ර දෙකක් කෙරෙහි අවධානය යොමු කරයි:

බාධක බිඳ දැමීම සහ පාලම් ගොඩනැගීම (Breaking Walls and Building Bridges)
අපි සහයෝගීතාවය වර්ධනය වීම දිරිමත් කර, වර්ධනයට ඇති බාධක ඉවත් කර, ගෝලීය අගය දාමයට සම්බන්ධ කර සංවර්ධනය සඳහා නව අවස්ථා විවෘත කරන්නෙමු.

අභ්‍යන්තර කාර්යක්ෂමතා වැඩිදියුණු කිරීම් (Internal Efficiency Improvements):
අපි පරිපාලන ක්‍රියාවලීන් වැඩිදියුණු කරන අතර සියලුම අංශ තුළ කාර්යක්ෂමතාව සහ ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා ඩිජිටල්කරණය දිරිමත් කරන්නෙමු.

## සියලු ශ්‍රී ලාංකිකයන් ඇතුළත් තිරසර වර්ධනයක් සඳහා පියවර දහයක සැලැස්ම.

ශ්‍රී ලංකාවේ ආර්ථික තත්ත්වය තවමත් අභියෝගාත්මක වන අතර, පහත සවිස්තරාත්මකව දක්වා ඇති පරිදි ප්‍රධාන ක්ෂේත්‍ර දහයක ඉලක්කගත ප්‍රතිසංස්කරණ හරහා මෙම ආර්ථිකය ප්‍රකෘතිමත් කිරීමේ මාවත වැටී ඇත.

### ප්‍රතිසංස්කරණයේ කුළුණු 10:

01 විනිවිදභාවය සහ වගවීම

02 ණය අර්බුදය කළමනාකරණය කිරීම

03 මූල්‍ය හා විනිමය අනුපාත ප්‍රතිපත්තිය

04 ආදායම් ඒකාබද්ධ කිරීම

05 වියදම් පාලනය

06 වර්ධනය දිරිමත් කිරීම

07 රාජ්‍ය අංශය කළමනාකරණය සහ ඩිජිටල්කරණය

08 බලශක්ති සහ මහජන උපයෝගිතා ප්‍රතිසංස්කරණ

09 සාධක වෙළෙඳපොළ ප්‍රතිසංස්කරණ

10 ශක්තිමත් සමාජ ආරක්ෂණ ජාලය

# 01 විනිවිදභාවය සහ වගවීම

ශ්‍රී ලංකාව 2023 දූෂණ සංජානන දර්ශකයේ (Corruption Perceptions Index) රටවල් 180 ක් අතරින් 115 වැනි ස්ථානයට පත්ව ඇති අතර, ලකුණු 100 න් 34 ක් ලබා ඇත. දූෂණයට ආමන්ත්‍රණය කිරීම මූල්‍ය ඒකාග්‍රතාවය, සියල්ල ඇතුළත් වර්ධනය සහ සමාජ සංවර්ධනය සඳහා ඉතා වැදගත් වේ. වර්ෂ 2023 ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විනිශ්චය තක්සේරුව මගින් රාජ්‍ය පුරා, විශේෂයෙන්ම ආදායම් එකතු කිරීමේ සහ පොදු ප්‍රසම්පාදනයන්හි පුලුල්ව පැතිරුනු දූෂණ පවතින බව අනාවරණය විය. මෙම විනිශ්චයන් සමග අපි එකඟ වෙමු. මෙම දුර්වලතා පුළුල් වී ඇත්තේ වගකිවයුතු ආයතනවලට මෙම ගැටළු විසඳීමට අවශ්‍යතාවයක් සහ නිපුණතාවයක් නොමැති බැවිනි. දූෂණය නැමති පිළිකාවට එරෙහිව සටන් කිරීම සඳහා, අපගේ රජය විසින් විනිවිදභාවයට ප්‍රමුඛත්වය ලබා දෙන, තාක්ෂණය දිරිමත් කරන සහ ශක්තිමත් නීති හඳුන්වා දෙන ප්‍රමුඛතා නිර්දේශ දහසයම ක්‍රියාත්මක කරනු ඇත. එමෙන්ම, අපි තවත් ඉදිරියට ගොස් දූෂණ සිදු කළ තැනැත්තන් නීතිය ඉදිරියට ගෙන ඒමට පවතින සියලු ආකාරයේ දේශපාලන මැදිහත්වීම් ඉවත් කිරීම සඳහා ස්වාධීන මහජන අභිචෝදකයෙකු (Public Prosecutor) නිර්මාණය කරන්නෙමු. එසේම විනිවිදභාවය වැඩි දියුණු කිරීම සඳහා නීතිමය සහ නියාමන රාමුවල ව්‍යුහාත්මක ගැටළු සහ හිඩැස් නිවැරදි කිරීමද අත්‍යවශ්‍ය වේ.

## 1.1 දූෂණය මුලින් උපුටා දැමීමේ නිවැරදි නෛතික රාමුව: අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ෂණ කොමිෂන් සභාව බලගැන්වීම.

ශ්‍රී ලංකාවේ 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනත මගින් අල්ලස්, දූෂණ සහ ඒ ආශ්‍රිත වැරදි විමර්ශනය කිරීම සඳහා ස්වාධීන කොමිෂන් සභාවක් ස්ථාපනය කරන ලදී. මෙම කොමිෂන් සභාවට දේශීය හා විදේශීය ආයතන සමඟ සහයෝගයෙන් කටයුතු කළ හැකි අතර, එමගින් එහි කාර්යක්ෂමතාවය වැඩි දියුණු කරයි. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව (CIABOC) දශක දෙකකට වැඩි කාලයක් ක්‍රියාත්මක වන අතර, නව පනත එයට සැලකිය යුතු නව රාජකාරි ලබා දී ඇත. දූෂණ විරෝධී උපාය මාර්ග සංවර්ධනය කිරීම, දූෂණ වැළැක්වීම, විමර්ශනය සහ නඩු පැවරීම සහ රජය පුරා දූෂණ විරෝධී ප්‍රයත්නයන් සම්බන්ධීකරණය කිරීම මෙයට ඇතුළත් ය. තවදුරටත් විනිවිදභාවය ප්‍රවර්ධනය කිරීම සහ දූෂණයට එරෙහිව සටන් කිරීම සඳහා අපි පහත සඳහන් අතිරේක නීතිමය ක්‍රියාමාර්ග ක්‍රියාවට නංවන්නෙමු.

| මැදිහත්වීම | කාලරාමුව |
|---|---|
| **ශක්තිමත් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ෂණ කොමිෂන් සභාවක්** (CIABOC): අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ෂණ කොමිෂන් සභාව හට ස්වාධීන විමර්ශන සඳහා අධිකාරිය ප්‍රදානය කිරීම, ඒකාබද්ධ විමර්ශන සඳහා දේශීය සහ ජාත්‍යන්තර සමගාමී ආයතන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම, සෝදිසි කිරීම් සහ පරිග්‍රහන මෙහෙයුම් සිදු කිරීම, වරෙන්තු රහිත අත්අඩංගුවට ගැනීම් සහ දූෂණයට එරෙහිව අවශ්‍ය අනෙකුත් ක්‍රියාමාර්ග ගැනීම. | S |
| **වත්කම් ප්‍රකාශය:** තේරී පත් වන මහජන නියෝජිතයන් සහ රාජ්‍ය නිලධාරීන්ගේ වත්කම් සහ වගකීම් ප්‍රකාශ කළ යුතු බවට නීති සම්පාදනය කිරීම.<br>**සටහන:** මෙය දැනට ක්‍රියාත්මක වෙමින් පවතී. | S |
| **පැහැදිලි නොකල ධනය සම්බන්ධ නීතිය:** පනතේ නිශ්චිතව දක්වා ඇති නිර්ණායක අනුව සැක සහිත මාර්ගවලින් ධනය උපයාගත් බවට සැක කරන පුද්ගලයෙකු ගැන ඕනෑම පුරවැසියෙකුට මහජන අභිචෝදක කාර්යාලයට වාර්තා කළ හැකි පැහැදිලි කළ නොහැකි ධනය පිළිබඳ නීතියක් සැකසීම. | S |

## 1.2 ස්වාධීන මහජන අභිචෝදක කාර්යාලය. (Public Prosecutor Office)

ශ්‍රී ලංකාවේ නීතිපති (AG) දෙපාර්තමේන්තුවට දූෂණ නඩු සම්බන්ධයෙන් බැඳියාවන් පිළිබඳ ගැටීමක් පවතී. එක් අතකින් නීතිපතිවරයා රජය සහ එහි නිලධාරීන් වෙනුවෙන් පෙනී සිටී. අනෙක් අතට එම නිලධාරීන්ට දූෂණ චෝදනා එල්ල වුවහොත් ඔවුන්ට එරෙහිව නඩු පැවරීමට නීතිපතිවරයාට සිදුවෙයි. මෙහි වත්මන් පරිචය වනුයේ ස්වාධීනත්වය සහ විනිවිදභාවය ආරක්ෂා කිරීම සඳහා කිසිදු මාර්ගෝපදේශයක් නොමැතිව නීතිපති දෙපාර්තමේන්තුව නිතර එවැනි කටයුතුවල නිරත වීමයි. සැකකරුවෙකු සම්බන්ධයෙන් මහාධිකරණයක් ඉදිරියේ පැවැත්වෙන අපරාධ නඩු විභාග නතර කිරීමේ තනි අභිමතයද නීතිපතිවරයා සතුය.

| මැදිහත්වීම | කාලරාමුව |
|---|---|
| **මහජන අභිචෝදක කාර්යාලය:** නීතිපතිවරයාගේ බලපෑමෙන් තොර අල්ලස් හෝ දූෂණ විමර්ශණය සඳහා ස්වාධීන මහජන අභිචෝදක කාර්යාලයක් පිහිටුවීම; සිද්ධිමය සහ ප්‍රත්‍යක්ෂය යන දෙකම. මේ සදහා සරල ව්‍යවස්ථා සංශෝධනයක් පමණක් ප්‍රමාණවත් අතර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් අවශ්‍ය නොවේ. | S |
| **දූෂණ නඩු කඩිනම් කිරීම:** තාක්ෂණික හේතූන් මත නීතිපතිවරයා විසින් ඉල්ලා අස්කර ගන්නා ලද සියලුම දූෂණ චෝදනා නැවත ගොනු කිරීම සහ දීර්ඝ කාලයක් විභාග වන නඩු කඩිනම් කිරීම. | S |

## 1.3 රාජ්‍ය ප්‍රසම්පාදනය සදහා යාන්ත්‍රණය

ශ්‍රී ලංකාවේ රාජ්‍ය ප්‍රසම්පාදනය සඳහා වන වියදම ඉතා අධිකය. එමනිසා, සුළු අක්‍රමිකතා පවා සැලකිය යුතු දූෂණයකට තුඩු දිය හැකිය. ප්‍රසම්පාදන සැලැස්මක් නොමැතිකම, ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටි නොසලකා හැරීම, ප්‍රමාණවත් තරඟකාරිත්වයක් නොමැතිකම සහ විශාල යටිතල පහසුකම් ව්‍යාපෘති සඳහා විශේෂ ඉල්ලීමක් සිදු නොකළ යෝජනා භාර ගැනීම මෙහි ඇති ප්‍රධාන දුර්වලතා කිහිපයකි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සඳහා විවිධ තාවකාලික වෙනස්කම් ගණනාවක් සිදු කර ඇති අතර, ඒ සම්බන්ධයෙන් තීරණ ගැනීමේදී වර්තමාන විධායකයේ අභිමතය ඉහළ මට්ටමක පවතී. මෙම සියලු ගැටළු සහ තවත් බොහෝ දේ ප්‍රසම්පාදනයේදී දැවැන්ත දූෂණයකට තුඩු දී ඇත. අප විසින් නව නීති සම්පාදනය කිරීම, ආයතනික රාමුව ශක්තිමත් කිරීම සහ රාජ්‍ය ප්‍රසම්පාදනවල විනිවිදභාවය ශක්තිමත් කිරීම මගින් මෙම දෝෂවලට විසඳුම් ලබා දෙනු ලබයි.

| මැදිහත්වීම | කාලරාමුව |
|---|---|
| **රාජ්‍ය ප්‍රසම්පාදන නීතිය:** හොදම ගෝලීය භාවිතයන් පිළිබිඹු කරන නීති සම්පාදනය කිරීම සහ සියලුම පොදු ප්‍රසම්පාදන මෙම නව නීති මගින් අනිවාර්යයෙන් ආවරණය වන බව සහතික කිරීම. නීතිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ආයතනික ව්‍යුහය ඇති කිරීම. | S |
| **විද්‍යුත් ප්‍රසම්පාදන:** සියලුම රාජ්‍ය ප්‍රසම්පාදන ගනුදෙනු විද්‍යුත් වේදිකාවකට ගෙන සියලුම ප්‍රසම්පාදන මහජන පරීක්ෂාව සඳහා අදාළ විස්තර සහිතව ප්‍රකාශයට පත් කිරීම. | M |

## 1.4 වත්කම් අයකර ගැනීම (Asset Recovery) සදහා නව නීති

වර්තමානයේ පවතින වත්කම් අයකරගැනීමේ නීතිවල සංකීර්ණ අන්තර්ජාතික මූල්‍ය අපරාධ මැඩලීමේ ප්‍රයත්නයන්ට බාධා වන හිඩැස් ඇත. යෝජිත සොරකම් කරන ලද වත්කම් අයකර ගැනීමේ පනත මගින් මෙම ගැටලුවලට විසඳුම් ලබා දෙන අතර, එමගින් දූෂණයට එරෙහිව සටන් කිරීමට සහ දේශපාලනඥයන් සහ නිලධාරීන් විසින් සොරකම් කරන ලද වත්කම් ආපසු අයකර ගැනීමට ශක්තිමත් නීතිමය රාමුවක් ද සපයයි. අපි පහත සදහන් කරුණු නව නීතියට ඇතුළත් කරන්නෙමු.

| මැදිහත්වීම | කාලරාමුව |
|---|---|
| **අන්තර්ජාතික රාමුව:** | |
| ☎ ව්‍යවස්ථාදායක ප්‍රයත්නයන්ට මග පෙන්වීම සඳහා G20 හි එළදායී වත්කම් අයකර ගැනීමේ ප්‍රධාන මූලධර්ම 9 ක්‍රියාත්මක කිරීම. ඒ තුළ වත්කම් අයකර ගැනීම ප්‍රතිපත්තිමය ප්‍රමුඛතාවයක් බවට පත් කිරීම, ප්‍රතිපත්තිවලට සහාය වීම සඳහා සම්පත් පෙළගැස්වීම සහ සොරකම් කරන ලද වත්කම් වහා සොයා ගැනීමට, පරිග්‍රහණය කිරීමට සහ රාජසන්තක කිරීමට බලධාරීන්ට බලය ලබා දීම මෙයට ඇතුළත් වේ. | S |
| ☎ වත්කම් අයකර ගැනීම සඳහා නීතිමය රාමුව වැඩිදියුණු කිරීම සහ ජාත්‍යන්තර සහයෝගීතාව ශක්තිමත් කිරීම සඳහා දූෂණයට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතිය (UNCAC) අපරානුමිත කිරීම. | M |
| **නෛතික සිද්ධීන්:** දූෂණ නඩු සමථයට වත්කම් අයකර ගැනීමේ යාන්ත්‍රණයන් ඒකාබද්ධ කිරීම | S |

## 1.5 රාජ්‍ය මූල්‍ය කළමනාකරණයේ (PFM) විනිවිදභාවය සහ වගවීම.

**රාජ්‍ය මූල්‍ය විනිවිදභාවය ස්ථර දෙකකින් ඉතා වැදගත් වේ. පළමුව රජය විසින් වියදම් සැලසුම්, වැඩසටහන් ප්‍රතිපාදන සහ ණය කළමනාකරණ උපාය මාර්ග අතුළු අයවැය පොරොන්දු සහ වගකීම් පිළිබඳ පැහැදිලි තොරතුරු සැපයිය යුතුය. දෙවනුව බදු පරිපාලනය විනිවිදභාවයෙන් යුක්ත විය යුතුය. ඡඵප 2023 විනිශ්චය තක්සේරුවේ විස්තර කර ඇති පරිදි, ඉහළ කළමනාකාරිත්වය ඇතුළු ආදායම් නිලධාරීන් අතර දූෂණය පුළුල් ලෙස පැතිර පවතී. මෙම තත්ත්වය වෙනස් කිරීම සඳහා නව ව්‍යුහයන්, පද්ධති සහ තාක්ෂණය අපි යෝජනා කරමු.**

| මැදිහත්වීම | කාලරාමුව |
|---|---|
| **පාර්ලිමේන්තු අයවැය කාර්යාලය** (PBO)**:** කඩිනමින් යම් මූල්‍යමය සීමාවකට වඩා ඉහළින් ඇති සෑම යටිතල පහසුකම් ව්‍යාපෘති ඇතුළුව එක් එක් අයවැය හෝ කැබිනට් අනුමත වියදම් යෝජනාවල පිරිවැය සහ ප්‍රතිලාභ තක්සේරු කරන ස්වාධීන පාර්ලිමේන්තු අයවැය කාර්යාලයක් පිහිටුවීම සහ එම තොරතුරු ප්‍රසිද්ධියට පත් කිරීම. රාජ්‍ය මූල්‍ය කළමණාකරණ පියවරයන් ඇගයීම සඳහා PBO සමඟ වැඩ කිරීමට ස්වාධීන පුද්ගලයන්ද දිරිමත් කරයි. | S |
| **මහජන වගවීම:** සියලුම බදු සහනවල (tax incentives) සඵලතාවය තක්සේරු කිරීම් පිළිබද නිතිපතා සමාලෝචන ප්‍රකාශනය කිරීම අනිවාර්ය කිරීම සහ අවශ්‍ය පරිදි සංශෝධන සලකා බැලීම. යෝජිත සියලුම බදු සහන පාර්ලිමේන්තුව විසින් විවාදයට ගැනීමට පෙර රාජ්‍ය මුදල් කාරක සභාව විසින් ඇගයීම, සාකච්ඡා කිරීම සහ අනුමත කිරීම. | S |
| **පළාත් පාලන අයවැය:** පළාත් පාලන ආයතන සහ පළාත් සභා රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (PFM) පනතේ විෂය පථය තුළට ගෙන වීම සහ ආදායම් සහ වියදම් පිළිබඳ කාර්තුමය වාර්තා ඉදිරිපත් කිරීම අනිවාර්ය කිරීම. | M |

**මේ සියල්ල සඳහා පදනම වනුයේ 'පොදු ඩිජිටල් යටිතල ව්‍යුහයක්'** (DPI) **වන අතර එමඟින් ආර්ථිකය පුරා විනිවිදභාවය, වගවීම සහ කාර්යක්ෂමතාව ප්‍රවර්ධනය කරනු ඇත.** මෙම ව්‍යාපෘතිය පිළිබඳ වැඩිදුර තොරතුරු අංක 7 (රාජ්‍ය අංශයේ කළමනාකරණය සහ ඩිජිටල්කරණය) හි දක්වා ඇත.

# 02 ස්වෛරී ණය අර්බුදය කළමනාකරණය කිරීම

**ශ්‍රී ලංකාවේ ස්වෛරී ණය අර්බුදය බරපතල ආර්ථික අභියෝගයක් ලෙස පවතී. ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ සාකච්ඡා වල ප්‍රගතියක් ඇති නමුත්, ණය තිරසාරත්වය සාක්ෂාත් කර ගැනීමට තවමත් දීර්ඝ මාවතක් ඇත. බොහෝ ශ්‍රී ලාංකිකයන් ප්‍රමාදයන් සහ 'අයහපත් ගනුදෙනු' නිසා ඇතිවන තවත් අර්බුදයකට බිය වෙති. මේ සඳහා මූලික විසඳුම කඩිනම් නමුදු, සාධාරණ සාකච්ඡා අවසන් ඒකඟතාවයකට මග පාදනු ඇත.**

## 2.1 ණය ප්‍රතිව්‍යුහගතකරණය කිරීමේ කතිකාව අඛන්ඩව පවත්වාගෙන යාම.

රජය විසින් මේ වන විටත් Paris Club nations, ඉන්දියාව සහ චීනය (එක්සිම් බැංකුව) ඇතුළත් නිල ණයහිමියන්ගේ කමිටුව (OCC) සමග ද්විපාර්ශ්වික ණය ගිවිසුම අවසානයකට ගෙනවිත් ඇත. ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර (ISB) දරන්නන් නියෝජනය කරන Ad-Hoc සමූහය සහ චීන සංවර්ධන බැංකුව සමඟ ගිවිසුම් OCC සහ IMF හි ණය තිරසාර පරාමිතීන් සමඟ සංසන්දනය කිරීම සඳහා තක්සේරු කෙරේ. ණය ප්‍රතිව්‍යුහගත කිරීම කඩිනමින් අවසන් කළ යුතුය. සියලුම ණය හිමියන්ට සාධාරණ ලෙස සැලකීම සඳහා ද අපි පෙනී සිටිමු. ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර (ISB) දරන්නන්ගෙ Ad-Hoc සමූහය විසින් යෝජනා කරන ලද පරිදි ඔවුන් බලාපොරොත්තු වූවාට වඩා හොඳ ආර්ථික කාර්ය සාධනයකින් ප්‍රතිලාභ ලබන්නේ නම්, රජය සහ EPF අතර පවතින ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ගිවිසුමේ සංශෝධනයක් තුළින් 'claw back' කොන්දේසියක් හරහා EPF ද මෙයට හවුල් කරගත යුතු යැයි අපි විශ්වාස කරමු. සමගි ජන බලවේග රජයක් යටතේ අපි ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ප්‍රධාන ආර්ථික අංගයන් වැඩිදියුණු කළ පාලනයක් සමග ඒකාබද්ධ කිරීමෙන් ණයහිමියන් සහ ජාත්‍යන්තර මූල්‍ය වෙළඳපොලවල් අතර විශ්වසනීයත්වය නැවත ගොඩනගන්නෙමු. සක්‍රිය වගකීම් කළමනාකරණ නීතිය (2018) යටතේ කැපවූ සහ දක්ෂ භාණ්ඩාගාර කළමනාකරණ ආයතනයක් හරහා අපි අපගේ වගකීම් ක්‍රියාකාරීව කළමනාකරණය කරන්නෙමු.

| මැදිහත්වීම | කාලරාමුව |
|---|---|
| **ණය සාකච්ඡා:** මැතිවරණ කාලය වන විට බාහිර ණය ප්‍රතිව්‍යුහගත කිරීම අසම්පූර්ණව පවතී නම්, ද්විපාර්ශ්වික සහ වාණිජ ණය හිමියන් සමඟ ශ්‍රී ලංකාව සඳහා කළ හැකි හොඳම ගනුදෙනුව සාකච්ඡා කිරීමට අවශ්‍ය දේශපාලන නායකත්වය අපි ලබා දෙන්නෙමු. | S |
| **ණය කළමනාකරණය:** රාජ්‍ය ණය කාර්යාලයක් සහ එයට ඉහළ නිපුණත්වයෙන් යුතු, ඉහළ වැටුප් ලබන, වෙළඳපල චලනයන්ගෙන් ප්‍රතිලාභ ලබා ගෙන ගතිකව ශ්‍රී ලංකාවේ ණය කළමනාකරණය කළ හැකි වෘත්තීමය කාර්‍යමණ්ඩලයක් නිර්මාණය කිරීම.<br>**සටහන:** පාර්ලිමේන්තුව විසින් රාජ්‍ය ණය කළමනාකරණ පනත් කෙටුම්පත සම්මත කළ නමුත් තවමත් රාජ්‍ය ණය කාර්යාලය ස්ථාපිත කර නොමැත. වර්ෂ 2018 දී පාර්ලිමේන්තුව විසින් ක්‍රියාකාරී වගකීම් කළමනාකරණ පනත සම්මත කරන ලද අතර එය ජාතියේ නොගෙවූ ණය ශක්තිමත්ව කළමනාකරණය කිරීම සඳහා අවශ්‍ය නෛතික පදනම සපයයි. | M |

[2] සමගි ජන බලවේගය විසින් Ad-Hoc සමූහයේ අප්‍රේල් 2024 යෝජනාවට දැඩි ලෙස විරුද්ධ වූ අතර, දළ දේශීය නිෂ්පාදිතයේ (ඇමරිකානු ඩොලර් වලින්) ස්වාධීන ප්‍රක්ෂේපන මත පදනම්ව කප්පාදුව සිදු වන විට, දළ දේශීය නිෂ්පාදිතයට සම්බන්ධ බැඳුම්කර (මැක්‍රෝ ලින්ක්ඩ් බොන්ඩ්) ව්‍යුහය යටතේ නාමික 28% කප්පාදුව 2028 වන විට ඵලදායී ලෙස 7.3% ක් පමණක් වනු ඇතැයි අපි තර්ක කළෙමු. අපගේ විවේචන, චින්තන කණ්ඩායම් සහ අනෙකුත් විරුද්ධ පක්ෂ විසින්ද පසුව ප්‍රකාශ කරන ලද අතර, එම ගනුදෙනුව පිළිගත නොහැකි බවට එය පැහැදිලි පණිවිඩයක් විය. මෙම පීඩනය රජයට 2024 ජූලි මාසයේදී 14.96% ක වඩා ඵලදායී MLB කප්පාදුවක් සඳහා සාකච්ඡා කිරීමට උපකාරී විය. නව ISB ශ්‍රේණියේ කප්පාදුව සහ ශුද්ධ වර්තමාන වටිනාකම සම්බන්ධයෙන් OCC සහ වාණිජ ණය හිමියන් අතර සාධාරණ සැලකීම සහතික කිරීම සඳහා OCC ගිවිසුමේ ඇති 'claw back' වගන්තිය' පිළිබඳව සමගි ජන බලවේගය පැහැදිලි කිරීමක් ද ඉල්ලා ඇත. ගනුදෙනුව පරිපූර්ණ නොවූවත්, එය ආර්ථික ප්‍රකෘතිය සඳහා වැදගත් පියවරකි. රජයේ සාකච්ඡා ස්ථාවරය ශක්තිමත් කිරීම සහ ශ්‍රී ලංකාවට වඩා හොඳ ප්‍රතිඵලයක් ලබා දීම සඳහා අපගේ කාර්යභාරය පිළිබඳව අපි සතුටු වෙමු.

[3] අපගේ ස්ථාවරය මේ වන විටත් IMF වෙත දැනුම් දී ඇත.

## 2.2 විස්තීරණ ණය පහසුකමේ (EFF) කොන්දේසි පිළිබඳව නැවත සාකච්ඡා කිරීම සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග සම්බන්ධව කටයුතු කිරීම.

සමගි ජන බලවේග රජයක් විසින් එකඟ වූ සහ කාලානුරූපව සංශෝධනය වූ ණය තිරසර බව පිළිබඳ සමාලෝචනය (Debt Sustainability Analysis ) (DSA) තුළ රැඳී සිටින අතරම "සහන සමග ප්‍රතිසංස්කරණ" සහතික කිරීම සඳහා වත්මන් EFF ගිවිසුම සංශෝධනය කිරීමට අපේක්ෂා කරයි. ශ්‍රී ලංකාව දරුණු ආර්ථික අර්බුදයකට පත්වීම වැළැක්වීමට සහ ජාත්‍යන්තර මූල්‍ය වෙළෙඳපොළවල ස්ථාවරත්වය සහ විශ්වසනීයත්වය නැවත ඇති කිරීමට ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ වැඩසටහනක් අත්‍යවශ්‍ය බවට ප්‍රථමයෙන් (2020 වසරේ දී) තර්ක කරනු ලැබුයේ අපි වෙමු. මෙම EFF මගින් මූල්‍ය ඒකාග්‍රතාවය සහ වඩා හොඳ ආර්ථික පාලනයක් කෙරෙහි අවධානය යොමු කරන නමුත්, ස්වෛරී ණය අර්බුදයට ආර්ථිකය අවදානමට ලක් කළ ව්‍යුහාත්මක දෝෂ ප්‍රමාණවත් ලෙස ආමන්ත්‍රණය නොකරයි. විශේෂයෙන්ම 2009 සිට 2014 දක්වා, දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය ප්‍රධාන වශයෙන් මෙහෙයවනු ලැබුවේ පොදු යටිතල පහසුකම් ව්‍යාපෘති මගින් මෙහෙයවනු ලබන ඉදිකිරීම්, උපයෝගිතා සහ සේවා වැනි වෙළඳාම් කළ නොහැකි අංශ මගිනි. මෙම කාලපරිච්ඡේදය තුළ දළ දේශීය නිෂ්පාදිතයේ වැඩිවීමෙන් 70% කට වඩා වැඩි ප්‍රමාණයක් පැමිණියේ වෙළඳාම් කළ නොහැකි නිෂ්පාදනයෙන් වන අතර, 2020 වන විට දළ දේශීය නිෂ්පාදිතයේ වෙළඳාම් කළ හැකි කොටස 30% සිට 20% දක්වා අඩු විය.

ණය තිරසාරභාවය සමඟ මෙම අර්බුදයෙන් ගොඩ ඒම සඳහා සාර්ව ආර්ථික ස්ථාවරත්වය යථා තත්ත්වයට පත් කිරීම ඉතා වැදගත් වේ; නමුත් ආර්ථිකයේ වෙළඳාම් කළ නොහැකි නැඹුරුතාවය (Non tradable bias) ආමන්ත්‍රණය කිරීම ස්ථාවරත්වයෙන් ඔබ්බට තිරසාර වර්ධනයක් සඳහා ඉතා වැදගත් වේ. වර්ෂ 2027 වන විට ශ්‍රී ලංකාව ඩොලර් බිලියන 62 කට අධික විදේශ ණය ප්‍රමාණයක් ලබා ගනු ඇති බවට  ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ඇස්තමේන්තුගත කර ඇත. මෙම ණය කළමනාකරණය කිරීම සඳහා අපි ප්‍රාථමික මූල්‍ය ගිණුමේ සහ ජංගම ගිණුමේ ශේෂය යන දෙකෙහිම අතිරික්තයක් ජනනය කළ යුතුය. සමගි ජන බලවේගයේ සංවර්ධන උපායමාර්ගය අපනයනයට නැඹුරු ආර්ථිකයක් පෝෂණය කිරීම මගින් "ලෝකයට පාලමක් ගොඩනැගීමට" ප්‍රමුඛත්වය ලබා දෙයි. අපි මුදල්, විනිමය අනුපාතිකය, වෙළඳාම සහ තරඟකාරී ප්‍රතිසංස්කරණ හරහා වෙළඳ විරෝධී නැඹුරුව ආමන්ත්‍රණය කරමින් වෙළඳාම් කළ නොහැකි අංශයන්ට වඩා වෙළඳාම් කළ හැකි නිෂ්පාදනය (අපනයන නැඹුරු නිෂ්පාදනය සහ ජාත්‍යන්තරව තරඟකාරී ආනයන ආදේශන නිෂ්පාදනය යන දෙකම) දිරිමත් කරන්නෙමු. මේ පිළිබඳ වැඩි විස්තර 06 වන පරිච්ඡේදයේ (වර්ධනය දිරිගැන්වීම) දක්වා ඇත.ඒ අනුව, එකී දිරිගැන්වීමේ ව්‍යුහය (incentive structure) ආමන්ත්‍රණය කිරීම සඳහා වැඩසටහනේ පුළුල් ආකෘතිය තුළ IMF EFF ගිවිසුම සංශෝධනය කිරීමට අපි යෝජනා කරමු.  තිරසාර හා සමානාත්මතාවයෙන් යුත් වර්ධනයක් ඇති කළ හැකි බාහිරට නැඹුරු, ගතික ආර්ථිකයක් ගොඩනැගීමට මෙය උපකාර වනු ඇත.

ප්‍රමාණවත් රාජ්‍ය ආදායමක් ලැබීම සහතික කරමින් සහ වියදම් පාලනය කරන අතරම, මධ්‍යම පන්තියට සිදුවන අහිතකර බලපෑම් අවම කිරීම සඳහා බදු ව්‍යුහය සමාලෝචනය කිරීම සහ දුප්පතුන් ආරක්ෂා කිරීම සඳහා හොඳින් ඉලක්ක කරගත් සමාජ ආරක්ෂණ ජාලයක් පවත්වා ගැනීම ද වැදගත් වේ. මෙය 'සහන' සඳහා වන සංශෝධන විය යුතුය. වැඩිදුර තොරතුරු සඳහා 4 වන පරිච්ඡේදය (ආදායම් ඒකාබද්ධ කිරීම) සහ 10 වන පරිච්ඡේදය (ශක්තිමත් සමාජ ආරක්ෂණ ජාලය) බලන්න.

| මැදිහත්වීම | කාලරාමුව |
|---|---|
| EFF **සංශෝධන:** එකඟ වූ ආදායම් මත පදනම් වූ රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ඉලක්ක පවත්වා ගනිමින් සහ ව්‍යුහාත්මක මිණුම් සලකුණු සපුරාලන අතරම, පහත අරමුණු සපුරාලීම සඳහා EFF ගිවිසුම එකගවූ සහ කාලානුරූපව සංශෝධනය වූ DSA පරාමිතීන් තුල හිදිමින් සංශෝධනය කිරීමට ෂථහ සමඟ එකඟ වීම:<br>☎ ආර්ථිකයේ වෙළඳාම් කළ නොහැකි නැඹුරුතාව ඉවත් කර වෙළඳාම් කළ හැකි නිෂ්පාදනය සක්‍රිය කිරීම සඳහා දිරිගැන්වීමේ ව්‍යුහයන් සංශෝධනය කිරීම. මෙයට පරිපූර්ණ තක්සේරුවක් මත වෙළඳාම් කළ හැකි අංශය සඳහා සංස්ථාපිත ආදායම් බදු තන්ත්‍රය සංශෝධනය කිරීම ඇතුළත් වේ.<br>☎ විශේෂයෙන්ම මධ්‍යම පන්තිය සඳහා වැඩි යුක්තිය සහ සාධාරණත්වය සහතික කිරීම සඳහා පුද්ගලික ආදායම් බදු ස්ලැබ්ස් සහ අනුපාත සංශෝධනය.රඳවා ගැනිමේ බදු, (with holding tax), සුරා බදු, දළ සුදු ක්‍රීඩා ආදායම මත කැසිනෝ සහ එවැනි ව්‍යාපාර මත පනවා ඇති බදු සංශෝධනය කිරීම මගින් ආදායම් හිගය පියවා ගත යුතුය. 04 වන  පරිජේදයේ විස්තර කර ඇත (ආදායම් ඒකාබද්ධ කිරීම)<br>☎ වර්තමාන අස්වැසුම යෝජනා ක්‍රමය නුසුදුසු බැවින් අවදානම් සහගත කණ්ඩායම් ආරක්ෂා කිරීමට වඩා හොද මූල්‍ය ප්‍රදාන වැඩසටහනක් සදහා සමාජ ආරක්ෂණ ජාලය සහ ප්‍රතිලාභ ලබන්නන් තෝරා ගැනීමේ ක්‍රමවේදය සංශෝධනය කිරීම. | S |

[4] මෙම සංශෝධනයේ අවශ්‍යතාවය අප විසින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට පැහැදිලි කර තිබේ. විශේෂයෙන්ම, වෙළඳාම් කළ හැකි අංශය සඳහා දිරිගැන්වීමේ ව්‍යුහය නැවත සලකා බැලීම මෙයට ඇතුළත් වේ.

## 2.3 අක්‍රිය ණය (NPL) අර්බුදය සමග කටයුතු කරන අතරතුර ආර්ථික පද්ධතියේ ස්ථායීතාව පවත්වාගෙන යාම තහවුරු කිරීම.

IMF EFF වැඩසටහන යටතේ සිදු කරන ලද ප්‍රතිසංස්කරණ සමග ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතියේ ස්ථාවරත්වය වැඩිදියුණු වී ඇත. දේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීම, අපේක්ෂිත වත්කම් තත්ත්ව ගැටලු හේතුවෙන් බැංකු බැහැර කළ අතර රාජ්‍ය බැංකු නැවත ප්‍රාග්ධනීකරණය සඳහා අරමුදල් වෙන් කරන ලදී. නව මහ බැංකු පනත සහ වඩා හොඳ බැංකු රෙගුලාසි ද මූල්‍ය පද්ධතියේ පාලනය වැඩිදියුණු කර ඇත. කෙසේ වෙතත්, අක්‍රිය ණය (NPLs) **2019** හි **5.2%** සිට **2023** Q3 වන විට **13.6%** දක්වා ඉහළ යාමත් සමඟ දුර්වලතාද නිර්මාණය වී ඇත. ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට (MSMEs) සහන සැලසීම සඳහා රජය විසින් **2024** දෙසැම්බර් **15** වන දින දක්වා පරාටේ නීතිය අත්හිටුවන ලද අතර, බැංකු විසින් ඇපකර මත ලබාගත් දේපල වෙන්දේසි කිරීම ද වළක්වන ලදී. තවද කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ගෙන් **60%** ක් පමණ දැඩි අභියෝගවලට මුහුණ දී ඇත. කෙසේ වෙතත්, ඉහත කී අත්හිටුවීම අවසන් වූ පසු MSMEs සඳහා පැහැදිලි ක්‍රියාකාරී සැලැස්මක් නොමැත. තවදුරටත් එම අත්හිටුවීම සඳහා ණය අයකර ගැනීම සහ ව්‍යවසාය සහාය සමතුලිත කිරීම සඳහා නැවත ඇගයීමක් අවශ්‍ය වේ. තැන්පත්කරුවන් ආරක්ෂා කිරීම සඳහා පැහැදිලි සැලැස්මක් අත්‍යවශ්‍ය වන අතර, ණය හිමියන් සහ ණය ගැතියන් අතර සාධාරණ සාකච්ඡා අවස්ථා ලබා දීම ද ඉතා වැදගත් වේ. පරාටේ නීතිය මගින් වඩාත් බලපෑමට ලක්වන ක්ෂේත්‍ර අවබෝධ කර ගැනීම මගින් ආධාරක ක්‍රියාමාර්ග සකස් කිරීමට සහ ශක්තිමත් ආර්ථිකයක් නිර්මාණය කිරීමට උපකාරී වේ.

ශ්‍රී ලංකාව විසින් සංස්ථාපිත සහ ඒකපුද්ගල බුන්වත්භාවය සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා වඩාත් කාර්යක්ෂම සහ පුරෝකථනය කළ හැකි පද්ධතියක් ද නිර්මාණය කළ යුතුය. හොඳින් සැලසුම් කරන ලද බුන්වත්භාවය පිළිබඳ පද්ධතියක් මගින් සමාගම්වලට පසුබෑමකට අනුවර්තනය වීමට සහ යථා තත්ත්වයට පත් කිරීමට ඉඩ සලසන අතර ව්‍යාපාර ස්ථාවරත්වය සහ වර්ධනය පෝෂණය කරයි. කාර්යක්ෂම බුන්වත්භාවය පිළිබඳ පද්ධතියක් මගින් ව්‍යවසායකයින්ට තක්සේරු කළ අවදානම් ගැනීමට ඉඩ සලසන අතර ආර්ථික වර්ධනය සඳහා අත්‍යවශ්‍ය වන නවෝත්පාදන සහ අත්හදා බැලීම් දිරිමත් කරන ආරක්ෂිත ආවරණයක් ද නිර්මාණය කරයි.

| මැදිහත්වීම | කාලරාමුව |
|---|---|
| **ණය පුනර්ජීවන ඒකක:** කොවිඩ්-19 පශ්චාත් පුනර්ජීවන ඒකක ව්‍යාපාර පුනර්ජීවන ඒකක (BRUs) බවට පරිවර්තනය කිරීමට බලපත්‍රලාභී බැංකු සඳහා 2024 මාර්තු මස ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනිවාර්‍ය කිරීම වැනි, අක්‍රිය ණය ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා උපදෙස් ලබා දෙන ණය පුනර්ජීවන ඒකකයක් සියලුම බැංකුවල ඇතිකිරීම. | S |
| **බුන්වත් පාලනතන්ත්‍රය:**<br>☎ MSMEs සඳහා විශේෂයෙන් නිර්මාණය කර ඇති විධිමත් බුන්වත් නීතියක් ස්ථාපිත කිරීමට ප්‍රමුඛත්වය ලබා දීම.<br>☎ විශාල ව්‍යාපාර සඳහා මූල්‍ය දුෂ්කරතා ප්‍රතිව්‍යුහගත කිරීම හෝ විසඳීම සඳහා වඩාත් නම්‍යශීලී සහ කාර්යක්ෂම ක්‍රියාවලියක් සැකසීම සදහා 11 වන ඡේදයේ (Chapter 11 - Bankcrucy law in USA) දක්වා ඇති පරිදි[8] බුන්වත් නීතියක් හඳුන්වා දීම. | S<br>M |

[5] සත්‍ය තත්ත්වය ගැන කිසිවක් නොදනී: වත්කම් තත්ත්ව සමාලෝචනය පාර්ලිමේන්තුවේ රාජ්‍ය මූල්‍ය කාරක සභාව සමඟ පවා හුවමාරු කරගෙන නොමැත.

[6] ශ්‍රී ලංකා මහ බැංකුව

[7] https://sustainabledevelopment.un.org/content/documents/26277Report_The_Impact_of_COVID19_to_MSME_sector_in_Sri_Lanka.pdf#:~:text=URL%3A%20https%3A%2F%2Fsustainabledevelopment.un.org%2Fcontent%2Fdocuments%2F26277Report_The_Impact_of_COVID19_to_MSME_sector_in_Sri_Lanka.pdf%0AVisible%3A%200%25%20

[8] 11 වන පරිච්ඡේදයේ බුන්වත් නීතිය යනු සමාගම් ක්‍රියාකාරීව පවතින අතරතුර සමාගම්වලට මූල්‍ය ප්‍රතිසංවිධානය කිරීමට ඉඩ සලසන නීතිමය රාමුවකි. මෙම ක්‍රියාවලිය අධිකරණයේ අධීක්ෂණය, ණය ප්‍රතිව්‍යුහගත කිරීම සහ ආපසු ගෙවීමේ සැලැස්මක් නිර්මාණය කිරීම ඇතුළත් වේ. 11 වන පරිච්ඡේදයේ බංකොලොත්භාවය පිළිබඳ නිශ්චිත තොරතුරු එක්සත් ජනපදයට අනන්‍ය වේ, නමුත් බොහෝ රටවලට ඊට සමාන නීති ඇත.

# 03 මූල්‍ය සහ විනිමය අනුපාතික ප්‍රතිපත්තිය

මූල්‍ය ප්‍රතිපත්තිය මගින් විශ්වාසනීය උද්ධමන පාලනය ආර්ථික ස්ථායීකරණය සමග තුලනය කළ යුතුය. මෙම ප්‍රයත්නයන් මිල ස්ථායිතාව නැවත ඇති කිරීමට සහ විදේශ සංචිත නැවත ගොඩනැංවීමේ මූලපිරීම් මගින් අනුපූරක විය යුතු අතර, විනිමය අනුපාතිකයේ නම්‍යශීලීභාවය වැඩි කිරීම තුළින් විය හැකිය.

## 3.1 මහ බැංකුවේ සහ පොලී අනුපාතිකවල ස්වාධීනතාවය සහ විනිවිදභාවය ආරක්ෂා කිරීම

IMF වැඩසටහනේ ප්‍රධාන සංධිස්ථානයක් වූයේ 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු (CBSL) පනත බලාත්මක කිරීමයි. නව උද්ධමනය ඉලක්ක කරගත් ක්‍රියාවලියක් හරහා මිල ස්ථායිතාව සහතික කරමින් මෙම නීති CBSL හි ස්වාධීනත්වය සහ වගවීම ඉහළ නංවයි. මෙම පනතේ අවශ්‍යතාවයන් ලෙස අමාත්‍යවරයා සහ ආණ්ඩුකාරවරයා විසින් උද්ධමන ඉලක්ක සැකසීම සහ ප්‍රකාශයට පත් කිරීම සිදු කල යුතු අතර මහ බැංකුව විසින් ද්විවාර්ෂිකව උද්ධමන ප්‍රවණතා, මූලාශ්‍ර, ප්‍රක්ෂේපණ සහ අවදානම් පිළිබඳ වාර්තා නිකුත් කළ යුතුය. මෙම ස්වාධීන විධිවිධානය ආර්ථික ස්ථාවරත්වය සහ වර්ධනය සඳහා ඉතා වැදගත් වේ. මෙම නව නීතිය යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ ස්වාධීනත්වයට ගරු කිරීම ශ්‍රී ලංකාවේ තිරසාර සාර්ව ආර්ථික ස්ථාවරත්වය සඳහා ඉතා වැදගත් වේ.

2023 ජූනි මාසයේ සිට, CBSL විසින් වඩාත් පහසුකම් සහිත මුදල් ප්‍රතිපත්තියක් අනුගමනය කරන ලද අතර, 2024 ජූලි වන විට ප්‍රතිපත්ති පොලී අනුපාත පදනම් ලකුණු 700කින් අඩු කරයි. ණය පොලී අනුපාත දැන් 9.25% සහ තැන්පතු අනුපාත 8.25% කි. මෙය, රජයේ සුරැකුම්පත්වල අඩු අවදානම් වාරික සමග, වෙළඳපල ණය අනුපාත අඩු කර ඇත. කෙසේ වෙතත්, නිරීක්ෂණය කල හැකි ණය දීමේ අවදානම් හේතුවෙන් MSME සඳහා පොලී අනුපාත ඉහළ මට්ටමක පවතී.

පොලී අනුපාත ප්‍රතිපත්තිය පිළිබඳ ශ්‍රී ලංකා මහ බැංකුවේ ස්වාධිපත්‍යය අපි පිළිගන්නා අතරම, සම්බන්ධීකරණ කවුන්සිලයේ (Coordination Council) උපදේශන ක්‍රියාවලිය හරහා නව නීතියෙහි දක්වා ඇති පරිදි රජයේ සාමාන්‍ය ආර්ථික ප්‍රතිපත්ති රාමුවට ශ්‍රී ලංකා මහ බැංකුව සහාය වනු ඇතැයි අපි අපේක්ෂා කරමු.

| මැදිහත්වීම | කාලරාමුව |
|---|---|
| **මහ බැංකුවේ ස්වාධීනතාව:** සිය ආයතනික ස්වාධීනත්වය පාර්ලිමේන්තුවට වගවීම සමග ඒකාබද්ධ කරමින් අභිමතය පරිදි මුදල් මුද්‍රණය කිරීම නැවැත්වීමට මහ බැංකුවේ ස්වාධීනත්වය සහතික කිරීම. **සටහන:** මෙය සාක්ෂාත් කරගනු ලැබුවේ 2023 අංක 16 දරන මහ බැංකු පනත සම්මත කිරීමෙනි. මෙම පනත අවලංගු කිරීමට පවතින දේශපාලන බලපෑම්වලට අපි විරුද්ධ වෙමු. | M |
| **උද්ධමනය කළමනාකරණය කිරීම:** උද්ධමනය සමතුලිත කිරීමට සහ ආයෝජකයින් සහ සමාගම් සඳහා ණය පිරිවැය කළමනාකරණය කිරීමට ප්‍රතිපත්ති අනුපාත (policy rates) සකස් කිරීමට CBSL හට ඉඩ දීම. මෙය සංකීර්ණ කරුණක් වන අතර, tradable-biased economic model සහ ජාත්‍යන්තර තරඟකාරීත්වය සැලකිල්ලට ගෙන රජය සමග එකඟ විය යුතු කාලානුරූපී උද්ධමන ඉලක්ක ලබා දීම. අවශ්‍යතාවය සම්බන්ධයෙන් මහ බැංකුව ගෙන ඒම තීරණාත්මක බව අපි විශ්වාස කරමු. සාර්ථකත්වය සහතික කිරීම සඳහා දැඩි මූල්‍ය විනයක් තිබිය යුතුය. | S |
| **අනුපාත:** වෙළෙඳපොළ නිෂ්කාශන අනුපාත යටතේ වෙළෙඳපොළෙන් සතිපතා බිල්පත් සහ බැඳුම්කර අරමුදල් අවශ්‍යතා ලබා ගැනීම. සටහන: දැනට, සතිපතා අවශ්‍යතාවයෙන් වැඩි ප්‍රමාණයක් වෙළඳපොල විසින් සපුරාලනු ලබන අතර, CBSL තවමත් එහි කොටසකට අරමුදල් සපයයි. | S |

## 3.2 විනිමය අනුපාතික ප්‍රතිපත්තිය

විනිමය අනුපාත කළමනාකරණය සඳහා වූ උපාය මාර්ගයට transitional floating phase හරහා වෙළඳපල තීරණය කරන මට්ටම හඳුනා ගැනීම සහ අක්‍රමවත් අපගමනය නිවැරදි කිරීම සඳහා මහ බැංකු මැදිහත්වීම් හරහා එය ස්ථාවර කිරීම ඇතුළත් වේ. ජංගම ගිණුම් ගනුදෙනු සඳහා පනවා ඇති විදේශ විනිමය සීමාවන් ඉවත් කිරීම සහ අර්බුදය තුළ ප්‍රමාණාත්මක ආනයන සීමා ඉවත් කිරීම, ප්‍රමාණවත් සංචිත ගොඩ නැගීම සහ ප්‍රාග්ධන වෙළඳපොළට ප්‍රවේශය නැවත ලබා ගැනීම සමඟ මෙය සිදු කළ යුතුය. උද්ධමනය පාලනය කිරීමට (උද්ධමනය ඉලක්ක පවත්වා ගැනීමට) හෝ බාහිර ණය සේවා පිරිවැය අඩු කිරීමට නාමික විනිමය අනුපාතිකය කළමනාකරණය කිරීමට වෙළඳපොළ බලවේගවලට එරෙහිව මැදිහත් වීමේ පෙළඹවීම මහ බැංකුව මගහැරිය යුතුය. වෙළඳපල බලවේග විසින් නාමික විනිමය අනුපාතිකය තීරණය කිරීමට අවසර දීම වැදගත් වන අතර එමගින් සැබෑ විනිමය අනුපාතය (වෙළඳාම් හවුල්කරුවන් සමඟ අපගේ සාපේක්ෂ මිල වෙනස්කම් සඳහා සකස් කරන ලද නාමික විනිමය අනුපාතිකය) අපගේ ජාත්‍යන්තර තරඟකාරිත්වය පවත්වා ගැනීමේ එහි අපේක්ෂිත කාර්යභාරය ඉටු කරයි.

ප්‍රතිසංස්කරණ කාලය තුළ විදේශ විනිමය ගනුදෙනු සහ විදේශ සෘජු ආයෝජන සීමා කිරීම් ඉවත් කරන අතරම බොහෝ සමපේක්ෂන කෙටි කාලීන ප්‍රාග්ධන ගලා ඒම මත අපි පාලනයක් පවත්වා ගනිමු. කෙටි කාලීන ප්‍රාග්ධන ගලා ඒම ආර්ථික ප්‍රකෘතිය තුළ සාර්ව ආර්ථික කළමනාකරණයට අනවශ්‍ය පීඩනයක් එල්ල කළ හැකිය.

| මැදිහත්වීම | කාලරාමුව |
|---|---|
| **විනිමය සමතුලිතතාවය** (Exchange equilibrium)**:** ජාත්‍යන්තර තරඟකාරිත්වය පවත්වා ගැනීම සඳහා දේශීය උද්ධමනය සමඟ ගැලපීම, සංක්‍රාන්ති අවධීන් හරහා විනිමය අනුපාතිකයට එහි වෙළඳපල සමතුලිතතාවයට ළඟා වීමට ඉඩ ලබා දීම. **සටහන:** ආනයන සීමා කිරීම් පවතින නමුත් මහ බැංකුව යම් ස්ථාවරත්වයක් ලබා ඇත. දැනට විනිමය අනුපාතිකය ඉහළ යමින් පවතී. | S |

# 04 ආදායම් ඒකාබද්ධකරණය

ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආදායම අද වන විට ඉතිහාසගත වන පහළ මට්ටමක පවතී. රාජ්‍ය ආදායම දළ දේශීය නිෂ්පාදිතයෙන් ඉහළම සාමාන්‍ය අනුපාතය 1989 සහ 1991 අතර වාර්තා වූ අතර එය 23.3% කි. කෙසේ වෙතත්, 2004 වසරේ ආරම්භ වූ එහි පහත වැටීම 2014 වසර දක්වාම අඛණ්ඩව පැවති අතර 2014 වසරේ දී ආදායම 11.2% දක්වා පහත වැටී වර්ෂ 2018 නව දේශීය ආදායම් පනත සමගින් 2019 දී එය 12% දක්වා ඉහළ ගියේය. මෙම ප්‍රවණතාවය 2019 දී සිදුකළ දැවැන්ත බදු කප්පාදුවෙන් පසු ඉතිහාසගත පසුබෑමකට අතර 2021 දී එය දළ දේශීය නිෂ්පාදිතයෙන් 8.4% දක්වා පහත වැටුණි. ඊට සමකාලීනව, 2019-2022 සඳහා ශ්‍රී ලංකාව හා සමානව නැගී ආ මධ්‍යම ආදායම් ලබන රටවල සාමාන්‍ය රාජ්‍ය ආදායම දළ දේශීය නිෂ්පාදිතයෙන් 26% ක් විය. ඒ අනුව අපි වැරදි මාර්ගයක සිටින බව පැහැදිලිය. රාජ්‍ය ආදායම වැඩි විය යුතු අතර 2027-2029 වන විට IMF වර්තමාන ඉලක්කය වන 15.4% පිළිගත හැකිය. එවැනි ආදායමක් නොමැතිව රජයකට දුම්රිය හෝ මහා මාර්ග වැනි ආර්ථික සේවා, සෞඛ්‍ය හෝ අධ්‍යාපනය වැනි සමාජීය සේවා එවැනි අත්‍යවශ්‍ය යටිතල පහසුකම් සඳහා මුදල් යෙදවිය නොහැකිය.

කෙසේ වෙතත්, 2024 එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ (UNDP) අධ්‍යයනයකින් පෙනී යන්නේ බදුකරණය පිළිබඳ සාමාන්‍ය සංකල්ප ගැන නොදැන සිටියත්, ශ්‍රී ලාංකිකයන්ගෙන් බහුතරයක් වත්මන් බදු ක්‍රමය සම්බන්ධයෙන් කිසිසේත්ම සතුටු නොවන බවයි. එම අධ්‍යයනයෙන් පෙනී ගියේ බොහෝ පුද්ගලයින් බදු සඳහා ලියාපදිංචි වී නොමැති (TIN අංකයක් නොතිබූ) සහ එසේ කිරීමට උනන්දුවක් නොදක්වන බවයි (IRD වලට අනුව 2023 අවසානයේ බදු සඳහා ලියාපදිංචි වී ඇත්තේ පුද්ගලයන් 743,000 ක් පමණි; එය 2022 දී 246,000 සිට වැඩිවීමක් වන නමුත් තවමත් එය 2019 දී ලියාපදිංචි වූ 1,431,000 ට වඩා බෙහෙවින් අඩුය). බොහෝ දෙනා ගෙවා ඇත්තේ වක්‍ර බදු පමණි. එහෙත්, ඔවුහු තම බදු සඳහා ලැබුණු සේවාවන් ගැන සෑහීමකට පත් නොවෙති. වත්මන් බදු ක්‍රමය අසාධාරණ බව අතිමහත් බහුතරය විශ්වාස කරන අතර රජය විසින් බදු ආදායම වැඩි කිරීම වෙනුවට ණය ප්‍රශ්නයට මුහුණ දීම සඳහා වියදම් කපා හැරිය යුතු බව ප්‍රකාශ කරයි.

ශ්‍රී ලංකාවේ බදු ආදායම ප්‍රධාන වශයෙන් මූලාශ්‍ර තුනකින් පැමිණෙයි: ඒවා නම් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව (IRD), ශ්‍රී ලංකා රේගුව (SLC)" සහ ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව (EDSL) වේ. IRD විසින් ආදායම් සහ සංස්ථාපිත බදු කළමනාකරණය කරයි, SLC ආනයන බදු සහ තීරුබදු කළමනාකරණය කරයි, සහ EDSL මත්පැන්, දුම්කොළ සහ වෙනත් එවැනි සුරාබදු භාණ්ඩ සඳහා බලපත්‍ර සම්බන්ධයෙන් කටයුතු කරයි. කෙසේ වෙතත්, මෙම ආයතන සෑම විටම ඔවුන්ගේ ආදායම් ඉලක්ක සපුරා ගැනීමට අසමත් වේ. තාවකාලික ප්‍රතිපත්ති වෙනස්වීම්, පරිපාලන හැකියාව නොමැතිකම සහ අකාර්යක්ෂමතාව, සහ තාක්ෂණික බාධාවන් මේ සඳහා ඇති ප්‍රධාන ගැටළු වේ. IMF හි 2023 විනිශ්චය තක්සේරුව තුළ ද මෙම ආයතන තුනෙහිම දූෂණය පිළිබඳ කරුණු දක්වා ඇත.

IRD විසින් 2014 වසරේ සිට ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතිය (RAMIS) සමඟ මෙම තත්ත්වය වැඩිදියුණු කිරීමට උත්සාහ කර ඇති නමුත් එය ක්‍රියාත්මක කිරීම මන්දගාමී සහ ගැටළු සහගත විය. විශේෂයෙන්ම RAMIS ප්‍රධාන රාජ්‍ය දෙපාර්තමේන්තු වලට ඒකාබද්ධ කිරීමේදී එම තත්ත්වය ඇති විය. වර්ෂ 2023 දෙසැම්බර් 31 වන විට IRD සතුව රු. බිලියන 1000ක නොගෙවූ බදු, බදු ගෙවීම පැහැර හැරීම් සම්බන්ධ නීති කෘත්‍යයන් 350ක් පමණ පවතින අතර, IRD සහ බදු අභියාචනා කොමිසමේ අභියාචනා 5,000කට ආසන්න ප්‍රමාණයක් ද ඇත[10].

ඉහත කරුණු වලට අමතරව, ඇතැම් අංශ සහ තනි ව්‍යාපෘති සඳහා බොහෝ ව්‍යතිරේක ලබා දීම, බදු එකතු කිරීම තවදුරටත් සංකීර්ණ කර ඇත. වර්ෂ 2008 දී හඳුන්වා දුන් උපායමාර්ගික සංවර්ධන ව්‍යාපෘති පනත සහ වඩාත් මෑතක දී වරාය නගර කොමිෂන් සභා පනත (අඩු අභිමතය, නමුත් දිගුකාලීන බදු සහන) මගින් ව්‍යාපෘති සඳහා වසර 25ක් තරම් දීර්ඝ කාලයක් සඳහා බදු විරාම ලබා දීමට දේශපාලනඥයන් විසින් භුක්ති විඳින අභිමතය තවදුරටත් සැලකිය යුතු ලෙස ආදායම අඩුවීමට හේතු වෙයි. රජය විසින් ආදායම්

[9] UNDP සහ ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලය 2024

[10] ප්‍රධාන දූෂණ ප්‍රශ්නයක් වූ "සීනි බදු වංචාවේදී" සීනි ආනයනය සඳහා වූ විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද හදිසියේ 2020 ඔක්තෝම්බර් මාසයේදී රු.50/නට සිට සත 25/නට දක්වා අඩු කරන ලදී. විගණකාධිපතිවරයා වාර්තා කළේ මෙමගින් රු. බිලියන 16 ක ආදායමක් අහිමි වූ බවයි. මෙහි නිගමනය වූයේ මෙම අඩු කිරීම ප්‍රධාන වශයෙන් ආනයනකරුවන් කිහිප දෙනෙකුට වාසි සැලසූ බවත් එමගින් පාරිභෝගිකයන්ට සහනයක් හිමි නොවූ බවයි. (මෙම වෙනස පිළිබඳව පූර්ව දැනුමක් ඇති බව පෙනේ). මෑත කාලීන ගණනය කිරීමකින් හෙළි වූයෙa SCL විසින් නැවත 2023 නොවැම්බර් මාසයේදී රු. 50/නට 2023 දක්වා ගෙන එන තෙක් රු. බිලියන 80 ක බදු ආදායමක් අහිමි වූ බවයි. මෙය එවැනි බොහෝ අවස්ථා අතරින් එක් උදාහරණයක් පමණි.

[11] ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 9 වන පාර්ලිමේන්තුව - පස්වන වාරය, මාර්ග සහ විධික්‍රම කමිටුවේ දෙවන වාර්තාව: යොමුව 1712049750029698.pdf (parliament.කන).

අඩුවීම පිළිබඳ මෙම මූලික ගැටලුවලට විසඳුම් ලබා නොදී, සියලු බදු (පුද්ගලික, සංස්ථාපිත සහ වැට් බදු) සරලව වැඩි කර, නව බදු හඳුන්වා දී (පිරිවැටුම් බද්ද: එනම් සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද) සහ 2023 සඳහා බදුමය මූල්‍ය සීමාවන් අඩු කර ඇත[11].

ඍජු බදු සම්බන්ධයෙන් ගත් කළ, උපයන විට ගෙවීමේ බදුවලින් (PAYE) මිදීමට නොහැකි සේවයේ නියුතු මධ්‍යම පංතියට අධික බර පැටවීම වැළැක්වීම සඳහා පුළුල් බදු පදනමක් අවශ්‍ය වේ. වක්‍ර බදු සම්බන්ධයෙන් ගත් කල, වර්තමාන බදු ක්‍රමය මූලික පරිභෝජන සහ ආයෝජන අවශ්‍යතා පවා බැහැර නොකරයි. විස්තීර්ණ බදු ප්‍රතිසංස්කරණ සහ නව්‍ය මූල්‍ය හා තාක්ෂණික උපාය මාර්ග ක්‍රියාවට නැංවීමෙන් පමණක් අපට දිගුකාලීන මූල්‍ය ස්ථාවරත්වය සහ ආර්ථික වර්ධනයක් කරා ළඟා විය හැකිය. මෙමගින් සාධාරණ බදු ක්‍රමයක් සඳහා ඉඩ සැලසෙන අතර වඩාත් ශක්තිමත් ආර්ථිකයක් නිර්මාණය කරන අතරම තනි බදු ගෙවන්නන් මත ඇති අසාධාරණ පීඩනය ද එමගින් සමනය වේ.

### පුද්ගලික ආදායම් බදු එකතු කිරීමේ අභියෝග සහ විෂමතා: 2023 සහ 2024 දෙස සමීප නිරීක්ෂණයක්

2023 දී, ඉහළ උද්ධමනය මධ්‍යයේ PAYE හරහා පුද්ගලික ආදායම් බද්ද අධික ලෙස ඉහළ යාම බොහෝ වෘත්තිකයන්ට විශාල බරක් පටවන ලද අතර, එමගින් බුද්ධි ගලනය ද දරුණු තත්වයකට පත්විය. ආරම්භයේදී, PAYE ආදායම ශ්‍රී ලංකා මුදලින් රු. බිලියන 68 ක් ලෙස පුරෝකථනය කරන ලද නමුත් පසුව රු. බිලියන 100 දක්වා සංශෝධනය කරන ලදී. කෙසේ නමුත් IRD විසින් රු.බිලියන 144 රැස් කර ගන්නා ලදී. 2024 සඳහා ඇස්තමේන්තුව රු. බිලියන 160, නමුත් රැස් කිරීමේ අපේක්ෂාව රු. බිලියන 200 කි. මෙම විෂමතාවයෙන් පෙන්නුම් කරන්නේ මුල් ඇස්තමේන්තුව අඩු අනුපාතයක් හෝ පුළුල් බදු ස්ලැබ්ස් සමඟ සපුරාලිය හැකි නමුත් සේවකයින්ට PAYE බදු ගෙවීමෙන් මිදීමක් නොමැති බැවින් රජය විසින් එකී බදු එකතු කිරීම උපරිම කිරීමට තීරණය කළ බවයි. ඊට ප්‍රතිවිරුද්ධ වශයෙන්, IRD විසින් පුද්ගලික ආදායම් බදු (PIT) නොගෙවූ සංරචකයන්ගෙන් රු. බිලියන 115ක් අපේක්ෂා කළ නමුත් රැස් කර ගත්තේ රු. බිලියන 48ක් පමණි. 2024 සඳහා ඇස්තමේන්තුව රු. බිලියන 80 ක් වන නමුත් රැස්කිරීමේ අපේක්ෂාව වන්නේ රු. බිලියන 40 කි.මෙමගින් අවම ස්වෙච්ඡා අනුකූලතාවය විදහා දක්වයි. මෙම ප්‍රතිඵලවලින් ඇඟවෙන්නේ අඩු PIT අනුපාත සමඟ වුවද ආදායම් ඉලක්ක නිසැකවම සපුරාලිය හැකි නමුත් වැඩිදියුණු කළ යුතු අනුකූලතාවයකි.

අපි IMF EFF රාමුව තුළ අපගේ බදු ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ අවසාන වශයෙන් තීරණය කිරීමට පෙර විධිමත් සහ අවිධිමත් පෞද්ගලික අංශය සහ වෘත්තිකයන්ගේ අදහස්ද සමගින් පුළුල් බදු උපදේශන යාන්ත්‍රණයක් නිර්මාණය කරන්නෙමු. අපගේ ප්‍රධාන මැදිහත්වීම් වන්නේ:

| මැදිහත්වීම | කාලරාමුව |
|---|---|
| **පරිපාලන ප්‍රතිසංස්කරණ** | |
| **ඒකාබද්ධ ආදායම් අධිකාරිය:** IRD සහ පසුව රේගුව සහ සුරාබදු දෙපාර්තමේන්තු ඇතුළත් ආදායම් අධිකාරියක් පිහිටුවීම. සාමාන්‍ය කාලයකදී, එවැනි ආයතනයක් වෘත්තීයභාවය සහ ආදායම් එකතු කිරීමේ කාර්යක්ෂමතාව ඉහළ නංවනු ඇති අතර, කල්යත්ම එය ශ්‍රී ලංකා මහ බැංකුවට සමාන වැටුප් මට්ටම් සහිත වෙනම රාජ්‍ය සේවාවක් බවට පත්වනු ඇත. | M |
| **නවීකරණය සහ ඩිජිටල්කරණය:** මේ අතරතුර, දෙපාර්තමේන්තු තුන නවීකරණය කිරීම, ප්‍රතිලාභ සහ වගවීමේ යෝජනා ක්‍රම වැඩිදියුණු කිරීම සහ ශක්තිමත් කිරීම සහ පවතින තාක්ෂණ වේදිකාවන් (එනම්, IRD හි RAMIS සහ රේගුවේ ASYCUDA) සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක වන බව සහතික කිරීම, සහ සුරාබදු සඳහා තාක්ෂණික වේදිකාවක් හඳුන්වා දීම. | S |
| **ඉහළ ආදායම් ලබන්නන් ලියාපදිංචි කිරීම:** බදු ගෙවීමේ වැදගත්කම පැහැදිලි කිරීම සඳහා සියලුම වෘත්තීය ආයතන අතර දීපව්‍යාප්ත වැඩසටහනක් දියත් කිරීම, සහ TIN ලියාපදිංචි කිරීම සහ එය නිකුත් කිරීම සඳහා මනා සංවිධානයකින් යුතු මෙහෙයුමක් සිදු කිරීම. මෙහි සංරචක දෙකක් ඇත: පළමුව WHT බැඳීම් ඇති සියලුම පුද්ගලයින් සහ බදු නිදහස් සීමාවෙන් ඔබ්බෙහි සිටින රාජ්‍ය අංශයේ සේවකයින් සඳහා බදු ලිපිගොනු විවෘත කිරීම සහ දෙවනුව වෘත්තීය ආයතනවල සාමාජිකයින්ට IRD හි බදු ලිපිගොනු විවෘත කිරීමට අනිවාර්ය කිරීම. | S M |

| මැදිහත්වීම | කාලරාමුව |
|---|---|
| **ඔම්බුඩ්ස්මන්:** ව්‍යවස්ථා සම්පාදනයක් හරහා ඔම්බුඩ්ස්මන්වරයෙකු ස්ථාපිත කිරීම, නිදසුනක් ලෙස, බදු අභියාචනා සහ දීර්ඝ කාලයක් ගත වන නීති කෘත්‍ය සම්බන්ධයෙන් කටයුතු කිරීමට ස්වාධීන පාලක අධිකාරියකක් ස්ථාපනය කිරීම. මෙම කාර්යාලයට බදු අභියාචනා කොමිෂන් සභාව සහ IRD කෙරෙහි අධිකාරීමය බැදීමක් ඇති අතර මහජන විශ්වාසය හා පැහැදීම දිනා ගනිමින්, වැයපස අධික සහ දිගු කාලයක් අපතේ යන නීතිකෘත්‍ය සඳහා එය විකල්පයක් බවට පත්වනු ඇත. | S M |
| **රාජ්‍ය වත්කම් කළමනාකරණය:** රාජ්‍ය වත්කම් තක්සේරු කිරීමට සහ බදු නොවන ආදායම වැඩි කර ගැනීමට ඇති අවස්ථා හඳුනා ගැනීමට කාර්යසාධක බලකායක් සෑදීම. රජය සතු වත්කම්, ගාස්තු සහ රජයේ ආයතනවලින් ලැබෙන ප්‍රතිලාභ මත ආදායම වැඩි කරගැනීම. එයට සමගාමීව සේවාවේ ගුණාත්මකභාවය වැඩි දියුණු කර ඇති බවට සහතික කිරීම. නියෝජිතායතන විශේෂිත අරමුදල් පවතින විට ඒකාබද්ධ අරමුදල හරහා ගලා යෑම. | S |
| **බදු ප්‍රතිසංස්කරණ කෙටුම්පත්කරණය.** | |
| ඉහතින් සඳහන් කළ පරිදි ආදායම් ඒකාබද්ධ කිරීම සම්බන්ධයෙන් ෂඵෘ සමඟ ඇති ඍජු ගිවිසුම තුළ රැඳී සිටීමේ අවශ්‍යතාවය පිළිබද පූර්ණ අවබෝධයක් අප සතුය. මෙම රාමුව තුළ බදු ව්‍යුහය වඩාත් සාධාරණ කිරීමටත්, ආර්ථිකයේ ප්‍රතිවෙළෙඳ නැඹුරුව ඉවත් කිරීමටත් අපි යෝජනා කරමු. හැකි හොඳම ව්‍යුහය පිළිබඳ විනිවිදභාවයකින් යුතුව සම්මුතියකට එලබීම සඳහා ලේකම් කාර්යාලයක් ලෙස කටයුතු කිරීමට අදාළ සියලුම පාර්ශවකරුවන් ඇතුළත් කර විශේෂ ඒකකයක් අපි ස්ථාපිත කරන්නෙමු. | S |

- ☎ **මධ්‍යම පන්තික බදු කප්පාදුව:** අපගේ යෝජිත ‘මධ්‍යම පන්තියේ පුද්ගලික ආදායම් බදු සැකසීම’ යනු වත්මන් බදු නිදහස් සීමාව එලෙසම පවත්වා ගන්නා අතරතුර ආන්තික බදු අනුපාතිකය (marginal rates) 1% සිට 24% දක්වා සංශෝධනය කර එම 24% උපරිම සීමාවට අදාල වන මාසික ආදායම මිලියන භාගයක් බවට සංශෝධනය කිරීමයි. දැනට තිබෙන බදු ස්ලැබ්ස් බොහෝදුරට එලෙසම පවත්වාගෙන යාමටත් අපි අදහස්කරමු.[12]

  මෙහිදී අපගේ අරමුණ වන්නේ පසුගිය කාලය තුළ තම ජීවන තත්ත්වය පවත්වා ගැනීමේදී දැඩි දුෂ්කරතාවන්ට ලක් වූ මධ්‍යම මට්ටමේ විධායකයින්: කළමනාකරුවන්, වෘත්තිකයන් සහ විද්වතුන්ගෙන් වැඩි පිරිසකට නැවත වරක් සාමාන්‍ය තත්ත්වයකට පැමිණීමට හැකිවීම සහතික කිරීමයි.කෙසේ වෙතත් මෙහි ඇති අභියෝගය වනුයේ බදු ගෙවන්නන් අතර PAYE බද්දෙන් පිටත සහ ඉන් ඔබ්බට අනුකූලතාව සහතික කිරීම වන අතර එමඟින් PAYE බදු ගෙවන්නන් මත පමණක් ඇති අසාධාරණ බදුබර ඉවත් වේ.අපගේ විශ්වාසය වන්නේ දැරිය හැකි මිල ගණන්, ඩිජිටල්කරණයෙන් බදු ගෙවීමේ පහසුව සහ ශක්තිමත් සමාජ ගිවිසුමක් සමඟ පුරවැසි වගකීම වැඩි කිරීමත් සමඟ IMF සමඟ එකඟ වූ ඉලක්ක සපුරාලීමට අපට හැකි වනු ඇති බවයි.

- ☎ **සංස්ථාපිත ආදායම් බදු අනුපාතිකය:** අපගේ Blueprint සැලැස්ම පුරා ඇති තේමාව වන්නේ භාණ්ඩ හා සේවාවල වෙළඳාම් කළ හැකි අංශය විසින් මෙහෙයවනු ලබන ශක්තිමත්, තිරසාර සහ සාධාරණ වර්ධනයක් සහතික කිරීමයි. අපගේ සංශෝධන මගින් සමස්ත ඉලක්ක එලෙසම තබා ගනිමින් යතාර්ථවාදීව ආදායම් ඉලක්ක ලඟා කර ගැනීමට හැකි වනු ඇත. අපි CIT (සහ අනෙකුත් සමගාමී ගාස්තු) පිළිබඳ යෝජනාවක් ප්‍රකාශයට පත් කිරීමට පෙර පුළුල් විශ්ලේෂණයක් සිදුකිරීම වඩා යෝග්‍ය වේ. අපගේ අරමුණ ආර්ථිකයේ ප්‍රතිවෙළෙඳාම් නැඹුරුව ඉවත් කිරීම බව පැවසීම ප්‍රමාණවත්ය. අපනයනකරුවන් සඳහා සැලකිය යුතු පහත වැටීමක්, සමහර විට 6% දක්වා, සම්පූර්ණ CIT වෙත බාධාවකින් තොරව නිවේදනය කරනු ලැබිය යුතුය.

[12] අපි දැනට පවතින නවතම බදු දත්ත භාවිතා කර යම් යම් උපකල්පන කර ඇත. බලයට පත්වීමෙන් පසු අපට උපකල්පන තහවුරු කිරීමට සහ අරමුණු නිසි පරිදි තබා ගනිමින් අවශ්‍ය පරිදි වෙනස් කිරීම් කිරීමට හැකි වනු ඇත.

| මැදිහත්වීම | කාලරාමුව |
|---|---|
| ☎ **එකතු කළ අගය මත බදු** (VAT) **සංශෝධන:** යෝජිත බදු එකතු කිරීම සහ DPI හරහා තොරතුරු හුවමාරු කිරීම තුළින් අනුකූලතාව වැඩි දියුණු කිරීමට හැකි වූ වහාම 18% ලෙස පවතින තෝරාගත් ලැයිස්තුවක් හැර VAT අනුපාතය 15% දක්වා අඩු කිරීමට අපි සැලසුම් කරමු. IMF ගිවිසුමට අනුව ඉවත් කළ යුතු විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද (SCL) සඳහා දැනට වගකිව යුතු මෑතක දී සහ ආනයනය කරන ලද ආහාර සඳහා හඳුනාගත් අත්‍යවශ්‍ය ද්‍රව්‍ය සඳහා අපි ශුන්‍ය අනුපාතයක් හෝ අඩු වැට් බද්දක් යොදන්නෙමු. SCL වගකීම් ලැයිස්තුවට අමතරව, ළදරුවන් සඳහා ඉහළ ප්‍රෝටීන් ආහාර, වෛද්‍ය සහ අධ්‍යාපනික උපකරණ සහ සත්ව ආහාර සඳහා යෙදවුම් (අධි ප්‍රෝටීන් ආහාර නිෂ්පාදන පිරිවැය අඩු කිරීම සඳහා) වැනි අයිතම මෙම ලැයිස්තුවට ඇතුළත් විය යුතුය. | S |
| ☎ **සරල කරන ලද එකතු කළ අගය මත බද්ධ** (SVAT) **සඳහා සංශෝධන:** SVAT (අත්හිට වූ VAT බද්ද) සැබෑ අපනයනකරුවන් සඳහා පමණක් අදාළ වූ නමුත් පසුව තවත් කාණ්ඩ කිහිපයක් ඇතුළත් කරමින් සංශෝධිත SVAT (සරල VAT බද්ද) හඳුන්වා දෙන ලදී. 2025 ජනවාරි 1 වන විට SVAT ඉවත් කරන බව රජය නිවේදනය කර ඇත. මෙය ධනාත්මක පියවරක් බව අපි විශ්වාස නොකරමු. ඒ වෙනුවට, අපනයනකරුවන් සඳහා දේශීයව නිෂ්පාදිත භාණ්ඩ අපනයනකරුවන්ට සපයන නිෂ්පාදකයින් සඳහා මුල් SVAT (අත්හිටු වූ VAT බද්ද) වෙත ආපසු ගමන් කිරීම වඩා යෝග්‍ය විසඳුමක් බව අපි විශ්වාස කරමු. මේ සම්බන්ධයෙන් අවසාන තීරණයකට එළඹීමට පෙර එහි පවතින වාසි සහ අවාසි අපි පුළුල් ලෙස සාකච්ඡා කරමු. | S |
| ☎ **රැඳවුම් බද්දට** (WHT) **සංශෝධන:** මධ්‍යම පාන්තිකයින්ට සහන සැලසීම සඳහා ආදායමේ පාඩු සමතුලිත කරමින් පොලියක් මත WHT වත්මන් මට්ටමේ සිට වැඩි කළ යුතුය. වයස අවුරුදු 65 ට වැඩි අය විසින් තබා ඇති තැන්පතු සඳහා WHT-නිදහස් සීමාවක් ප්‍රකාශයට පත් කෙරේ. WHT යනු අතිරේක බද්දක් නොව බදු එකතු කිරීමේ යාන්ත්‍රණයක් පමණක් වන අතර න්‍යායාත්මකව මුදල් ප්‍රවාහ (Cash flow) බලපෑමක් පමණක් ඇති කරයි. ස්වේච්ඡාවෙන් බදු ගෙවිය යුතු නමුත් එය මග හරින අය බදු ජාලයට ගෙන ඒමට එය ඵලදායී ලෙස උපකාරී වනු ඇති අතර එමගින් අනුකූලතාව වැඩි දියුණු කරයි. මෙම යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා, IRD හි ආපසු ගෙවීමේ යාන්ත්‍රණය පරිපූර්ණව පැවතිය යුතුය. IRD වෙතින් ඔබ්බට මුදල් ආපසු ගෙවීමේ කිසියම් ප්‍රමාදයක් ඇති වුවහොත්, (උදාහරණයක් ලෙස දින 7ක්), බදු ගෙවන්නාට පොලියක් ගෙවීම සදහා බැදීමක් ඇතිකළ යුතුය. | S |
| ☎ **සුරාබදු බදු සංශෝධන:** සුරාබදු යනු වටිනාකම අනුව බද්දකට හෝ ප්‍රතිශත බද්දකට ප්‍රතිවිරුද්ධ ඒකක බද්දකි. මේ අනුව, තෝරාගත් මිල මට්ටමේ වැඩිවීම සමානව පිළිබිඹු වන පරිදි බදු මට්ටම කාලානුරූපව සකස් නොකළහොත්, ඒකකයකට බද්ද පහත වැටේ. වසර ගණනාවක් තිස්සේ මෙය සිදු විය. 2023 දී රජය විසින් 2024 වර්ෂය ආරම්භයේදී මත්පැන් සහ දුම්කොළ සඳහා නිෂ්පාදන බද්ද ස්වයංක්‍රීයව සුචිගත කිරීමට ෂඵ්ප සමඟ එක්ව කටයුතු කළ නමුත් එය ක්‍රියාත්මක නොවීය. වෙළෙඳපල පිළිබඳ පුළුල් අධ්‍යයනයක් මත මෙය ක්‍රියාත්මක කිරීමට අපි සැලසුම් කරමු. මත්පැන් බෝතලයේ ආරක්ෂිත (බදු) ස්ටිකරය ව්‍යාජ ලෙස සකස් කිරීම නිසා මත්පැන් සඳහා සුරාබදු අයකිරීමේ දී දැවැන්ත ජාවාරමක් ක්‍රියාත්මක වේ. නැතිවූ ආදායම් එකතු කර ගැනීමට ක්‍රියාමාර්ග ගැනීමෙන් ඔබ්බට ගොස් තවදුරටත් ව්‍යාජ ලෙස සකස් කළ නොහැකි මත්පැන් බෝතල්වල අත්සන් දෙකක බදු ස්ටිකරයක් (two-signature tax sticker) ක්‍රියාත්මක කිරීමට කිරීමට අපි යෝජනා කරමු.<br><br>☎ රටම විද්‍යුත් වාහන දෙසට ගමන් කිරීම සහ රාජ්‍යයට ලැබෙන ආදායම වැඩිදියුණු කිරීම සහතික කිරීම සඳහා මෝටර් (විද්‍යුත් වාහන ඇතුළුව) වාහන මත බද්ද සමාලෝචනය කළ යුතුය. එසේම වාහන ආනයනය සඳහා පනවා ඇති සීමාවන් ද ඉවත්කළයුතුය. | S |

| මැදිහත්වීම | කාලරාමුව |
|---|---|
| ☎ **කැසිනෝ සඳහා අදාළ බදු සංශෝධන:** දැනට කැසිනෝ සඳහා එහි දළ සුදු ක්‍රීඩා ආදායම (GGR) මත 15% ක් සහ ඔවුන්ගේ තක්සේරුව මත පදනම්ව ලාභය මත 40% ක් බදු අය කෙරේ. කැසිනෝ සඳහා බලපත්‍ර ගාස්තු සහ වෙනත් ගාස්තුද ඇති නමුත්, VAT හෝ SSCL ඊට අදාළ නොවේ. එසේම එකී ව්‍යාපාරයේ ස්වභාවය මුදලින් පවතින බැවින් නිසි විගණනයක්ද සිදු නොවේ. බොහෝ පාලන ප්‍රදේශවල මෙන් දළ සුදු ක්‍රීඩා ආදායම (GGR) මත පනවන සරල ඒකාබද්ධ බද්දක් තිබීම වඩා යෝග්‍ය බව අපි විශ්වාස කරමු. එබැවින් ප්‍රමුඛතාවයක් ලෙස සියලුම පාර්ශ්වකරුවන්ගේ ප්‍රයෝජනය සඳහා සහ නිවැරදි බදු ප්‍රමාණය එකතු කිරීම සහතික කිරීම සඳහා ක්‍රීඩා (කැසිනෝ) නියාමකයක් අපි ස්ථාපිත කරමු. | S |
| ☎ **ආරෝපිත කුලී ආදායම් බද්ද වෙනුවට සාධාරණ දේපල බද්දක් හඳුන්වා දීම:** යෝජිත ආරෝපිත කුලී ආදායම් බද්දට අපි විරුද්ධ වූයේ, එක් නිවසක් පමණක් ඇති සාමාන්‍ය නිවාස හිමියන්ට අසාධාරණ බද්දකට යටත් වීම අවාසිදායක වන බැවිනි. මේ අනුව, අප විසින් ආරෝපිත කුලී ආදායම් බද්ද පනවන්නේ නැත. ඒ වෙනුවට දේපල (නිවස නොවේ) මත අය කරනු ලබන දේපල බද්ද වඩා සාධාරණ වනු ඇත. හඳුනාගත් කොටස්වල දේපලවල වටිනාකම් තීරණය කිරීම සඳහා තාක්ෂණය (ඩ්‍රෝන සිතියම් ආදිය) භාවිතා කිරීම පිළිබඳව සියලු පාර්ශ්වකරුවන් සමඟ ගැඹුරු සාකච්ඡා පැවැත්වීමට අපි සැලසුම් කරමු. | M |
| ☎ **පැණි බීම වර්ග සඳහා වන බද්ද 2017 ප්‍රමාණයටම නැවත හඳුන්වා දීම:** මෙම බද්ද නිතර වෙනස් කර ඇත. ආදායමෙන් ඔබ්බට, මෙය අධික බර හා දියවැඩියාව වැනි බෝ නොවන රෝගවලට එරෙහි සටනට බලපානු ඇත. මේ සම්බන්ධයෙන් සුදුසු විසඳුමකට එළඹීම සඳහා ලෝක සෞඛ්‍ය සංවිධානයේ නිර්දේශිත බදු අනුපාත පිළිබඳ මහජන උපදේශනයක් පැවැත්වීමට අපි සැලසුම් කරමු. | S |
| ☎ **ගෝලීය හොඳම භාවිතයන් අනුගමනය කිරීම:** බදු පදනම ඛාදනය වීම සහ ලාභ විතැන් වීම (BEPS) ඩිජිටල් ආර්ථික රාමුවලට පාර්ශවකරුවෙකු වීම. බහුජාතික ව්‍යාපාර සඳහා 15% ගෝලීය අවම විකල්ප බද්ද හඳුන්වා දීම (OECD BEPS 2 කුළුණ ). | M |
| ☎ **සේවා මත බදු අය කිරීමේ පදනම විය යුත්තේ පරිභෝජනයයි:** දේශීයව නිෂ්පාදනය කරන සහ පරිභෝජනය කරන සේවාවන් වැට් බද්දට යටත් වන අතර විදේශයන්හි නිෂ්පාදනය කරන නමුත් දේශීයව පරිභෝජනය කරන එම සේවාවම වැට් බද්දට යටත් නොවේ. මේ සඳහා ප්‍රශස්ත උදාහරණයක් වන්නේ PickMe vs Uber ය. ඒ අනුව මෙම දෙපාර්ශවයම එකම බදු ප්‍රතිපත්තියකට ගෙන ඒම සඳහා අපි නීති සංශෝධනය කරන්නෙමු. | M |
| **ආනයන බදු** (import duty):<br>☎ ෆමේ වනවිට 0%, 10%, සහ 15% අනුපාත සහිතව පවතින තීරු තුනේ රේගු ආනයන බදු පද්ධතිය පිළිවෙළින් 0%, 15% සහ 20% දක්වා සංශෝධනය කිරීම.<br>☎ ෆවසර 3-5 අතර කාලයකින් ක්‍රමානුකූලව ඉවත් කිරීමට ඉලක්ක කර ගනිමින් ආරක්ෂණවාදී ක්‍රියාමාර්ග (para-tariffs) ඉවත් කිරීම (පළමු PAL සහ පසුව සෙස් බදු අඩු කිරීම) අඛණ්ඩව සිදුකිරීම. දේශීය නිෂ්පාදකයින් කෙරෙහි පවතින ඍණාත්මක බලපෑම සුරක්ෂිත කිරීම කිරීම සඳහා සුදුසු වෙළඳ ගැලපුම් පැකේජයක් හඳුන්වා දීම. | M L |

**07 වන පරිච්ඡේදයේ (රාජ්‍ය අංශය කළමනාකරණය සහ ඩිජිටල්කරණය) සවිස්තරාත්මකව විස්තර කර ඇති පරිදි ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති පොදු ඩිජිටල් යටිතල පහසුකම් වේදිකාවේ (Digital Public Infrastructure platform "DPI") පසුබිම තුළ ආදායම් එකතු කිරීමේ නියෝජිතායතනවල සියලුම වැඩිදියුණු කිරීම් ආමන්ත්‍රණය කිරීමට නියමිතය. ආදායම් බලධාරීන් සහ පුරවැසියන් අතර සියලුම ගනුදෙනු DPI මත සිදු කිරීමට අපි බලාපොරොත්තු වෙමු. ඉන් ඔබ්බට යමින්, අප විසින් මුදල් ගනුදෙනුවලින් ඉවත් වී ඩිජිටල් ගෙවීම් සඳහා යොමු විමට ප්‍රමුඛතම පාර්ශවකරුවන් කණ්ඩායම වෙත පීඩනයක් එල්ල කරනු ලැබේ.**

**ලාභාංශ හරහා තිරසාර ආදායමක් උපයා ගැනීම සඳහා රාජය සතු ව්‍යවසායවල (SOE) කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම ද අත්‍යවශ්‍ය වේ. SOE ප්‍රතිසංස්කරණ තවදුරටත් 5 වන පරිච්ඡේදයේ (වියදම් පාලනය) හි සඳහන් වේ.**

# 05 වියදම් පාලනය

නාස්තිකාර රාජ්‍ය වියදම්, නාස්තිය සහ දූෂණය පිළිබඳ පුළුල් සැලකිල්ලක් තිබියදීත් IMF EFF වැඩසටහන වියදම් කප්පාදුවට වඩා ආදායම වැඩි කිරීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කරයි. ප්‍රතිසංස්කරණ, විශේෂයෙන්ම බදු වෙනස් කිරීම් පිළිබඳ මහජන අතෘප්තිය, පැනනැගුනේ වියදම් සම්බන්ධයෙන් ආමන්ත්‍රණය කිරීමට රජය අසමත් වූ බැවිනි. එබැවින්, රාජ්‍ය මූල්‍ය ඒකාබද්ධකරණයට වියදම් කපා හැරීම් සහ රාජ්‍ය ව්‍යවසායන්හි ප්‍රතිසංස්කරණ ද ඇතුළත් විය යුතුය. මෙම පියවර මගින් සමාජ ආරක්ෂණ ජාලය ශක්තිමත් කිරීමට සහ අධ්‍යාපනය සහ සෞඛ්‍ය වැනි වැදගත් සේවාවන් සඳහා වියදම් ඉහළ නැංවීම සඳහා මූල්‍ය අවකාශය නිර්මාණය කළ හැකිය. එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ (ඹභාඡ) අධ්‍යයනයට (2024) අනුව, ප්‍රතිචාර දැක්වූවන්ගෙන් 30% ක් පමණ ණය ප්‍රශ්නය සමඟ කටයුතු කිරීම සඳහා බදු වැඩි කිරීමට කැමැත්ත පළ කළ අතර, 90% ක් රජය වියදම් අඩු කළ යුතු බව ද 80% ක් රාජ්‍ය අංශයේ රැකියා අඩු කළ යුතු යැයි ද විශ්වාස කළහ.

## 5.1 රාජ්‍ය වියදම් තාර්කීකරණය (RATIONALISE PUBLIC EXPENDITURE)

රාජ්‍ය වියදම් කළමනාකරණයේ පවතින නොනවතින ගැටලු, ආදායම් ඉහළ නැංවීමට අපොහොසත් වීම, අයවැය හිඟය, ණය වැඩිවීම සහ යටිතල පහසුකම් සහ සමාජ ආරක්ෂණය සඳහා සීමිත අරමුදල්වලට හේතු වී ඇත. සම්පත් වෙන් කිරීමේදී කාර්යක්ෂමතාව, විනිවිදභාවය සහ වගවීම කෙරෙහි අවධානය යොමු කරමින්, තාර්කික රාජ්‍ය වියදම් සඳහා සමගි ජන බලවේගය කැපවී සිටී.
මීට අමතරව, අපි පහළ මට්ටමේ කාර්ය මණ්ඩලය සඳහා විධිමත් ක්‍රියාවලිද සමඟ රාජ්‍ය අංශයේ රැකියා පිළිබඳ කළමනාකරණ විගණනයක් පවත්වනු ලබන අතර විගණනය අවසන් වන තෙක් නව බඳවා ගැනීම් නවත්වන්නෙමු.

2003 පැරණි රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනත (FMRA) වෙනුවට 2024 නව රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත (PFM) මගින් වියදම්වල විනිවිදභාවය සහ වගවීම සඳහා ප්‍රමුඛත්වය දෙයි. මෙය මූල්‍ය වගකීම සඳහා පදනම ශක්තිමත් කරයි. රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනත (FMRA) මගින් 2006 වන විට අයවැය හිඟය දළ දේශීය නිෂ්පාදිතයෙන් 5% ට වඩා අඩුවෙන් තබා ගැනීමටත්, ණය 60% ට අඩුවෙන් තබා ගැනීමටත් ඉලක්ක කර ගනිමින් මූල්‍ය හිඟයන් සහ රාජ්‍ය ණය මත සීමාවන් පනවන ලදී. නමුත් මේවා අඛණ්ඩව එකී සීමා ඉක්මවා ගියේය. හුදෙක් ව්‍යවස්ථාමය රාමුවෙන් ඔබ්බට ගොස් අනුකූලතාව සහ වගවීම සහතික කිරීම සඳහා ඉලක්ක කඩකිරීම සඳහා පැහැදිලි දණ්ඩන සහ දැඩි බලාත්මක කිරීමේ යාන්ත්‍රණයන් අත්‍යවශ්‍ය වේ. අපි වගවීම සහතික කිරීම සඳහා අවශ්‍ය සංශෝධන සමඟ ජාච් නීතියේ අරමුණු අනුගමනය කරන්නෙමු. ආදායමට සම්බන්ධයක් නැති අත්තනෝමතික ප්‍රාථමික වියදම් සීමාව, ආදායම් සහ එකඟ වූ මධ්‍ය කාලීන ප්‍රාථමික ශේෂ ඉලක්ක මත පදනම් වූ වඩාත් තාර්කික කොන්දේසියකින් ප්‍රතිස්ථාපනය කළ යුතුය. සෑම රජය සතු රුපියලක්ම උපක්‍රමශීලීව ජනතාවට උපරිම වටිනාකමක් ලබා දීම සඳහා භාවිත කිරීම අපගේ අරමුණයි.

| මැදිහත්වීම | කාලරාමුව |
|---|---|
| **දත්ත මත පදනම් වූ සැලසුම් කිරීම:** PFM රාමුව තුළ, හොඳ දත්ත සහ අනාගත සලකා බැලීම් මත පදනම්ව වියදම් තීරණ සදහා මඟ පෙන්වීමට විශ්වාසදායක අනාවැකි සහ අවදානම් විශ්ලේෂණයන් භාවිතා කරමින් ශක්තිමත් මධ්‍ය කාලීන වියදම් රාමුවක් (MTEF) ක්‍රියාත්මක කිරීම. මෙම විශ්ලේෂනය මගින් මහාමාර්ග සහ අධිවේගීමාර්ග වැනි දිගුකාලීන ව්‍යාපෘති සඳහා පොදු අයවැයෙන් ප්‍රාග්ධන වියදම් ප්‍රතිප්‍රමුඛත්වය ලබා දෙන අතර ජාතික භෞතික සැලැස්මෙන් පිටත සියලුම ව්‍යාපෘති ඉවත් කරනු ඇත. | S M |
| **මහජන විශ්වාසය ගොඩනැගීම සඳහා වියදම්වල විනිවිදභාවය සහ වගවීම:** සමාජ සම්මුතියේ බිඳවැටීම සහ නාස්තිය සහ දූෂණය පිළිබඳ චෝදනා සැලකිල්ලට ගෙන, වියදම් පිළිබඳ මහජන විශ්වාසය නැවත ගොඩනඟා ගැනීම ඉතා වැදගත් වේ. මෙය එඖෑජ සමඟ ඒකාබද්ධව වියදම් දිශාව සහ මට්ටම් පිළිබඳව රජය සහ ජනතාව අතර හවුල්කාරිත්වයක් ඇති කළ හැකිය. මේ සඳහා මැදිහත් වීම පහත පරිදි වේ: | S M |

| මැදිහත්වීම | කාලරාමුව |
|---|---|
| ☎ ව්‍යාපෘති අනුමැතිය සඳහා වන නිර්ණායක ඇතුළුව සියලුම රජයේ වියදම් සඳහා විනිවිදභාවයෙන් යුතු මාර්ගෝපදේශ ප්‍රකාශයට පත් කිරීම.<br>☎ සැලකිය යුතු වියදම් පිළිබඳ උපදේශන හරහා මහජනතාව ඇතුළු අදාළ පාර්ශවකරුවන් සම්බන්ධ කර ගැනීම.<br>☎ සියලු වියදම් තීරණ සහ අදාළ ලේඛන තත්කාලීනව ප්‍රකාශයට පත් කිරීම සඳහා මාර්ගගත ද්වාරයක් ස්ථාපනය කිරීම සහ මහජන ප්‍රවේශය, විමර්ශනය සහ අඛණ්ඩ විනිවිදභාවය සඳහා ඉඩ ලබා දීම.<br>☎ වගවීම සහතික කිරීම සහ වැඩිදියුණු කළ යුතු ක්ෂේත්‍ර හඳුනා ගැනීම සඳහා ප්‍රසිද්ධ කර ඇති සොයාගැනීම් සමඟ නිතිපතා ස්වාධීන විගණන පැවැත්වීම.<br>☎ කාර්යක්ෂමතාව ප්‍රවර්ධනය කිරීම සහ ප්‍රමාදයන් අවම කිරීම සඳහා වියදම් තීරණ ගැනීමේ ක්‍රියාවලියේ එක් එක් අදියර සඳහා දැඩි කාලසීමාවන් සැකසීම සහ ඒවා පිළිපැදීම. | |
| **ණය කළමනාකරණය:** 2024 දී දළ දේශීය නිෂ්පාදිතයෙන් 8.1% සිට 2029 වන විට 6.2% දක්වා පහත වැටීම, ණය ප්‍රතිව්‍යුහගත කිරීමෙන් පසුව පවා පුනරාවර්තන වියදම්වල විශාලතම සංරචකය පොලිය වන බැවින්, ණය කළමනාකරණය ඉතා වැදගත් වේ. මේ පිළිබඳව 2 වන පරිච්ඡේදයේ (ස්වෛරී ණය අර්බුදය කළමනාකරණය කිරීම) සාකච්ඡා ඇත. | S M L |
| **වියදම් අඩු කිරීමට මුලපිරීම්.** අප විසින් අවශ්‍ය බව සහතික කිරීම සඳහා  අයවැයේ සෑම රේඛීය අයිතමයක්ම සලකා බලමු. ඉවත් කළ හැකි දේ ඉවත් කර අනෙක් දේ සංශෝධනය කළ යුතුය. | S M |
| ☎ **අමාත්‍ය මණ්ඩලය තාර්කිකරණය කිරීම:** පසුගිය කාලයේ කැබිනට් මණ්ඩලයේ නොගැලපීම් සහ බණ්ඩනය ඉවත් කර නව අමාත්‍ය මණ්ඩලය සඳහා දූරදර්ශී ව්‍යුහයකට අපි පැමිණෙමු. වියදම් තාර්කිකකරණය සහ කාර්යක්ෂමතාව මත පදනම්ව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නියමයන් තුළ හිදිමින් සාධාරණ අමාත්‍යවරුන් සහ අමාත්‍යාංශ සංඛ්‍යාවක් වෙත අප ළඟා වන්නෙමු. | |
| ☎ **මූල්‍ය ප්‍රදාන:** ඉලක්කගත පවුල් වෙත මූල්‍ය ප්‍රදානය කිරීමේ යාන්ත්‍රණය වඩාත් විෂය බද්ධ සහ විනිවිද පෙනෙන ආකාරයෙන් වැඩිදියුණු කිරීම. වත්මන් අස්වැසුම වැඩසටහන නිසියාකාරව අවදානමට ලක්විය හැකි සහ අවශ්‍යතා ඇති අය ඉලක්ක කර නොගැනීම නිසා විශාල මුදල් කාන්දුවක් සිදුවේ. අපි දැනට පවතින ජන සංගණනයේ නවතම දත්ත භාවිතයෙන් ඉලක්කගත කිරීම වැඩිදියුණු කර DPI වේදිකාව භාවිතයෙන් කාර්යක්ෂමතාව සහ පරිපාලනයේ පහසුව වැඩි දියුණු කරන්නෙමු. මෙය පෙර පැවති ජන සවිය වැනි වඩාත් ඵලදායී දරිද්‍රතාවය පිටුදැකීමේ වැඩසටහනක් සමඟින් 10 වැනි පරිච්ඡේදයේ (ශක්තිමත් සමාජ ආරක්ෂණ ජාලය) සවිස්තරාත්මකව විස්තර කර ඇත. | S M |
| ☎ **පොදු යටිතල පහසුකම්:** පුද්ගලික ප්‍රවාහනයේ සිට පොදු ප්‍රවාහනය දක්වා ගමන් කිරීමට සහය වීම සඳහා ආර්ථික යටිතල පහසුකම් වියදම් නැවත වෙන් කිරීම. පුද්ගලික ප්‍රවාහනය සඳහා වන අධික වියදම්වලට සාපේක්ෂව රේල් සහ මෙට්‍රෝ ප්‍රවාහනය වැනි පොදු ප්‍රවාහනය සඳහා වන වියදම් වර්තමානයේ සමාජයට සැලකිය යුතු ප්‍රතිලාභ අත්කර දෙන බව යෝජනා කිරීමට ඕනෑ තරම් සාක්ෂි තිබේ. මහනුවර අධිවේගී මාර්ගය නිම කළ යුතු නමුත් ඉන් ඔබ්බට පුළුල් කිරීම ප්‍රමුඛතාවය මත පුළුල් තක්සේරුවක් මත පදනම් විය යුතුය. අබලන් ග්‍රාමීය මාර්ග පද්ධතිය වැඩිදියුණු කිරීම ග්‍රාමීය/කෘෂි ආර්ථිකය පුනර්ජීවනය කිරීමේ අත්‍යවශ්‍ය අංගයක් ලෙස ප්‍රතිපත්තිමය ප්‍රමුඛතාවයක් විය යුතුය. පොදු ප්‍රවාහනයට අමතරව වාරිමාර්ග, ජල සම්පාදන හා නිවාස සඳහා ප්‍රමුඛත්වය දෙනු ඇත. | S M L |
| ☎ **හමුදා වියදම්:** ශ්‍රී ලංකාව සතුව පුද්ගලයන් 100 කට ලෝකයේ 10 වැනි විශාලතම ක්‍රියාකාරී හමුදා සාමාජිකයන් පිරිසක් සිටී. අප විසින් අනාගත ආරක්ෂණ අවශ්‍යතා පිළිබඳ මනා සැලසුම් මත පදනම්ව හමුදාව තුළ ස්වභාවික ඉවත්වීමකට (natural attrition) ඉඩ සලසන්නෙමු, සහ ප්‍රවීණයන්ගේ, විශේෂයෙන් ආබාධිත ප්‍රවීණයන්ගේ උසස් තත්ත්වයේ ජීවිතයක් පවත්වා ගැනීම සඳහා ප්‍රමාණවත් අරමුදල් වෙන් කර ඇති බව සහතික කිරීම. ගුරුවරුන්ගෙන් පටන් ගෙන රාජ්‍ය අංශයේ වැටුප් වැඩි කිරීම සඳහා නැවත වෙන් කළ හැකි ඉතුරුම් පිළිබඳව අපි සලකා බලමු. | M L |

[13] Fiscal Space for Social Protection. UNICEF Sri Lanka and Verite Research, 2023 .

| මැදිහත්වීම | කාලරාමුව |
|---|---|
| ☎ **වාහන:** වාහන වියදම් පහසුවෙන් ලගා විය හැකි ඉලක්කයක් වේ. වාහන සඳහා වන නාස්තිකාර වියදම් නතර කරනු ඇත. නිශ්චිත ප්‍රමාණය නොදන්නා බැවින් රාජ්‍ය සේවය පිළිබඳ නිසි අවශ්‍යතා තක්සේරුවක් සහ පවතින වාහන ඇණිය පිළිබඳ විගණනයක් සිදු කරනු ලැබේ.වාහන භාවිතයේදී ජනාධිපතිවරයාගේ සිට පහළට දැඩි මාර්ගෝපදේශ ක්‍රියාත්මක කළ යුතුය. | S M |
| ☎ **දේශපාලනඥයින් නඩත්තු කිරීම:** තේරී පත් වූ නිලධාරීන්ට සහ සමහර අවස්ථාවල හිටපු තේරී පත් වූ නිලධාරීන්ට බදු මුදල් නාස්ති නොකළ යුතු බවට දැවැන්ත විරෝධයක්පවතී. අපි දේශපාලඥයින් සඳහා වන වියදම් පිළිබඳ සවිස්තරාත්මක විගණනයක් සිදු කරනු ලබන අතර, එක් එක් පුද්ගලයා කෙරෙහි තක්සේරු කරන ලද ආරක්ෂණ අවදානම් මත පදනම්ව තාර්කිකව කටයුතු කරන්නෙමු. | S |
| **නව වියදම් අයිතම: අපි නව වියදම් අයිතම කිහිපයක් හඳුන්වා දීමට සැලසුම් කරමු. සැලකිය යුතු නව රේඛීය අයිතම වන්නේ:**<br><br>**රාජ්‍ය සේවකයින් සඳහා ජීවන වියදම් දීමනාව වැඩි කිරීම:** අපගේ රජය සුදුසුකම් සපුරා ඇති සියලු□ම රාජ්‍ය අංශයේ සේවකයින් සඳහා මාසික ජීවන වියදම් දීමනාව වර්තමානයේ රුපියල් 17,800 සිට මසකට 25,000 දක්වා වැඩි කරන්නෙමු. මෙය රාජ්‍ය සේවයේ වැටුප් විෂමතා පිළිබඳ අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද විශේෂඥ කමිටු වාර්තාවට මත පදනම් වේ. **සටහන:** මැතිවරණය පැවැත්වෙන දිනය ප්‍රකාශයට පත් කිරීමෙන් පසු රජය මෙම නිශ්චිත සංඛ්‍යාව ප්‍රකාශයට පත් කළේය. | S |
| **රාජ්‍ය සේවකයින් සඳහා මූලික වැටුප වැඩි කිරීම:** රාජ්‍ය සේවය සඳහා අවම මූලික මාසික වැටුප අවම වශයෙන් 24% කින් වැඩි කරනු ඇත. (ශ්‍රේණි සඳහා දැනට පවතින අනුපාත මත පදනම්ව). මෙම සැකසීමට දැනට භුක්ති විඳින විවිධ සැකසීම් සහ දීමනාවල ඕනෑම නියමයන් සහ කොන්දේසි ඇතුළත් විය යුතුය. මෙහිදී නැවතත්, මූල්‍ය දත්ත අධ්‍යයනය කිරීම මත අවසාන මුදල තීරණය කරනු ලැබේ. | S |
| ☎ ඉහත සැකසීම් දෙක මගින් රාජ්‍ය සේවයේ අවම දළ වැටුප ජීවන වියදම් දීමනාව ඇතුළුව රු. 57,500 ක් වේ. **සටහන:** මෙම සංඛ්‍යා (වැටුප් වර්ධක සහ කඩබ වැඩිවීම) දැඩිවම පදනම් වී ඇත්තේ රාජ්‍ය අංශය පුරා වැටුප් සංශෝධනය සිදුකිරීම පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා කලින් සඳහන් කරන ලද කැබිනට් විශේෂඥ කමිටුවේ අතුරු වාර්තාවයි. | |
| ☎ **"සක්වල" සුහුරු** (smart) **පන්තිකාමර:** ස්මාර්ට් ශ්‍රී ලංකාවක් ගොඩනැගීම සඳහා ප්‍රමුඛත්වය ලබාදී, පාසල්වල ඩිජිටල් ඉගෙනුම් වේදිකාවලට සිසුන්ගේ ප්‍රවේශය සහතික කිරීම සඳහා ප්‍රමුඛත්වය දෙනු ලැබේ. සියලුම පාසල් හරහා ඩිජිටල් තාක්ෂණය භාවිතයෙන් අන්තර්ගතය බෙදා හැරීමේ සම්පූර්ණ ප්‍රතිසංස්කරණයක් මෙයට ඇතුළත් වේ. මෙම වැඩසටහන තාක්ෂණික හා වෘත්තීය ආයතන සහ විශ්ව විද්‍යාල දක්වා ව්‍යාප්ත කළ යුතුය. අයවැය ප්‍රතිපාදන වලට අමතරව, විදේශයන්හි පාසල් සමඟ එඅසබඛසබට වැඩසටහන් සඳහා නව්‍ය මූල්‍ය ව්‍යුහයක් ද හඳුන්වා දෙනු ලැබේ. | S M L |
| ☎ **රෝහල් සඳහා "හුස්ම" සහාය:** ජීවිතාරක්ෂක වෛද්‍ය උපකරණ සඳහා රට පුරා රෝහල්වලට සහාය දැක්වීමේ අපගේ වැඩසටහන අවශ්‍යතා පිළිබඳ සම්පූර්ණ තක්සේරුවක් මත පදනම්ව සෞඛ්‍ය අයවැයට ඇතුළත් කළ යුතුය. | S M L |
| ☎ **මාතෘ නිවාඩු ප්‍රතිලාභ** (MLB): ශ්‍රී ලංකාවේ කාන්තා ශ්‍රම බලකායේ සහභාගීත්වය දීර්ඝ කාලයක් තිස්සේ 30% ක පමණ අඩු මට්ටමක පවතී. තවද, රැකියා විරහිත කාන්තාවන්ගෙන් 80% ක් පමණ වයස අවුරුදු 20-40 අතර වයස් කාණ්ඩයේ පසුවෙති. අපි 1952 දී ෂබධ හරහා එබඊ වෙත කැපවී සිටියද, අපි තවමත් මේ සඳහා කිසිදු අරමුදලක් සපයා නැත. අපි MLB සඳහා පූර්ණ හෝ අර්ධ වශයෙන් හැකියාව මත අරමුදල් සපයන්නෙමු. මෙය ශ්‍රම බලකායේ කාන්තා සංඛ්‍යාව වැඩි දියුණු කිරීමට ප්‍රධාන පෙළඹවීමක් වනු ඇතැයි අපි විශ්වාස කරමු. | S M |
| ☎ **ආර්තව සාධාරණත්වය:** පාසල් යන ගැහැණු ළමුන් සඳහා සනීපාරක්ෂක නිෂ්පාදන සඳහා සහනාධාර (ස්වයංව-තෝරාගත් පදනම මත) ලබා දීම. මේ පිළිබඳ වැඩි විස්තර 10 වැනි පරිච්ඡේදයේ (ශක්තිමත් සමාජ ආරක්ෂණ ජාලය) විස්තර කර ඇත. | S M |

## 5.2 රාජ්‍ය සතු ව්‍යවසාය (STATE-OWNED ENTERPRISE) ප්‍රතිසංස්කරණය.

**දිගු කාලීන ව්‍යාපෘති සඳහා ප්‍රාග්ධන වියදම් සකස් කර ඇති නමුත්, රජය විසින් වෙනත් පුනරාවර්තන වියදම් තාර්කික කර (rationalised) හෝ SOE සඳහා අයවැය සීමාවන් පනවා නැත. පාඩු ලබන රාජ්‍ය ව්‍යවසායක සේවකයින්ට ප්‍රසාද දීමනා ලබා දීම සහ රාජ්‍ය අරමුදල් අධික ලෙස වියදම් කිරීම මේ සඳහා උදාහරණ වේ. පහත විස්තර කර ඇති පුළුල් ප්‍රතිසංස්කරණ සහ නිශ්චිත මැදිහත්වීම් හරහා, බොහෝ රාජ්‍ය ව්‍යවසායයන්ට බදු ගෙවන්නන්ගෙන් යැපීමෙන් තොරව ආදායම් උත්පාදකයින් බවට පරිවර්තනය විය හැකි අතර, ශ්‍රී ලංකාව සඳහා ශක්තිමත් සහ වඩා තිරසාර ආර්ථිකයක් ගොඩනැගීමට එය උපකාරී වේ.**

**"SOE හෝල්ඩින් සමාගමක්" (SOE Holding Company) පිහිටුවීම SOE ප්‍රතිසංස්කරණයේ ප්‍රධාන පියවරකි, මෙය නාස්තියට හා දූෂණයට තුඩු දෙන දේශපාලනඥයින්ගේ පාලනයෙන් SOE ඉවත් කරනු ඇත. මෙම SOE Holding සමාගම සිංගප්පූරුවේ 'Temasek ආකෘතියට් සමාන ව්‍යුහයක් යටතේ SOE හිමිකාරිත්වය කළමනාකරණය කිරීම සඳහා මධ්‍යගත සහ උපාය මාර්ගික රාමුවක් සපයනු ඇත. මෙම සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ එකඟත්වය ඇතිව ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන ගෝලීය මට්ටමේ දැරිය හැකි හොඳම ප්‍රවීණයන් විසින් කළමනාකරණය කරනු ලැබේ. එය භාණ්ඩාගාර ලේකම් (ST) විසින් කළමනාකරණය කරනු ලබන හිමිකාරිත්වය සමඟ තෝරාගත් SOEs ඒකාබද්ධ කරනු ඇත.**

**එක් එක් SOE විසින් තමන් සඳහා උපාය මාර්ගික සැලසුම් සහ අයවැය සකස් කර ගන්නා අතරතුර හෝල්ඩින් සමාගම ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සකස් කරනු ඇත. මෙම සැලසුම් ඔවුන්ගේ මණ්ඩල විසින් අනුමත කරන ලද ප්‍රධාන කාර්ය සාධන දර්ශක (KPIs) සමඟ වෙළඳපල කොටස, ඵලදායිතාව සහ මූල්‍ය ස්වාධීනත්වය වැඩිදියුණු කිරීම සඳහා ඉලක්ක, සම්පත් භාවිතය සහ උපාය මාර්ග ගෙනහැර දක්වයි. ජාත්‍යන්තර තරඟකාරිත්වය සහ කාර්යක්ෂමතාවය සමඟ ජාතික සහ ආරක්ෂණ අවශ්‍යතා සමතුලිත කරමින්, විවිධ පාර්ශවකරුවන්ගේ බහුවිධ අරමුණු මත පදනම්ව එක් එක් SOE හි (භාණ්ඩාගාර ලේකම්) ST විසින් දරනු ලබන කොටස් මොනවාද යන්න තීරණය කරනු ලැබේ.**

| මැදිහත්වීම | කාලරාමුව |
|---|---|
| SOE හෝල්ඩින් සමාගම: ඉහත විස්තර කර ඇති පරිදී˜ධෑ හෝල්ඩින් සමාගම නෛතිකව ස්ථාපනය කර, ක්‍රියාත්මක කිරීම සහ තෝරාගත් සියලු SOEs (zTemasekz ආකාරයේ ආකෘතියක්) එය යටතේ තැබීම. මෙයින් අදහස් වන්නේ රජය විසින් තීරණය කරනු ලබන නිර්ණායක මත පදනම් වූ සමහර˜ධෑ ප්‍රදකාසබට සමාගමෙන් පරිබාහිරව විය යුතු බවයි. | S M |
| **හෝල්ඩින් සමාගම යටතේ නොවන SOE නියාමනය කිරීම:**<br>☎ Holding Company යටතට නොගත් SOEs සඳහා දැඩි අයවැය සීමාවන් පැනවීම. ඔවුන් වෙත ප්‍රාග්ධන සහ ජංගම මාරු කිරීම් නතර කිරීමට ආරම්භ කිරීම.<br>☎ ව්‍යවස්ථා සම්පාදනය හරහා, හෝල්ඩින් සමාගම යටතේ නොවන SOE සඳහා පහත සඳහන් මූල්‍ය වර්ෂය තුළ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම අනිවාර්ය කරන අතර සියලු SOEs උපචිත පදනම මත ගිණුම්කරණය (accrual-based accounting) වෙත මාරු කිරීම. මෙහි අරමුණ වනුයේ SOE භාණ්ඩාගාරයට බරක් නොවීමයි. **සටහන:** මෙය ආරම්භ වී ඇති නමුත් ක්‍රියාත්මක කිරීම සහ මෙහෙයවීම කිරීම අවශ්‍ය වේ. | S M |
| **මූල්‍යකරණය:** මෙහි සම්පූර්ණ පරිවර්තනයක් වන තෙක් සියලුම SOE සඳහා රාජ්‍ය බැංකු විසින් අවදානම මත බර තැබූ (risk-weighted lending) ණය දීම භාවිතා කරන්න. | S |
| **ඈවර කිරීම (Liquidation):** ශක්‍ය නොවන SOE වල හිමිකාරිත්වය ලබා ගැනීම සඳහා භාරයක් හෝ හිමිකාර සමාගමක් ලෙස ව්‍යුහගත වූ නියෝජිතායතනයක් පිහිටුවීමෙන් බුන්වත් SOEs ඈවර කිරීම (liquidate). මෙම නියෝජිතායතනය වත්කම් ඈවර කිරීම (liquidate) සහ ණය පියවීම හසුරුවනු ඇත. | S |
| **ලිහිල්කරණය (Liberalization):** දැනට රජය සතු ව්‍යවසායන් විසින් ඒකාධිකාරී කර ඇති අංශවලට පුද්ගලික තැනත්තන්ට ප්‍රවිශ්ට වීමට ඉඩ සලසන ප්‍රතිපත්ති හඳුන්වා දීමෙන් වෙළඳපල ලිහිල් කිරීම. | M |
| **ගුවන් තොටුපළ කළමනාකරණය:** සියලු ගුවන් සමාගම් සඳහා ආකර්ෂණීය කිරීමට ගුවන් තොටුපළවල කළමනාකරණය ප්‍රතිසංස්කරණය කිරීම. අඩු වියදම් මගීන් සඳහා ගුවන් තොටුපළ ආකර්ශනීය වන ආකාරයෙන් Price ground handling සේවා. සටහන: රජය ගුවන් තොටුපල පෞද්ගලීකරණය කිරීමේ ක්‍රියාවලියක නිරත වෙමින් සිටී. | M |

# 06 වර්ධනය දිරිමත් කිරීම

කලක් ස්වයං පාලනයක් සඳහා හොඳින්ම සූදානම් වූ ආදර්ශව යටත් විජිතයක් වූ ශ්‍රී ලංකාව, උපක්‍රමික වශයෙන් වැදගත් පිහිටීමකින්, ශක්තිමත් අපනයන අංශයකින්, ශක්තිමත් අධ්‍යාපන පද්ධතියකින් සහ දියුණු යටිතල පහසුකම්වලින් ප්‍රතිලාභ ලැබීය. කලක්, එය වඩාත් සමෘද්ධිමත් ආසියානු ජාතීන් අතර ශ්‍රේණිගත විය. කෙසේ වෙතත්, දශක ගණනාවක් පුරා එහි ආර්ථික වර්ධනය වේගයෙන් සංවර්ධනය වෙමින් පවතින නැගෙනහිර ආසියානු ආර්ථිකයට වඩා පසුගාමී විය. 2007 වන විට, ශ්‍රී ලංකාව අඩු ආදායම්ලාභීන්ගේ සිට පහළ මධ්‍යම ආදායම්ලාභී තත්ත්වයට ද, 2019 වන විට ඉහළ මධ්‍යම ආදායම්ලාභී තත්ත්වයට ද සංක්‍රමණය වී කෙටිකාලයකට පසුව නැවත ප්‍රතිවර්තනය විය.

1960 ගණන්වල අග භාගයේ සිට, මන්දගාමී වර්ධනය හේතුවෙන් ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රගතිය යහපත් නොවිය. ආර්ථිකය සාර්ව ආර්ථික අස්ථාවරත්වයේ කාල පරිච්ඡේදවලට මුහුණ දුන් අතර එය නිරන්තර ෂඑජ මැදිහත්වීම්වලට හේතු විය. Covid-19 වසංගතය පෙර නොවූ විරූ ස්වෛරී ණය අර්බුදයකට හේතු වූ දුන් අතර, පසුගිය වසර පනහ තුළ විදේශ ණය පැහැර හරින ලද එකම ආසියානු රට බවට ශ්‍රී ලංකාව පත් විය.

ශ්‍රී ලංකාවේ දේශපාලන පාලන තන්ත්‍රයන් ස්ථාවර, සුසංයෝගී ජාතික සංවර්ධන ප්‍රවේශයකින් තොරව නිදහස් වෙළඳපොල ප්‍රතිපත්ති සහ රාජ්‍ය මූලික සංවර්ධන උපාය මාර්ග අතර නිරන්තරයෙන් දෝලනය වෙයි. 1977 දී ආරම්භ කරන ලද වෙළඳපල ඉලක්ක කරගත් ප්‍රතිසංස්කරණ පොරොන්දු වූ නමුත් ඒවා සම්පූර්ණයෙන් ක්‍රියාත්මක නොවිය. 1980 දශකයේ මුල් භාගයේ සිට ජනවාර්ගික ගැටුම් උත්සන්න වීම ආර්ථික ප්‍රගතියට තවදුරටත් බාධාවක් විය. මෙම අභියෝග මධ්‍යයේ වුවද, 1960 සිට 1977 දක්වා වූ 2.5% වර්ධනයට සාපේක්ෂව ඉහත සඳහන් කළ ප්‍රතිසංස්කරණවලින් පසු දශක දෙක තුළ ආර්ථිකය 4% ක සාමාන්‍ය අනුපාතයකින් වර්ධනය විය. නිෂ්පාදනය, විශේෂයෙන් අපනයනයට නැඹුරු, පුළුල් වූ සහ සෘජු විදේශ ආයෝජන මෙහිදී තීරණාත්මක කාර්යභාරයක් ඉටු කළේය. කෙසේ වෙතත්, ආර්ථිකය තිරසාර වර්ධන මාවතක ගෙනයාමට මෙම ප්‍රතිසංස්කරණ ප්‍රමාණවත් නොවීය.

2009 සිවිල් යුද්ධය අවසන් වීමෙන් පසුව, පෙර ලිහිල් ප්‍රතිපත්තිවලින් බැහැර වී ආරක්ෂණවාදී සහ මැදිහත්වීමේ ප්‍රතිපත්ති (protectionist and interventionist policies) ප්‍රමුඛතාව ලබා ගත්තේය. ආනයන අධිභාර (import surcharges) සහ දේශපාලනීකරණය වූ විදේශ ආයෝජන අනුමත කිරීමේ ක්‍රියාවලීන් සමඟ වෙළඳ ප්‍රතිපත්ති ඉහළ මැදිහත්වීමකට යටත් විය. බොහෝ විට 'සුදු අලි' ලෙස සැලකෙන විශාල යටිතල පහසුකම් ව්‍යාපෘති සඳහා ප්‍රමුඛත්වය දෙනු ලැබූ අතර, දේශීය ණය ගැනීම් සහ මුදල් මුද්‍රණය මගින් අරමුදල් සම්පාදනය කර ගන්නා ලද අතර එය උද්ධමනය ඉහළ නැංවීමට හේතු විය. මෙය වෙළඳාම් කළ හැකි නිෂ්පාදනයට (නිෂ්පාදනය සහ කෘෂිකර්මාන්තය) වඩා වෙළඳාම් කළ නොහැකි නිෂ්පාදනයට අනුග්‍රහය දක්වමින් 'වෙළඳාමට එරෙහි නැඹුරුවකට' හේතු විය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, දළ දේශීය නිෂ්පාදිතයේ වෙළඳාම් කළ හැකි නිෂ්පාදන කොටස 2019 වන විට 20% ට වඩා අඩු වූ අතර, දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස භාණ්ඩ හා සේවා අපනයන 2000 ගණන්වල මුල් භාගයේදී 30% සිට 15% දක්වා පහත වැටුණි. මෙම අසමතුලිතතාවය, දැවැන්ත ණය සමුච්චය සමග ඒකාබද්ධවී ස්වෛරී ණය අර්බුදයට දායක විය'

## දේශීය වෙළෙඳපොලෙහි විලංගු ඉවත් කිරීම

අපගේ රජය ශ්‍රී ලංකාව ගෝලීය වශයෙන් සම්බන්ධ වූ වෙළඳපොල ආර්ථිකයක් බවට පරිවර්තනය කිරීමට කැපවී සිටින අතර, වර්ධනයේ ප්‍රධාන ගාමක බලවේගය වශයෙන් පුද්ගලික ව්‍යවසාය දැවැන්ත හා කුඩා යන දෙඅංශයම පවතී. මෙම පරිවර්තනය සඳහා ප්‍රධාන අංශ දෙකක් අවශ්‍ය වේ: ඒවා නම් වෙළඳ ලිහිල් කිරීම (trade liberalization) සහ විදේශ සෘජු ආයෝජන හරහා ගෝලීය ආර්ථික ඒකාග්‍රතාවය (global economic integration) වැඩි දියුණු කිරීම සහ නිෂ්පාදන සහ ශ්‍රම වෙළඳපොලවල් ඇතුළු දේශීය වෙළඳපොලෙහි විලංගු ඉවත් කිරීම වේ. ඵලදායී වෙළඳපල සංඥා (market signals) සහතික කිරීම ජාතික සංවර්ධනය සඳහා පුද්ගලික අංශයේ පූර්ණ දායකත්වය ලබා ගැනීමට හේතු වනු ඇත.

අත්තනෝමතික මිල පාලනයන් සහ බලපත්‍ර අවශ්‍යතා වැනි රාජ්‍ය මැදිහත්වීම් දේශීය වෙළෙඳාම සහ නිෂ්පාදනය තුළ පෞද්ගලික අංශයේ කාර්යක්ෂම ක්‍රියාකාරිත්වයට බාධාවක් වී ඇත. සමගි ජන බලවේගයේ උපාය මාර්ගයට අනුව මෙම මැදිහත්වීම් ක්‍රමයෙන් ඉවත් කිරීම සහ වෙළෙඳපොල අසාර්ථක වන සහ අවදානමට ලක්විය හැකි ප්‍රජාවන් සඳහා සහාය අවශ්‍ය ප්‍රදේශවලට පමණක් රජයේ සෘජු මැදිහත්වීම සීමා කිරීම ද ඇතුළත් වේ.

කුඩා නිෂ්පාදකයින් සහ වෙළඳුන් පුළුල් ජාතික වෙළඳපොළට සම්බන්ධ කිරීම අරමුණු කර ගනිමින් ග්‍රාමීය මාර්ග ජාල සංවර්ධනය, සැපයුම් ප්‍රසම්පාදන ජාල (supply-procurement) වැඩි දියුණු කිරීම සඳහා රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ මුල පිරීම්, අර්ධ වශයෙන් නරක්වන කෘෂිකාර්මික නිෂ්පාදන සඳහා දේශගුණික පාලන ගබඩා පහසුකම් ස්ථාපිත කිරීම හරහා සැපයුම් යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සහ ඩිජිටල් ලෙස සපයනු ලබන සේවාවන් පුළුල් කිරීම.

කෘෂිකාර්මික අංශයේ දිගුකාලීන මිල සහන සහ පොහොර සහනාධාර ආමන්ත්‍රණය කිරීම වෙළෙඳපොළ ඉලක්ක කරගත් ප්‍රතිසංස්කරණවලදී පැමිණෙන සංකීර්ණ ප්‍රශ්නයකි. මෙම සෘජු මැදිහත්වීම් තාර්කික කිරීම (rationalize) සහ කෘෂිකාර්මික ව්‍යාප්ති සේවා, වාරිමාර්ග යටිතල පහසුකම් සහ පර්යේෂණ සඳහා රජයේ වියදම් වැඩි වශයෙන් හරවා යැවීම ඉලක්කය බව අපි විශ්වාස කරමු. කෙසේ වෙතත්, මෙම ආධාර මත ගොවීන්ගේ යැපීම සැලකිල්ලට ගනිමින්, විනිවිදභාවය වැඩි දියුණු කිරීම සහ ලබන්නන් අතර ප්‍රතිලාභ සාධාරණ ලෙස බෙදා හැරීම සහතික කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිසංස්කරණ සලකා බලනු ඇත.

ශ්‍රී ලංකාවේ කම්කරු නීති, ටැබැරදමී¨ඩැර්බජඃ ච්හ වගන්ති ඇතුළුව, ගෝලීය වශයෙන් තරඟකාරී වීමට ප්‍රතිසංස්කරණ අවශ්‍ය වේ. සමගි ජන බලවේගයේ අරමුණ වනුයේ ශ්‍රම වෙළෙඳපොළේ නම්‍යශීලී බව සහ ගෝලීය අවස්ථාවන්ට ප්‍රතිචාර දැක්වීම වැඩි කිරීමයි. අපගේ යෝජිත ශ්‍රම වෙළඳපොළ ප්‍රතිසංස්කරණ පිළිබඳ වැඩි විස්තර 8 වැනි පරිච්ඡේදයේ (සාධක වෙළඳපල ප්‍රතිසංස්කරණ) ඇත.

## ඵලදායී වර්ධනය (Productivity Growth)

ඵලදායිතා වර්ධනය - ප්‍රාග්ධනය, ශ්‍රමය සහ අතරමැදි යෙදවුම් වැනි යෙදවුම්වල වර්ධනයට සාපේක්ෂව නිෂ්පාදනයේ වර්ධනය ගණනය කිරීමෙන් මනිනු ලැබේ.[14] අඩු හෝ සෘණාත්මක ඵලදායිතා වර්ධනය ශ්‍රී ලංකා ආර්ථිකයේ නිරන්තර ප්‍රශ්නයකි. දිගුකාලීනව, ඵලදායිතා වර්ධනය රටක ආර්ථික වර්ධනයේ ප්‍රධාන නිර්ණායකය වෙයි. වැඩිවන යෙදවුම් මත පමණක් රඳා පැවතීමට ස්වභාවික සීමාවන් ඇත.

ඵලදායිතා වර්ධනය ආර්ථිකය පුරා සිදු වන සංසිද්ධියක් වන අතර එමගින් නිශ්චිත ඵලදායිතා ඉලක්කයක් සාක්ෂාත් කර ගැනීම සඳහා නිශ්චිත වැඩසටහනක් සැලසුම් කිරීමට නොහැකි වේ. ඵලදායිතා වර්ධනය ප්‍රවර්ධනය කිරීමේ රජයේ කාර්යභාරය වන්නේ නිෂ්පාදනයේදී භාවිතා කරන යෙදවුම් වලින් පුද්ගලික අංශයට උපරිම ප්‍රතිලාභ ලබා ගැනීමට හැකි වන පරිදි හිතකර පරිසරයක් නිර්මාණය කිරීමයි. සමගි ජන බලවේගයේ ප්‍රතිපත්ති පැකේජය මෙයට පහසුකම් සැලසීම සඳහා විශේෂයෙන් නිර්මාණය කර ඇත.

වෙළඳපොළ ලිහිල් කිරීම සමාගම් ජාත්‍යන්තර තරඟයට නිරාවරණය කිරීම මගින් දේශීය ආර්ථිකයේ ඵලදායිතාව ඉහළ නංවයි, පුළුල් ගෝලීය වෙලඳපොලවල් වෙත ප්‍රවේශ වීම හරහා economies of scale වඩා හොඳින් තරග කිරීමට ඉඩ සැලසීම සහ සහ ආනයනික යෙදවුම් වල අන්තර්ගත උසස් තාක්ෂණය භාවිතා කිරීමට හැකිවීම. දේශීය නිෂ්පාදනයට ඇතුළු වන විදේශීය සමාගම් නව තාක්ෂණය, කළමනාකරණ පිළිවෙත් ගෙන ඒම සහ ගෝලීය වෙලඳපොලවලට විනිවිද යාමට නව අලෙවිකරණ සම්බන්ධතා ඇති කරයි.

වෙළඳාම සහ ආයෝජන ලිහිල්කරණය හරහා ඵලදායිතාව ඉහළ නැංවීමේ මෙම ස්වාභාවික ක්‍රියාවලියට සහාය වීම සඳහා, අපගේ සංවර්ධන උපාය මාර්ගයේ මූලිකාංගයක් ලෙස මානව ප්‍රාග්ධන සංවර්ධනය අවධාරණය කරන්නෙමු. පුද්ගලික අංශයේ ආයතන සමග සහයෝගයෙන් පුහුණු හා නිපුණතා සංවර්ධන වැඩසටහන් මෙන්ම වෘත්තීය පුහුණු වැඩසටහන් දියත් කිරීම සඳහා විශ්වවිද්‍යාල, කාර්මික විද්‍යාල සහ අනෙකුත් උසස් අධ්‍යාපන ආයතනවලට මූල්‍ය සහ ආයතනික සහාය ලබා දීම ද මෙයට ඇතුළත් ය.

[14] ඵලදායිතාව පිළිබඳ වඩාත් බහුලව භාවිතා වන දර්ශකය වන්නේ 'ශ්‍රම ඵලදායිතාව' (labour productivity) වන අතර එය මනිනු ලබන්නේ එක් සේවකයෙකු සඳහා නිෂ්පාදනය (සාමාන්‍යයෙන් එකතු කළ අගය) ලෙස ය. මෙහි ඇති ගැටළුව වන්නේ, එය මනින ලද ඵලදායිතාවයේ කොටසක් ලෙස එක් සේවකයෙකුට ප්‍රාග්ධනය ව්‍යාජ ලෙස ග්‍රහණය කර ගැනීමයි ('බුල්ඩෝසරයක් ඇති මිනිසෙකුට සවලකින් පමණක් ඇති මිනිසෙකුට වඩා වේගයෙන් වළක් හෑරිය හැකිය'). මෙහිදී අපි සම්පූර්ණ සාධක ඵලදායිතාව (TFP), සියලු (ඒකාබද්ධ) යෙදවුම් සඳහා නිෂ්පාදනයේ වර්ධනය යන සංකල්පය භාවිතා කරමු.

## 6.1 වෙළෙඳ සහ විදේශ සෘජු ආයෝජන (FDI) ප්‍රතිපත්තිය

අධික ආනයන සීමා කිරීම් අපනයන නිෂ්පාදනය අධෛර්යමත් කිරීමෙන් ස්වයං තිරසාර වර්ධනයට බාධාවක් වන අතර ආනයන තරඟයෙන් ආරක්ෂා වීමෙන් ආනයන තරඟකාරී නිෂ්පාදනයේ (import-competing production) ඵලදායිතාව අඩාල කරයි. අකාර්යක්ෂම දේශීය නිෂ්පාදනයේ පිරිවැය දැරීමට සිදුවන්නේ ගෘහස්ත පාරිභෝගිකයාටය. මේ සීමා කිරීම් ක්‍රමානුකූලව අඩු කිරීමට අපේ රජය කැප වෙයි.

පළමුව, අපි ප්‍රමාණාත්මක සීමාවන් (quantitative restrictions) (QR) සාධාරණ ලෙස ඉහළ (WTO අනුකූල) තීරුබදු සමඟ ප්‍රතිස්ථාපනය (replace) කරමු, පසුව ගෙවුම් ශේෂ තත්ත්වය වැඩිදියුණු වන විට ඒකාකාර පහළ මට්ටමට තීරුබදු අඩු කරමු. අපනයන නිෂ්පාදනය සඳහා ආනයනික යෙදවුම් සඳහා තීරුබදු රහිත ප්‍රවේශය පහසු කිරීම සඳහා ආනයන බදු වට්ටම් යෝජනා ක්‍රම (දැන් ආර්ථික කොමිෂන් සභාව යටතේ පවතින ආයෝජන මණ්ඩල (BOI) ප්‍රතිපාදන ඇතුළුව) තාර්කික කිරීම සමඟ ආනයන බදු ක්‍රමය ඒකාබද්ධ කිරීම අවශ්‍ය වේ. තීරුබදු මගින් QRs ප්‍රතිස්ථාපනය කිරීමේ වැදගත් වාසි දෙකක් ඇත: (අ) එය තීරුබදු ආදායම වැඩි කිරීමෙන් රජයේ අයවැයට දායක වේ (QR) යටතේ, quota rent ආනයනකරුවන්ට යයි) සහ (ආ) ආනයන කෝටා හිමියන්ගේ (මූලික වශයෙන් ගජමිතුරන් වන) නොසැලකිලිමත් භාවිතයන් වළක්වයි. බොහෝ (සියල්ලම නොවේ නම්) specific import duties (විශේෂ තීරුබදු, ඒකකයකට අය කරනු ලබන අර්ථය) ad valorem duties සමඟ ප්‍රතිස්ථාපනය කිරීම ද වැදගත් වේ. පාරිභෝගික භාණ්ඩ සඳහා වන තීරු බදු (specific duties) දිළිඳු ජනතාව වෙත වැඩිම බලපෑමක් ඇතිකරන අතර (anti-poor) අඩු ගුණාත්මක දේශීය නිෂ්පාදනයන් එමගින් අනවශ්‍ය ලෙස ආරක්ෂා කරයි.

2022 දී, අපනයන ලැබීම් ඉහළ නැංවීම අරමුණු කරගත් දැඩි රෙගුලාසිවලට අනිවාර්ය ප්‍රේෂණ සහ දින 180 ක් ඇතුළත පරිවර්තනය කිරීම සහ සතිපතා විදේශ විනිමය වලින් 25% CBSL වෙත විකිණීම ඇතුළත් විය. මෙම නීති මගින් අපනයන නැවත ගෙන්වා ගැනීම අධෛර්යමත් කර බැංකු ද්‍රවශීලතාවය අඩු කරමින් විනිමය අනුපාතික ස්ථායිතාව විනාශ කළේය. මෙම රෙගුලාසි ලිහිල් කිරීමෙන් විදේශ විනිමය ගලා ඒම වැඩි වී විනිමය අනුපාතය ස්ථාවර වී ඇති බවට අපි එකඟ වෙමු.

අපනයනය ඉලක්ක කරගත් සෘජු විදේශ ආයෝජන (FDI) ප්‍රවර්ධනය කිරීම සඳහා ඉහළ මට්ටමේ දේශපාලන ප්‍රයත්නයක් දැරීම අපගේ රජයේ වෙළඳ ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණවලට අතිරේකයක් වනු ඇත.

| මැදිහත්වීම | කාලරාමුව |
|---|---|
| **ආර්ථික කොමිෂන් සභාව** (EC) **සහ දිරිගැන්වීමේ ප්‍රතිසංස්කරණ:** ශ්‍රී ලංකාවේ නිෂ්පාදන කර්මාන්තය ගෝලීය නිෂ්පාදන ජාලයන් සමඟ සම්බන්ධ කිරීම සඳහා, විදේශ ආයෝජන ප්‍රවර්ධනය සඳහා ඊධෂ එහි මුල් 'one-stop-shop' තත්ත්වයට ප්‍රතිස්ථාපනය කිරීම අත්‍යවශ්‍ය වේ. මෙම ප්‍රතිසංස්කරණවල කොටසක් ලෙස, අපනයනය ඉලක්ක කරගත් ආයෝජකයින්ට (export-oriented investor) ලබා දෙන මූල්‍ය දිරිගැන්වීම් ඉවත් කරනවා වෙනුවට ඒවා තාර්කික කිරීම අවශ්‍ය වේ. FDI ප්‍රවර්ධනය කිරීම සඳහා දිරිගැන්වීම් පිරිනැමීමේ පරමාර්ථය ඒවා දැඩි ලෙස කාලානුරූපී සහ විනිවිදභාවයෙන් සිදු නොකළහොත් අවලංගු වේ. | S M |
| EC **හි ආයෝජන පහසුකම් මධ්‍යස්ථානය** (IFC) **නැවත ස්ථාපිත කිරීම:** ශ්‍රී ලංකාවේ අපනයන ප්‍රවර්ධන උපාය මාර්ගවල සඵලතාවය ඉහළ නැංවීම සඳහා. මෙම මධ්‍යස්ථානය විවිධ සේවාවන් එකම වහලක් යට ඒකාබද්ධ කරන, ආයෝජන අනුමත කිරීමේ ක්‍රියාවලිය විධිමත් කරන, කාර්යක්ෂමතාව වැඩි දියුණු කරන සහ අන්තර් සම්බන්ධීකරණ වැඩිදියුණු කරන දබෑ-එදව්-යදව ලෙස සේවය කරනු ඇත. | S M |
| **තීරුබදු තාර්කිකකරණය:** තීරුබදු ව්‍යුහයන් තාර්කික කිරීම සඳහා ආනයන සහ අපනයන බදු දෙකෙහිම විවේචනාත්මක සමාලෝචනයක් සිදු කිරීම. ගෝලීය වශයෙන් තරඟකාරීව සිටීමේ අවශ්‍යතාවය සමඟ ආරක්ෂිත පියවර සමතුලිත කරන වෙළඳ තන්ත්‍රයක් නිර්මාණය කිරීමෙන් දේශීය නිෂ්පාදකයින්ට සහ අපනයනකරුවන්ට සහාය වීම මෙහි අරමුණයි. ආනයන බදු සඳහා සැලසුමක් 4 පරිච්ඡේදයේ (ආදායම් ඒකාබද්ධ කිරීම) හි දක්වා ඇත. | S |

| මැදිහත්වීම | කාලරාමුව |
|---|---|
| **ජාතික අපනයන උපාය මාර්ග (NES) යාවත්කාලීන කිරීම:** ගෝලීය වෙළෙඳපොළ ප්‍රමිතීන්ට අනුකූලව NES යාවත්කාලීන කිරීම සහ පුනර්ජනනීය බලශක්තිය සහ ඩිජිටල් සේවා වැනි වර්ධනය සඳහා සූදානම් වන අංශ ඊට ඇතුළත් කිරීම. මෙම අංශයන් පුළුල් ආර්ථික රාමුවක් තුළට ඒකාබද්ධ කිරීම, ජාත්‍යන්තර හොඳම භාවිතයන් සමඟ පෙළගැසෙන බව සහතික කිරීම සහ ආර්ථික විවිධාංගීකරණය සඳහා ඵලදායී ලෙස දායක වීම මෙයට ඇතුළත් වේ. | S M |
| **Treaty negotiation and renegotiation:** ආයෝජන වාතාවරණය වැඩිදියුණු කිරීම සඳහා, ජාත්‍යන්තර හොඳම භාවිතයන් සමඟ සමපාත වීමට investment and tax treaties සමාලෝචනය කිරීමට, සාකච්ඡා කිරීමට සහ නැවත සාකච්ඡා කිරීමට අපි දැඩි උත්සාහයක් දැරීම සහ FDI සැලකිය යුතු ලෙස වැඩි ප්‍රමාණයක් ආකර්ෂණය කර ගැනීමට හිතකර තරඟකාරී, විනිවිද පෙනෙන සහ ආරක්ෂිත නියාමන පරිසරයක් සහතික කිරීම. | S M |
| **අන්‍යෝන්‍ය පිළිගැනීමේ ගිවිසුම් (MRAs) සහ නිදහස් වෙළඳ ගිවිසුම් (FTAs):** ශ්‍රී ලංකාවේ ප්‍රමිතීන් ජාත්‍යන්තරව පිළිගෙන ඇති බව සහතික කිරීම සඳහා එකී භාවිතා කිරීම, වෙළඳපල ප්‍රවේශය සහ අපනයන ආකර්ශනීය බව වැඩි දියුණු කිරීම. මෙය පහසු ඉලක්කයක් වන අතර, එය දශක ගණනාවක් තිස්සේ සිදුනොකිරීම සිතාගත නොහැකිය. අපි ඉන්දියාවෙන් පටන් ගෙන දැනටමත් නිදහස් වෙළඳ ගිවිසුම් ඇති අනෙකුත් රටවලට ගමන් කරමු. අප සාකච්ඡා කරන සෑම නිදහස් වෙළඳ ගිවිසුමක්ම ශ්‍රී ලංකාවට උපරිම ප්‍රතිලාභ ලබා දීම සඳහා සිදු කරන බවට අපි සහතික වෙමු. | S M |
| **ජාතික වෙළඳ පහසුකම් කමිටුව (NTFC):** වෙළඳ පහසුකම් (TF) යනු ආනයන අපනයන ක්‍රියා පටිපාටි සරල කිරීම, ක්‍රමවත් කිරීම සහ ස්වයංක්‍රීය කිරීම සහ ඒවා වඩාත් විනිවිදභාවයට පත් කිරීමයි. අපගේ අපනයනකරුවන්ගේ තරඟකාරිත්වය වැඩිදියුණු කිරීම සඳහා ක්‍රියාවලිවල පිරිවැය සහ කාලය අඩු කිරීම සඳහා ප්‍රතිසංස්කරණ කිහිපයක් සිදු කිරීමට අපට සිදු වේ. අපගේ රජය ඉතා ඉහළ මට්ටමේ දේශපාලන අධිකාරියක් විසින් මෙහෙයවනු ලබන හඹපත හරහා ඔප සඳහා ඉතා ප්‍රමාද වූ ලෝක වෙළඳ සංවිධානයේ (උඹධ) බැඳීම් ක්‍රියාවට නැංවීමට ප්‍රමුඛත්වය ලබා දීම සහ කඩිනමින් නිරීක්ෂණය කරනු ඇත. | S M |
| **National Single Window (NSW) System:** වෙළෙඳ ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ සඳහා කේන්ද්‍රීය වන්නේ විවිධ වෙළෙඳාම සම්බන්ධ කාර්‍යපටිපාටින් තනි ඉලෙක්ට්‍රොනික වේදිකාවක් තුල ඒකාබද්ධ කිරීමයි; එය National Single Window (NSW) System නම් වේ. වෙළඳ කටයුතු (ආනයනය, අපනයනය සහ ප්‍රතිනැව්ගත කිරීම) සඳහා බලධාරීන් වෙත ඉදිරිපත් කිරීමට අවශ්‍ය ලේඛන සහ දත්ත ඉදිරිපත් කිරීම සඳහා හීළ ස්ථාපිත කිරීම සහ පවත්වාගෙන යාම උඹධ යටතේ නීතිමය බැඳීමක් ද වේ. ශ්‍රී ලංකාව ඔප ගිවිසුම 2016 දී අපරානුමත කර ඇති අතර හීළ ක්‍රියාත්මක කිරීම 2017 සහ 2022 අතර එය සම්පූර්ණ කිරීමට නියමිතව තිබුණි. නමුත් එය ක්‍රියාත්මක කිරීමේ දිනය විවිධ රජයේ මූලාශ්‍රවලට අනුව 2030 දක්වා පසුපසට තල්ලු කර ඇති අතර ඔවුන් අතරද මේ සම්බන්ධයෙන් ව්‍යාකූලභාවයක් ඇති බව පෙනී යයි. මෙම ඉලෙක්ට්‍රොනික වෙළඳ ද්වාරය සම්පූර්ණ කිරීමට දේශපාලන කැමැත්තක් නොමැති බව එය අවහිර කරන්නන් හොදින්ම දන්නා හේතු මත පැහැදිලිය. හීළ වෙත ප්‍රමුඛත්වය දීමට නිලධාරීන්ගේ අවම කැමැත්තෙන් සහ අඩු උද්‍යෝගය අපගේ රජය සවිසින් බිඳ දමනු ඇත. සීමිත නියෝජිතායතන සංඛ්‍යාවක් සමඟ වුවද ක්‍රියාත්මක කිරීමට හීළ හි සාර්ථකත්වය සහතික කිරීමට ෂෘෂ වඩාත් ප්‍රයෝජනවත් වනු ඇත. හීළ වෙත ප්‍රමුඛත්වය දීමට නිලධාරීන්ගේ කැමැත්තෙන් සහ අඩු උද්‍යෝගයෙන් අපගේ රජය විපක්ෂය බිඳ දමනු ඇත. සීමිත නියෝජිතායතන සංඛ්‍යාවක් සමඟ වුවද හීළ හි සාර්ථකත්වය සහතික කිරීමට PDI වඩාත් ප්‍රයෝජනවත් වනු ඇත. | S M |
| **වෙළඳ පිරිවැය ගැලපීම් (Trade-cost adjustments):** අපනයනය ඉලක්ක කරගත් ආර්ථික ව්‍යුහයක් පෝෂණය කිරීම සඳහා තීරනාත්මක වන විරැකියාව හෝ සම්පත් නැවත වෙන් කිරීම වැනි විහව සමාජ ආර්ථික බලපෑම් අවම කිරීම සඳහා වෙළඳ ගැලපුම් පහසුකම් ක්‍රියාත්මක කිරීම ඉතා වැදගත් වේ. මෙම පහසුකම් පෞද්ගලික සහ රාජ්‍ය අංශයේ ගැලපුම් පිරිවැය කෙරෙහි අවධානය යොමු කළ යුතුය. | M |

| මැදිහත්වීම | කාලරාමුව |
|---|---|
| **Anti-Dumping and Countervailing Duties Act:** සාධාරණ වෙළෙඳපොළ මිලට අඩුවෙන් භාණ්ඩ ආනයනය කර අලෙවි කරන අවස්ථාවලදී හෝ ඔවුන්ගේ රටවල සහනාධාර ලබා දෙන අවස්ථාවලදී අසාධාරණ විදේශීය තරඟකාරීත්වයෙන් ශ්‍රී ලාංකීය කර්මාන්ත ආරක්ෂා කිරීමට අපි නීති සම්පාදනය කරන්නෙමු. දේශීය ව්‍යාපාරවල සමමට්ටමක් සහතික කිරීමට සහ සාධාරණ වෙළෙඳ පිළිවෙත් ප්‍රවර්ධනය කිරීමට අපට නොහැකි නම් අපනයන දිරිගැන්වීමට සහ වෙළෙඳාම සඳහා විවෘත ජාතික ආර්ථික ආකෘතියක් නැවත සකස් කිරීමට නොහැකි ය. | M |
| **බුද්ධිමය දේපල (IP) කළමනාකරණය සහ Madrid Protocol:** දේශීය වෙළඳ ලකුණු ලියාපදිංචිය විධිමත් කිරීම සහ ශ්‍රී ලංකාව ඒාරසා ප්‍රොටෝකෝලය වෙත ප්‍රවේශ වීම පහසු කිරීම. මෙම පියවර මගින් ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ (NIPO) කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සහ ගෝලීය වශයෙන් ශ්‍රී ලාංකේය සන්නාමවල තරඟකාරිත්වය ඉහළ නංවමින් ජාත්‍යන්තර වෙළඳ ලකුණු පද්ධතියට ශ්‍රී ලංකාව ඒකාබද්ධ කිරීම වේගවත් කිරීම අරමුණු කරයි. මෙම ප්‍රතිපත්ති-නැඹුරු ප්‍රතිසංස්කරණ (policy-oriented reforms) සිදු නොකළහොත් ව්‍යාපාර ආරම්භකයින්ට සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට හෝ ඊටත් වඩා විශාල සමාගම්වලට ජාත්‍යන්තර වෙළඳපොළට ව්‍යාප්ත වීමට නොහැකි වනු ඇත. | M |
| **අපනයන සැකසුම් කලාපවල යටිතල පහසුකම් නවීකරණය:** කාර්මික උද්‍යාන සහ අපනයන සැකසුම් කලාප (IP&EZs) පිහිටුවීම සහ වැඩිදියුණු කිරීම ඉතා වැදගත් වේ. 1978 වසරේ කටුනායක ප්‍රථම EPZ ආරම්භ කළ දා සිට පසුගිය වසර 46 තුළ ආරම්භ කර ඇත්තේ EPZ 15ක් පමණි. සංසන්දනාත්මක අරමුණු සඳහා: පිලිපීනයේ EPZ 460, වියට්නාමය 410 සහ ඉන්දියාව 615 සහ පිළිවෙලින් ඒවායේ 92%, 89% සහ 74% පුද්ගලික හිමිකාරිත්වයක් පවතින අතර ශ්‍රී ලංකාවේ එක් EPZ (MAS Fabric Park) පමණක් රජයෙන් දීර්ඝ බදු පදනම මත ලබාගෙන ඇත.<br><br>EPZ යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේදී ශ්‍රී ලංකාව වැරදි කිහිපයක් සිදුකර ඇත. අනුප්‍රාප්තික රජයන් EPZ වල ප්‍රමාණය සහ ගුණාත්මකභාවය යන දෙකෙහිම අඩුවෙන් ආයෝජනය කර ඇත; EPZs සංවර්ධනය කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා ඔවුන් සම්පූර්ණයෙන්ම පොදු සම්පත් මත විශ්වාසය තැබූ අතර ඒවායේ ඵලදායී කළමනාකරණය සඳහා සුදුසු රෙගුලාසි ස්ථාපිත නොකළේය. 'onesSL නම් නව ආයතනයක් යටතේ EPZ පුද්ගලික හෝ PPP කලාප ලෙස පිහිටුවීම සඳහා නව රාමුවක් සඳහා විධිවිධාන සලසන ආර්ථික පරිවර්තන පනත රජය විසින් මෑතකදී නීතිගත කරන ලදී. මෙම පියවර පොදුවේ ධනාත්මක වන අතර අපගේ EPZs කලාපය තුළ තරඟ කළ හැකි වන පරිදි නීති තවදුරටත් වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ. අපගේ ප්‍රවේශය ත්‍රිවිධ ආකාරයකින් විය යුතුය. ප්‍රථමයෙන් EPZ පාලනය කිරීම සඳහා වෙනම, පුළුල් නීතියක් සම්පාදනය කිරීම. දෙවනුව, ආයෝජකයින් තෝරා ගැනීම සඳහා අවම ප්‍රමිතීන් සහ අවම නිර්ණායක ඇතුළත් කිරීම මගින් EPZ වල ගුණාත්මක භාවය වැඩි දියුණු කිරීම සහ තෙවනුව, නියාමන ස්වාධීනත්වය සහතික කිරීම මගින් බැදියාවන් අතර ගැටුම් (conflicts of interest) වළක්වා ගැනීම.<br><br>මෙම ප්‍රතිසංස්කරණ මඟින් ආයෝජකයින්ට තමන්ට ස්ථානයක් තීරණය කිරීමට ප්‍රධාන වන විස්තීරණ පහසුකම් සහ ආධාරක පද්ධති (වැඩිදියුණු කළ අපද්‍රව්‍ය සහ විමෝචන කළමනාකරණය සහ සැපයුම් සේවා වැනි) සැපයීම මගින් අධි තාක්ෂණික සහ ඉහළ අගය එකතු කළ කර්මාන්ත ආකර්ෂණය කර ගනු ඇතැයි අපි විශ්වාස කරමු. අපගේ අරමුණ වන්නේ සියලුම දිස්ත්‍රික්කවල සහ සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල EPZ දිරිමත් කිරීමයි. | M |

[15] Verite Research. Looking Beyond the Economic Transformation Bill: Three steps Sri Lanka can take to increase the supply of high-quality investment zones. July 2024

## 6.2 කෘෂිකර්මාන්තය, ධීවර කර්මාන්තය සහ පශු සම්පත්: බහුමාන ප්‍රතිසංස්කරණ

### ඩිජිටල්කරණය හරහා කෘෂිකර්මාන්තය නවීකරණය කිරීම

කෘෂිකර්මාන්තය ශ්‍රී ලංකාවේ ආර්ථිකයට තීරණාත්මක සාධකයක් වන අතර, ජනගහනයෙන් 26% කට වැඩි ප්‍රමාණයක් මෙම ක්ෂේත්‍රයේ රැකියා කරන අතර ග්‍රාමීය ජනගහනයෙන් තුනෙන් දෙකකට එය සහාය වේ. කෙසේ වෙතත්, කෘෂිකාර්මික කාර්‍යඵලය බලාපොරොත්තු සුන්කරවන සුළුය. පසුගිය දශක හතර තුළ එහි සාමාන්‍ය වාර්ෂික වර්ධන වේගය 1% ක් පමණ වන අතර නිෂ්පාදන හා සේවා වලට සාපේක්ෂව එය ඉතා අඩු ඵලදායිතාවයක් පෙන්වයි. එහි ප්‍රතිඵලයක් ලෙස, ග්‍රාමීය කෘෂිකාර්මික ප්‍රදේශවල දරිද්‍රතාවය දැඩි ලෙස සංකේන්ද්‍රණය වී ඇත.

අපි විවිධ මට්ටම්වල අභියෝගවලට ආමන්ත්‍රණය කළ යුතුයි. පැරණි නීති නවීකරණය කළ යුතුය. ප්‍රතිසංස්කරණ මගින් බිම් සවිය වැඩසටහන හරහා කෘෂිකාර්මික වෙළඳපොලවල විලංගු බිඳ දමා, ප්‍රතිසංස්කරණය කරන ලද වාරිමාර්ග වැව් හරහා සාධාරණ ජල ප්‍රවේශයක් සහ මූල්‍ය හා රක්ෂණ සඳහා ප්‍රවේශය ලබා දෙනු ඇත. තනි ගොවීන් සඳහා, සමස්ත අගය දාමය - කුමක්, කොපමණ, සහ කවදා නිෂ්පාදනය කළ යුතුද යන්න පිළිබඳ තොරතුරු ලබා ගැනීමේ සිට යෙදවුම් මූල්‍යකරණය කිරීම සහ වගා චක්‍රය කළමනාකරණය කිරීම දක්වා වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ. ඉන්පසුව, පසු අස්වනු කළමනාකරණය සම්බන්ධයෙන් ගබඩා කිරීමේ සිට අලෙවි කිරීම දක්වා ආමණ්ත්‍රණය කළ යුතුය.

ග්‍රාමීය දරිද්‍රතාවය අවම කිරීම, ඵලදායිතාව ඉහළ නැංවීම සහ එම අංශයේ වර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා අපි වේගවත්, තාක්ෂණය මත පදනම් වූ කෘෂිකාර්මික නවීකරණ වැඩසටහනක් ක්‍රියාත්මක කරන්නෙමු. මෙයට වී, එළවලු සහ වැවිලි භෝග වල - ආරක්ෂිත කෘෂිකර්මය, බිංදු වාරිමාර්ග, සහ සමහර විට ්ෂ සහයෙන් හයිඩ්‍රොපොනික් ගොවිතැන වැනි, සිටුවීමේ සිට විකිණීම දක්වා මැදිහත්වීම් ඇතුළත් වේ.

මෙම නවීකරණ වැඩසටහනේ හරය වනුයේ ගොවි ඥාන සේවා වැඩසටහන (GGS, එනම් 'ගොවි දැනුම සේවාව') වන අතර එය කෘෂිකාර්මික තොරතුරු සහ ගණුදෙණු කිරීම, වර්තමාන තාවකාලික ක්‍රම පරිවර්තනය කිරීම සඳහා වූ විස්තීර්ණ ඩිජිටල් පද්ධතියක් බවට පත්වනු ඇත. GGS ගොවීන් අතර ඇති තොරතුරු අසමමිතිය ඉවත් කරනවා පමණක් නොව වර්තමාන සහ ඉදිරි මිල ගණන්, සහ නිෂ්පාදන සඳහා සැපයුම සහ ඉල්ලුම, කාලගුණ රටා, පාංශු තත්ත්වයන්, සහ හොඳම භාවිතයන් මෙන්ම බැංකු, රක්ෂණ සමාගම් සහ ප්‍රවර්ධන සැපයුම්කරුවන් සම්බන්ධයෙන් තීරණාත්මක දත්ත සපයනු ලබයි. GGS වෙත ප්‍රවේශය සෑම තැනකම පවතින ජංගම දුරකථනය මගින් වනු ඇත. GGS ඩිජිටල් පද්ධතිය නිෂ්පාදකයින්ට අනාගත අස්වැන්න විකිණීමට ගිවිසුම් සහ සහතික මිල හරහා මූල්‍ය ස්ථාවරත්වයක් ලබා දීමට ඉඩ සලසයි. blockchain මගින් බල ගැන්වෙන ස්මාර්ට් කොන්ත්‍රාත්තු, ගනුදෙනු ස්වයංක්‍රීය කරන අතර වංචා අවදානම් අවම කරයි, ගොවීන්ට ණය පීඩනයෙන් නිදහස් වීමට මෙය උපකාරී වේ.

මෙම තොරතුරු පද්ධතිය DPI මත පදනම් වූ දේශගුණය පාලනය කරන ගබඩා සහ ප්‍රවාහන විකල්ප ජාලයකට සම්බන්ධ කරනු ඇත. පුද්ගලික අංශය සමඟ සහයෝගයෙන් පසු අස්වනු පාඩු අවම කර ගැනීමටත්, නිෂ්පාදක ලාභ වැඩි කිරීමටත්, retail වියදම් අඩු කිරීමටත්, ලාභදායී අපනයන වෙළෙඳපොළ වෙත ප්‍රවේශ වීමට පහසුකම් සැලසීමටත් අපි මෙම ජාලය ගොඩනගන්නෙමු. සම්පූර්ණ ක්‍රියාවලියම DPI මත ක්‍රියාත්මක වේ. රටපුරා දැනුවත් කිරීමේ සහ පුහුණු කිරීමේ වැඩසටහනක් මගින් අවශ්‍ය කුසලතා වලින් මෙයට අදාල පාර්ශවකරුවන් සන්නද්ධ කරනු ඇත.

### ගොවි ඥාන සේවා ක්‍රියාත්මක වන්නේ කෙසේද?

මෙහි වඩාත්ම පොදු ආරම්භක විශේෂාංගය වනුයේ විවිධ වෙළඳපලවල සජීවී මිල ගණන් පරීක්ෂා කිරීමයි. මාතලේ ගොවියෙකුට තම ස්මාර්ට් ජංගම දුරකථනය භාවිතා කර දඹුල්ල වෙළඳපොලේ වත්මන් එළවළු මිල පරීක්ෂා කර එය ප්‍රාදේශීයවම අලෙවි කරනවාද නැතහොත්දඹුල්ලට ප්‍රවාහනය කරනවාද යන්න තීරණය කිරීමට ඔහුට උපකාර කළ හැකිය. GGS විසින් ගොවීන්ට වාරිමාර්ග කාලසටහන්, බීජ අලෙවි කරන්නන්, පොහොර අලෙවි නියෝජිතයන්, කාලගුණ යාවත්කාලීන කිරීම් වෙත සම්බන්ධ කරනු ඇත. එය ගොවීන්ට අනාගත ඉල්ලුම අධ්‍යයනය කිරීමට සහ පසු කාලයකදී භාරදීම සඳහා සුපිරි වෙළඳසැල් ගැනුම්කරුවන් සමඟ forward sales agreements (FSA) වෙත පිවිසීමට ඉඩ සලසයි. මෙම FSAs පසුව අතරමැදි වෙළෙන්දන්ගේ ග්‍රහණයෙන් ගොවීන් නිදහස් කරමින් බැංකුවලින් කාරක ප්‍රාග්ධන ණය (working capital loans) ලබා ගැනීමට ඇපයක් ලෙස භාවිතා කළ හැකිය. FSA මඟින් රක්ෂණ සමාගම්වලට බෝග රක්ෂණය සඳහා වාරික තීරණය කිරීමට හැකි වනු ඇත. ගොවීන්ගේ නිෂ්පාදන ආරක්ෂිතව ඇසුරුම් කරන ලද බහාලුම්වල දේශගුණය පාලනය සහිත ගබඩාවලට ප්‍රවාහනය කිරීම සඳහා කදටසිඑසජ ගිවිසුම් සොයා ගැනීමට සහ එළැඹීමට ද එමගින් හැකියාව ලැබේ. ඨඪ හි භාවිතයන් හුදෙක් සිතීමෙන් පමණක් සීමා වනු ඇත.

සමස්තයක් වශයෙන් ගත් කල ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික, ධීවර සහ පශු සම්පත් යන ක්ෂේත්‍රවල යෝජිත තාක්ෂණික පරිවර්තනය හරහා පාර්ශ්වකරුවන් සඳහා වැඩි ඉපැයීම් ලබා දෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. එසේම පාරිභෝගිකයින් සඳහා නැවුම්, උසස් තත්ත්වයේ ආහාර සඳහා ප්‍රවේශය වැඩිදියුණු කිරීම සහ ග්‍රාමීය ප්‍රජාවන්හි ආර්ථික සමෘද්ධිය වැඩිදියුණු කිරීමද එමගින් අපේක්ෂිතය.

කෘෂිකර්මාන්තය පිළිබඳ වඩාත් සවිස්තරාත්මක සාකච්ඡාවක් වෙනම කෘෂිකර්ම ප්‍රතිපත්ති ලේඛනයකින් සපයනු ලැබේ. රාජ්‍ය මූල්‍ය ආධාර පාර්ශවයෙන් ගත් කළ, කෘෂිකර්මාන්තය නවීකරණය සඳහා ආයෝජන සහන ලබා දෙන අතරම කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ සඳහා වැට් බද්ද සංශෝධනය කරන්නෙමු. එසේම පරීක්ෂා කළ පදනමක් මතු_සා පදනම් කරගත් මුදල් හුවමාරු යාන්ත්‍රණයක් හරහා ඉන්ධන සහ පොහොර සහනාධාර සැපයීම කුඩා හා මධ්‍ය පරිමාණ ගොවීන් සඳහා ප්‍රධාන ආධාරකයක් ලෙස දැක්විය හැකිය.

### "ප්‍රභාශ්වර" දේශගුණ පාලන ගබඩා කිරීමේ විසඳුම (Climate-Controlled Storage Solution) - දඹුල්ල්

ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අංශය ඉහළ පසු අස්වනු හානි (40% ලෙස ඇස්තමේන්තු කර ඇත) සහ මිල අස්ථාවරත්වයට මුහුණ දෙයි. මෙයට පිළියමක් ලෙස මිල ස්ථාවර කිරීමට, පාඩු අවම කිරීමට සහ ගොවීන්ට සහාය වීමට දැරිය හැකි ගබඩා විසඳුම් සැපයීම සඳහා රජය විසින් දඹුල්ලේ (2019 දී) මෙට්‍රික් ටොන් 5,000 ක උෂ්ණත්වය සහ ආර්ද්‍රතාවය පාලනය කරන ගබඩාවක් ඉදිකිරීමට පටන් ගත්තේය. ප්‍රභාෂ්වර නම් වූ මෙය, රජය, පෞද්ගලික අංශය, ගොවි ප්‍රජාව සහ ඉන්දීය රජය (මුල් අරමුදල් සැපයූ) අතර සහයෝගීතාවයෙන් සිදු වූ අතර එය නවීන දේශගුණික පාලන කෘෂිකාර්මික සැපයුම්වල කාර්යක්ෂමතාව පිළිබඳ සංකල්පයේ සාක්ෂියක් විය. එහි අරමුණ වූයේ පසු අස්වනු හානි අවම කිරීම, ගොවි ආදායම ඉහළ නැංවීම, වෙළඳපල ප්‍රවේශය පුළුල් කිරීම, පුද්ගලික ආයෝජන උත්තේජනය කිරීම සහ තිරසාර භාවිතයන් දිරිමත් කිරීම මගින් කෘෂිකාර්මික සැපයුම් දාමයේ විප්ලවීය වෙනසක් ඇති කිරීමයි. පසුගිය රජය 2019 සිට 2022 දක්වා එහි ඉදිකිරීම් නතර කළ අතර 2022 සිට නව රජය එකී ව්‍යාපෘතිය නොසලකා හැරියද විපක්ෂයේ අපගේ උත්සාහය මත බොහෝ දුරට එය අවසන් කර ඇත. මීළඟ පියවර වන්නේ ගබඩාව කළමනාකරණය කිරීම සඳහා ක්‍රියාකරුවන්ට ආරාධනා කිරීම සහ ප්‍රභාෂ්වර ගබඩාවේ ගබඩා කිරීම සඳහා ගොවීන්ට හොඳ කෘෂිකාර්මික පිළිවෙත්වලට (GAP) අනුකූල නිෂ්පාදනවල නිරත වීම සහතික කිරීම සඳහා දැනුවත් කිරීමේ සහ පුහුණු ව්‍යාපාරයක් දියත් කිරීමයි.

## ධීවර කර්මාන්තයේ ආයෝජනය

ශ්‍රී ලංකාවේ ධීවර කර්මාන්තය මිල උච්චාවචනයන්, නොගැලපෙන ගුණාත්මකභාවය සහ සැපයුම් දාමයේ දුෂ්කරතා වැනි අභියෝගවලට මුහුණ දෙන නමුත් සැලකිය යුතු විභවයක් අත්පත් කර ගෙන ඇත. අප විසින් යෝජනා කරන උපාය මාර්ගයට නිරවද්‍ය දේශීය කාලගුණ අනාවැකි ලබා දීම සමඟින් වැඩිදියුණු කරන ලද Dialog DEWN යෙදුමක් හරහා තාක්ෂණය උත්තේජනය කිරීම සහ මාළු සංක්‍රමණය සහ වෙළඳපල මිල පිළිබඳ තත්කාලීන දත්ත ලබා දීම සඳහා GGS වැඩසටහන පුළුල් කිරීම ඇතුළත් වේ. සාගර සම්පත් සහ වගකිවයුතු ධීවර ක්‍රම ආරක්ෂා කිරීම සඳහා තිරසාර භාවිතයන් ප්‍රවර්ධනය කරමින් දේශීය හා ජාත්‍යන්තර වෙළඳපොළට උසස් තත්ත්වයේ මසුන් සැපයීම සහතික කිරීම සඳහා cold chain හි යටිතල පහසුකම් සඳහා පුද්ගලික ව්‍යවසාය ආයෝජන සඳහා අපි ආරාධනා කරන්නෙමු.

## පශු සම්පත් අංශය නවීකරණය කිරීම.

ආහාර සුරක්ෂිතතාව, ග්‍රාමීය සංවර්ධනය සහ පාරිසරික තිරසාරභාවය සඳහා පශු සම්පත් අංශය ඉතා වැදගත් වේ. GGS වැඩසටහනට මෙම අංශය ඒකාබද්ධ කිරීමෙන් කුඩා පරිමාණ ගොවීන් 600,000 කට වැඩි පිරිසකට සත්ව සෞඛ්‍යය, හොඳම භාවිතයන් සහ වෙළඳපල මිල ගණන්, ඵලදායිතාව සහ අලෙවිකරණය පිළිබඳ තත්කාලීන තොරතුරු සඳහා ප්‍රවේශය ලබා දෙනු ඇත. ඉලක්කගත ප්‍රතිපත්ති ලෙස තිරසාර සත්ත්ව පාලනය ප්‍රවර්ධනය කිරීම, ආහාර නිෂ්පාදනය සහ බෙදාහැරීම වැඩිදියුණු කිරීම සහ මූල්‍ය හා තාක්ෂණික සහාය තුළින් ග්‍රාමීය ජීවනෝපාය ඉහළ නැංවීම සිදු කරනු ඇත.

### The All-Island Shakthi Rice Cooperative, Polonnaruwa

කුඩා හා මධ්‍ය පරිමාණ (SME) සහල් මෝල්කරුවන්ට සහය වීමට සහ ගොවීන් සහ පාරිභෝගිකයින් ආරක්ෂා කිරීම සඳහා රජය 2019 මාර්තු මාසයේදී 'ශක්ති සහල' හඳුන්වා දෙන ලදී. කුඩා හා මධ්‍ය පරිමාණ මෝල්කරුවන් 300කගේ පමණ සමුපකාරයක් ලෙස නිර්මාණය වූ මෙමගින් ආරම්භයක් වශයෙන් රුපියල් බිලියනයක කාරක ප්‍රාග්ධන අරමුදලක් සපයා ඇති අතර, මෝල්කරුවන්ට තරඟකාරී මිල ගණන් යටතේ වී මිලදී ගැනීමටත්, කුඩා හා මධ්‍ය පරිමාණ සහල් මෝල් සිය ගණනක් ක්‍රියාත්මක කිරීමටත් සහ සහල් දැරිය හැකි මිලකට අලෙවි කිරීමටත් එමගින් හැකි විය. මෙම ප්‍රයත්නය මගින් වසා දැමූ කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ශාලා නැවත විවෘත කර, සහල්වල ගුණාත්මක භාවය වැඩි දියුණු කර, සහ මිල සීමාවක් නියම කර, විශාල මෝල්කරුවන්ට ඔවුන්ගේ මිල අඩු කිරීමට බල කෙරුනි. එහි සාර්ථකත්වය තිබියදීත්, මෙම වැඩසටහන 2020 දී නවත්වන ලද අතර 2022 ආණ්ඩු මාරුවෙන් පසු එය නැවත ආරම්භ නොකළේය. අපගේ රජය හැකිතාක් සහල් මෝල්කරුවන් ආවරණය වන පරිදි ශක්ති ආකෘතිය නැවත හඳුන්වා දී පුළුල් කරනු ඇත.

## සහල් මෝල් ඒකාධිකාරය බිඳ දැමීම

ශ්‍රී ලාංකිකයන්ගේ ප්‍රධාන ආහාරය වන සහල් මිල ඉහළ යාමට එක් ප්‍රධාන හේතුවක් වන්නේ සහල් මෝල් කර්මාන්තයේ පවතින තරගකාරීත්වය නොමැතිකමයි. වෙළෙඳ පොළ පාලනය කරන්නේ සහල් සඳහා වෙළෙඳ පොළ හසුරවන මෝල්කරුවන් අතළොස්සක් විසිනි. මේ මාෆියාව් බිඳ දැමිය යුතුයි. වසර ගණනාවක් තිස්සේ රජය සතු වී අලෙවි මණ්ඩලය හරහා වෙළෙඳපොළට මැදිහත් වීමට රජය උත්සාහ කළ නමුත් දූෂණය, දේශපාලනීකරණය සහ උනන්දුව නොමැතිකම හේතුවෙන් එය අසාර්ථක විය. මේ සඳහා අපගේ විසඳුම වනුයේ එකී ඒකාධිකාරයට එරෙහිව සටන් කිරීම සඳහා ශක්තිමත් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක සමූපකාරයක් ගොඩනැගීමයි. මෙම වෙළඳපොලේ තිරසාර තරඟකාරිත්වයක් සහතික කිරීම සඳහා ශක්ති සහල් සමූපකාර යෝජනා ක්‍රමය නැවත හඳුන්වා දීමෙන් කාරක ප්‍රාග්ධන පහසුකමක් හරහා අවශ්‍ය මූලික මුල්‍ය ආධාර අප රජය විසින් ඔවුන්ට සපයනු ලැබේ.

| මැදිහත්වීම | කාලරාමුව |
|---|---|
| **ඉඩම් සඳහා ප්‍රවේශය වැඩි කිරීම:**<br><br>බිම් සවිය වැඩසටහන කඩිනම් කිරීම හෝ සුරක්ෂිත ඉඩම් හිමිකම් සහ හිමිකාරිත්වය සැපයීම සඳහා විකල්පයක් සමඟ එය ප්‍රතිස්ථාපනය කිරීම. මෙය පසුව විස්තීරණ සහ උපදේශන ක්‍රියාවලියක් මත පදනම් වූ ඉඩම් පරිහරණ සැලැස්මක් මගින් ඛණ්ඩිත සම්පූර්ණ ඉඩම් දත්ත සමුදායක් බවට පත් වනු ඇත. මෙමගින් ගොවීන්ට තම ඉඩම් පිළිබඳ තීරණ ගැනීමේ ස්වයං පාලනයක් ලබා ගැනීමටත්, මූල්‍ය සම්පත් සඳහා ස්වාධීන ප්‍රවේශයට පහසුකම් සැලසීමටත් හැකි වේ.<br><br>පවතින නීති තත්වයන් සමාලෝචනය කර රජය සතු අතිරික්ත ඉඩම් බෙදා හැරීම හරහා තවත් පුද්ගලික ඉඩම් අයිතිය තහවුරු කිරීම. සින්නක්කර හිමිකම් ලබාදීම සඳහා වත්මන් උරුමය වැඩසටහන අඛණ්ඩව කරගෙන යාම සහ එය පුළුල් කිරීම. | M |
| **ලිහිල්කරණය:** PPP ස්ථාපිත කිරීම, තෘෂ දිරිමත් කිරීම සහ බහුජාතික සහභාගීත්වය සහයෝගීතාවය සඳහා ගොවීන්ට මූල්‍ය ප්‍රවේශය සහතික කිරීම ලොව පුරා වෙළඳපල මාර්ග විවෘත කරන අතර එමගින් අපගේ ගොවීන්ට ජාත්‍යන්තර ප්‍රමිතීන්ට සහ අපනයනයට හැකියාව ලබා දෙයි. | M |

| මැදිහත්වීම | කාලරාමුව |
|---|---|
| **තරඟකාරිත්වය:** තරඟකාරිත්වය වැඩිදියුණු කිරීම සඳහා රෙගුලාසි සංශෝධනය කිරීම (උදා: රෝපණ ද්‍රව්‍ය සහ බීජ ආනයනය ලිහිල් කිරීම, අපනයන ලිහිල් කිරීම සඳහා ආහාර පනත සහ ධීවර පනත සංශෝධනය කිරීම). | M |
| **නවීකරණය:** ඵලදාව වැඩි දියුණු කිරීම සඳහා නවීන තාක්ෂණික ක්‍රම අනුගමනය කිරීම දිරිමත් කිරීම සහ සැපයුම්වල ගුණාත්මකභාවය වැඩි දියුණු කරන අතරම පසු අස්වනු හානි අවම කිරීම. | M |
| **අගය වැඩි දියුණු කිරීම:** ඉහළ වටිනාකමකින් යුත් බෝග, පශු සම්පත් සහ ධීවර නිෂ්පාදන සහ අගය එකතු කළ විකල්ප (value-added options) වෙත ගමන් කිරීමට දිරිමත් කිරීම (උදාහරණ; ටින් කිරීම, වියළීම, කාබනික නිෂ්පාදනය) | M |
| **වැව්ලි ප්‍රතිසංස්කරණ:** වතුකරයේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම, කුඩා වතු හිමියන්ට සහාය වීම, සේවක තත්ත්වය වැඩිදියුණු කිරීම, වතු කම්කරුවන් අතර නිවාස හිමිකම වැඩි කිරීම සහ ප්‍රාදේශීය වතු සමාගම් වඩාත් සාධාරණ ආකෘතියක් යටතේ ාසඩිෑච කිරීම සදහා ජාතික ඡජෘ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම. | L |
| **GGS වැඩසටහන රටපුරා ක්‍රියාත්මක කිරීම:** DPI සමඟ ඒකාබද්ධ වන මෙම වේදිකාව වගා කළ යුත්තේ කුමක්ද, කොපමණ ප්‍රමාණයක් සහ කවදාද යන්න තෝරාගැනීමේ සිට අස්වැන්න නෙලීම දක්වා ගබඩා කිරීම දක්වා සහ දේශීය හෝ විදේශීය වශයෙන් අවසාන ගැනුම්කරුට නිෂ්පාදන විකිණීම දක්වා සමස්ත කෘෂිකාර්මික පරිසර පද්ධතියේම සම්පූර්ණ විප්ලවීය වෙනසක් සිදු කරනු ඇතැයි අපි අපේක්ෂා කරමු. | S M |
| **විශේෂිත කෘෂිකර්ම සමුපකාරය:**<br>දීපව්‍යාප්ත ශක්ති සහල් සමුපකාර යෝජනා ක්‍රමය නැවත ආරම්භ කිරීම. 2019 වසරේ වැඩසටහනේ සාර්ථකත්වය අනුව, අපි උගත් පාඩම් ඇතුළත් කරමින් යෝජනා ක්‍රමය සංවිධානය කරමු.<br>වෙළඳපල ප්‍රවේශය ශක්තිමත් කිරීම, සාධාරණ මිලක් සහතික කිරීම සහ අතරමැදියන් සූරාකෑම අවම කිරීම සඳහා අගය එකතු කිරීම ප්‍රවර්ධනය කරමින් ප්‍රාදේශීය සමුපකාර කිරි සමිති ඇති කිරීම. | S |
| **දේශගුණික පාලිත කෘෂිකාර්මික නිෂ්පාදන ගබඩා** (Climate-controlled agricultural-produce warehouses) දීප ව්‍යාප්ත ප්‍රභාෂ්වර දේශගුණික පාලිත කෘෂිකාර්මික නිෂ්පාදන ගබඩා ජාලයක් නිර්මාණය කිරීම. ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට මෙට්‍රික් ටොන් 5,000 ක උෂ්ණත්වය සහ ආර්ද්‍රතාවය පාලනය කළ හැකි නිෂ්පාදන ගබඩාව දඹුල්ල ප්‍රදේශයේ ඉදි කිරීම (වසර 4 කින් ප්‍රමාද වී) අප විසින් අවසන් කර දිවයින පුරා එවැනි ගබඩා ජාලයක් ඉක්මනින් සංවර්ධනය කරන්නෙමු. ප්‍රදේශය පදනම් කරගත් ඉල්ලුම සපුරාලීම සඳහා මෙම ගබඩා විශේෂිත වනු ඇත. මෙම ගබඩා දත්ත ජාලයක් හරහා අන්තර් සම්බන්ධිත වන අතර ගොවීන්ට බැංකු සහ රක්ෂණ සමාගම්, සැපයුම් ක්‍රියාකරුවන් සහ ගැනුම්කරුවන් සමඟ අන්තර් ක්‍රියා කිරීමට හැකි වන පරිදි GSS වේදිකාව සමග සම්බන්ධ කෙරේ. | S M |

## 6.3 කාර්මික සංවර්ධනය: ගෝලීය අගය දාමයන් වෙත සම්බන්ධ වීම

### පවුරු බිඳිමින් ලෝකයට පාලම් නිර්මාණය කිරීම

ගෝලීය නිෂ්පාදන අගය දාම (GMVCs) හෝ ගෝලීය නිෂ්පාදන ජාලයන් (GPNs) ව්‍යාප්ත වීමත් සමඟ පසුගිය අඩ සියවස තුළ ගෝලීය නිෂ්පාදන භූ දර්ශනය විශේෂාකාරයෙන් ලෙස වෙනස් වී ඇත. වර්තමානයේ විශේෂයෙන්ම ඉලෙක්ට්‍රොනික, මෝටර් රථ, යන්ත්‍රෝපකරණ සහ precision goods කර්මාන්තවල අවසාන නිෂ්පාදන බොහෝ විට රටවල් කිහිපයක නිෂ්පාදනය කරන සංරචක වලින් සමන්විත වේ. මෙම සංසිද්ධිය මගින් තම ජාතික සීමාවන් තුළ, ආරම්භයේ සිට අවසානය දක්වා භාණ්ඩ නිෂ්පාදනය කිරීම වෙනුවට ඔවුන්ගේ සාපේක්ෂ පිරිවැය වාසිය මත පදනම්ව GMVC හි නිශ්චිත කොටසක නිරත වීමට අවස්ථාවන් උදා කරයි. ඉහළ කාර්යසාධනයක් ඇති නැගෙනහිර ආසියානු ආර්ථිකයන්ගේ නිෂ්පාදන අපනයනවලින් වැඩි ප්‍රමාණයක් GMVC තුළ සිදු වේ.


ශ්‍රී ලංකාව තුළ අප අත්විඳ ඇති පරිදි ඇඟලුම් සම්බන්ධයෙන්, දේශීය ව්‍යවසායකයින්ට තෘෂ මැදිහත්වීම සහිතව හෝ රහිතව ජාත්‍යන්තර ගැණුම්කරුවන් සමඟ සම්බන්ධතා හරහා ගෝලීය වෙළඳපොළට ඇතුළු වීමට අවස්ථාව තිබේ. නමුත් ඉලෙක්ට්‍රොනික හා විද්‍යුත් කර්මාන්තයන්හි GMVC වල, නිෂ්පාදන බෙදාගැනීම දුරස්ථ ආකාරයෙන් නොව අභ්‍යන්තර ආයතනික සම්බන්ධතා හරහා සිදු වේ. තාක්ෂණික රහස්‍යභාවය ආරක්ෂා කිරීම සඳහා සහ අවසාන නිෂ්පාදනයේ තත්ත්ව ප්‍රමිතීන් පවත්වා ගැනීම සඳහා අත්‍යවශ්‍ය වන අවස්ථාවලදී දී නිශ්චිත ස්ථානයක නිපදවන කොටස් සහ සංරචකවල ගුණාත්මකභාවය සහතික කිරීම සඳහා අන්තර්-සමාගම් සම්බන්ධතා අත්‍යවශ්‍ය වේ. එබැවින්, මෙම කර්මාන්තවල GMVC සඳහා රටක සහභාගීත්වය සඳහා FDI ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරන අතර ඒවා සාමාන්‍යයෙන් නිෂ්පාදක විසින් මෙහෙයවන GMVC ලෙස හැඳින්වේ.

GMVCs තුළ වෙළඳාම, ලෝක වෙළඳ භාණ්ඩ වෙළඳාමෙන් අඩක් හෝ තුනෙන් දෙකක් සහ සංවර්ධනය වෙමින් පවතින සහ සංවර්ධිත රටවල් අතර නිෂ්පාදන වෙළඳාමෙන් තුනෙන් දෙකකට වඩා වැඩි වේ.

GMVCs ක්‍රියාත්මක වන්නේ එක් එක් රටවල පිරිවැය වාසිය මත පදනම්ව වේ. ශ්‍රී ලංකාව, එහි බහුලව පවතින පුහුණු කළ හැකි ශ්‍රමය සහ උපාය මාර්ගික පිහිටීම සමඟ, GMVCs තුළ ශ්‍රම-අධික කාර්යයන්හි දැඩි ලෙස නිරත විය හැකිය.

කෙසේ වෙතත්, මෙහි සාර්ථක සහභාගීත්වය රඳා පවතින්නේ 'සේවා සම්බන්ධක' පිරිවැය මත- GMVC තුළ ක්‍රියාකාරකම් සම්බන්ධීකරණ කටයුතු සඳහා විධිවිධාන- විදේශයන්හි නිෂ්පාදනයේ පිරිවැය ඉතුරුම් වලට වඩා අඩු වීම. නැව්ගත කිරීමේ ප්‍රමාදයන්, දේශපාලන කැලඹීම් හෝ කම්කරු ආරවුල් වැනි 'රටේ අවදානම්' අවම කිරීම සඳහා හිතකර ප්‍රතිපත්ති තන්ත්‍රයක් සහ ආයෝජන වාතාවරණයක් ද ඉතා වැදගත් වේ.

පහත ප්‍රස්ථාරයෙන් අපගේ අභියෝගය කුමක්ද යන්න පැහැදිලිව පෙන්නුම් කරයි. ගෝලීය අපනයනවල සංවර්ධනය වෙමින් පවතින රටවල ප්‍රමාණය 1976 දී 17% සිට 2020 වන විට 50% දක්වා වැඩි වූ අතර, ශ්‍රී ලංකාවේ කොටස 1990 දශකයේ මැද භාගයේදී 0.02% සිට 0.3% දක්වා ඉහළ ගොස් 2020 දී වෙළඳ විරෝධී නැඹුරු (අපනයන විරෝධී) ආර්ථිකයක් ලෙස 0.15% ට වඩා අඩු විය. අපගේ රජයේ ප්‍රතිපත්තිය වන්නේ 6.1 පරිච්ඡේදයේ (වෙළඳාම සහ විදේශ සෘජු ආයෝජන ප්‍රතිපත්තිය) වඩාත් සවිස්තරාත්මකව විස්තර කර ඇති පරිදි මෙම ප්‍රවණතාවය ආපසු හැරවීම සහ වෙළඳාම් (අත්‍යවශ්‍යයෙන්ම අපනයන) අංශය දිරිගැන්වීමයි.




සමගි ජන බලවේගයේ අපනයන-නැඹුරු කාර්මිකකරණ උපායමාර්ගය ගෝලීය නිෂ්පාදකයින් සඳහා ආකර්ශනීය පරිසරයක් නිර්මාණය කරමින් GMVC වලට ශ්‍රී ලංකාව ඒකාබද්ධ කිරීම අරමුණු කරයි. මෙහිදී අවධානය යොමු කළ යුතු ප්‍රධාන කරුණු වන්නේ:

- වෙළඳාම් කළ හැකි අංශය කෙරෙහි අවධානය යොමු කරන ස්ථාවර ප්‍රතිපත්ති පරිසරයක් සහ දේපල අයිතිවාසිකම් පිළිබඳ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය බැඳීමක් ඔප්පු කිරීම.
- ජාත්‍යන්තර තරගකාරිත්වය සහතික කිරීම සඳහා හිතකර සැබෑ විනිමය අනුපාත තන්ත්‍රයක් සහිත ස්ථාවර සාර්ව ආර්ථිකයක් නිර්මාණය කිරීම සහ පවත්වාගෙන යාම.
- ව්‍යාපාර-හිතකාමී පරිසරයක් නිර්මාණය කිරීම සඳහා විධිමත් රෙගුලාසි සකස් කිරීම, කලින් සඳහන් කළ වෙළඳ පහසුකම් සහ තනි කවුළුවක් ස්ථාපිත කිරීම සහතික කිරීම.
- සියලුම තරගකරුවන්ට සමානව නීතිය ක්‍රියාත්මක කිරීමේදී සාධාරණ සැලකීම සහතික කිරීම සහ බේරුම්කරණය හරහා වාණිජ ආරවුල් ඉක්මනින් අවසන් කිරීම.
- විශේෂිත ගෝලීය නිෂ්පාදන කාර්යයන්හි නිරත වීම සඳහා සැලකිය යුතු තරම් විශාල නිපුණතා සහිත සහ පුහුණු කළ හැකි ශ්‍රම සංචිතයක් සහ කළමනාකරණයක් සංවර්ධනය කිරීම.
- නව උසස් තත්ත්වයේ පුද්ගලික හෝ PPP මත ක්‍රියාත්මක වන අපනයන සැකසුම් කලාප (EPZs) ඇතුළුව අවශ්‍ය යටිතල පහසුකම් ගොඩනැගීම. සියලුම දිස්ත්‍රික්කවල EPZ පිහිටු වීම සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ගණනාවක නිෂ්පාදන සහ පහසුකම් පිහිටුවීම දිරිගැන්වීමට අපි අවධානය යොමු කරන්නෙමු.
- EPZs වෙත නිෂ්පාදකයා මත ක්‍රියාත්මක වන තාක්ෂණය  මත පදනම් කරගත් තෘෂ ආකර්ෂණය කර ගැනීම කෙරෙහි අවධානය යොමු කිරීම. පවතින සියලු මාර්ග භාවිත කරමින් ශ්‍රී ලංකාව ආයෝජකයින් වෙත ප්‍රවර්ධනය කිරීමට අපේ රජය ඉහළම මට්ටමින් කටයුතු කරනු ඇත. එක් ප්‍රධාන තරගකරුවෙකු ගෙන ඒම ශ්‍රී ලංකාව ගැන සලකා බැලීමට අන් අය දිරිමත් කරනු ඇත.
- ගෝලීය අලෙවිකරණ ප්‍රදර්ශන සහ ද්විපාර්ශ්වික රැස්වීම් වලදී භව්‍ය ගැනුම්කරුවන් (potential buyers) සමඟ සම්බන්ධ වීමට සමාගම්වලට අවස්ථාව ලබා දෙන හොඳින් ක්‍රියාත්මක වන අපනයන සංවර්ධන මණ්ඩලයක් හරහා අපනයන සහ සහයෝගීතාව ප්‍රවර්ධනය කිරීම සඳහා අත්‍යවශ්‍ය සේවා සැපයීම.

☎ තරඟකාරී දිරිගැන්වීම් ලබා දීම.

ගෝලීය ආර්ථික සබඳතා ශක්තිමත් කිරීම සහ හවුල් අගය දාමයන් සඳහා සහභාගී වීම මගින් අපගේ අපනයන හැකියාවන් ඉහළ නංවන අතර ආයෝජන ආකර්ෂණය කර ගැනීම සහ ගෝලීය තරඟකාරිත්වය ඉහළ නංවයි. මීට අමතරව මෙම හවුල්කාරිත්වයන් දැනුම හුවමාරු කිරීම, තාක්ෂණික සහයෝගීතාවය සහ නිපුණ මානව ප්‍රාග්ධනය සංවර්ධනය සඳහා පහසුකම් සපයනු ඇත.

## ගෝලීය ඉලෙක්ට්‍රොනික අගය දාමයට ඒකාබද්ධ වීම

1970 ගණන්වල අගභාගයේ ලිබරල්කරණ ප්‍රතිසංස්කරණවලින් පසුව, බහුජාතික ව්‍යවසායන් ගෝලීය ඉලෙක්ට්‍රොනික අගය දාමය තුළ ශ්‍රී ලංකාවේ පැවති විභවය දුටුවෝය. ප්‍රධාන ඉලෙක්ට්‍රොනික බහුජාතික සමාගම් දෙකක් වන එදඑදරදක් සහ Harris Corporation කටුනායක අපනයන සැකසුම් කලාපයේ (KEPZ) සිය මෙහෙයුම් ආරම්භ කළහ. කෙසේ වෙතත්, දේශපාලන අස්ථාවරත්වය හේතුවෙන් 1980 දශකයේ මුල් භාගයේදී ඔවුහු දෙදෙනාම ඉවත්ව ගියහ. මෙම MNE දෙක KEP' හි සාර්ථක ලෙස ක්‍රියාත්මක වූයේ නම්, බහුජාතික ඉලෙක්ට්‍රොනික සමාගම් විසින් ප්‍රදේශ තෝරාගැනීමේදී සුප්‍රසිද්ධ 'රංචු මානසිකත්වය' අනුව අනෙකුත් ඉලෙක්ට්‍රොනික බහුජාතික සමාගම් ද එය අනුගමනය කිරීමේ හැකියාවක් පැවතුණි. එසේ තිබියදීත්, මධ්‍යම පරිමාණයේ අපනයන-නැඹුරු සමාගම් 30කට අධික සංඛ්‍යාවක් ශ්‍රී ලංකාවේ ඉලෙක්ට්‍රොනික උපකරණ, විදුලි භාණ්ඩ සහ වාහන අමතර කොටස් කර්මාන්තවල සාර්ථකව ක්‍රියාත්මක වී ඇති අතර, කම්කරුවන් 20,000කට අධික සංඛ්‍යාවක් සේවයේ යොදවා ඇති අතර 2010 දශකයේ අග භාගය වන විට ඩොලර් බිලියන 1ක් පමණ වටිනා අපනයන උත්පාදනය කර ඇත. මෙම සමාගම් සංරචක පරාසයක් නිෂ්පාදනය කරන අතර ජපානය, ජර්මනිය, ස්විඩනය, ඕස්ට්‍රලියාව සහ ඇමරිකා එක්සත් ජනපදයේ සමාගම්වලට පූර්ණ හෝ අර්ධ වශයෙන් හිමිකාරිත්වය දරයි. මෙම ආයෝජකයින්ට අනුව, පුහුණු කළ හැකි ශ්‍රමිකයන් සහ අධීක්ෂණය සහ කළමණාකාර පිරිස් සිටීම මෙම ආයෝජකයින්ගේ ප්‍රධාන ආකර්ෂණයක් වී ඇත.[16]

අභියෝගාත්මක පරිසරයක වුවද ඔවුන්ගේ සාර්ථකත්වය මගින් ක්‍රමානුකූල ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ සහ ආයෝජන ප්‍රවර්ධනය සමඟ ඉලෙක්ට්‍රොනික කේන්ද්‍රස්ථානයක් බවට පත්වීමට ශ්‍රී ලංකාවට ඇති හැකියාව පෙන්නුම් කරයි. එක්සත් ජනපද-චීන වෙළඳ යුද්ධය සහ ගෝලීය චිප් හිඟය මධ්‍යයේ, ශ්‍රී ලංකාව ආකර්ශනීය විකල්ප නිෂ්පාදන ස්ථානයක් විය හැකිය. විශේෂයෙන් ගෝලීය අර්ධ සන්නායක වෙළඳපොල 2030 වන විට ඩොලර් ට්‍රිලියන 1 දක්වා ළඟා වනු ඇතැයි පුරෝකථනය කර ඇත. වියට්නාමය සහ කාම්බෝජය මෙන්ම ගෝලීය නිෂ්පාදනයේ සන්දර්භය තුළ GMVC හි නැවත සකස් කිරීම වඩාත් මෑතකදී ඉන්දියාව දැනටමත් සිදු කර ඇති ආකාරයෙන් දැනට ක්‍රියාත්මක වන උපායමාර්ගික ක්‍රියාවලියෙන් ශ්‍රී ලංකාව ප්‍රතිලාභ ලබා ගැනීමට හොඳින් ස්ථානගත වී ඇත.  මෑතකදී Apple සඳහා ප්‍රධාන කොන්ත්‍රාත් නිෂ්පාදකයා වන Foxconn, iPhones එකලස් කිරීම සඳහා වෙන්නායි හි කර්මාන්ත ශාලාවක් ආරම්භ කළේය. මෙය එක්සත් ජනපද-චීන සබඳතාවයට ප්‍රතිචාර වශයෙන්, එහි එකලස් කිරීමේ පදනම ලෙස චීනය මත පමණක් යැපීම අඩු කිරීමේ Foxconn උපායමාර්ගික පියවරේ කොටසකි.

## ඇඟලුම් අංශයේ සාර්ථකත්වය තවදුරටත් ඉහළ නැංවීම

1970 දශකයේ අග භාගයේ ලිබරල්කරණ ප්‍රතිසංස්කරණවලින් පසුව, ශ්‍රී ලංකාවේ ඇඟලුම් කර්මාන්තය නවීන, තරඟකාරී අංශයක් බවට පත් වූ අතර, Multi-Fibre Arrangement යටතේ කෝටා ආරක්ෂණය 2004 අහෝසි කිරීමෙන් පසුව පවා එය දියුණු විය. එය දළ දේශීය නිෂ්පාදිතයට 5%කට වැඩි දායකත්වයක් සපයන අතර සමස්ත වෙළඳ භාණ්ඩ අපනයනයෙන් 40%කට වැඩි දායකත්වයක් සපයමින්, සෘජුවම සේවකයන් 350,000කට වඩා රැකියා සපයයි. වර්තමානයේ ඇඟලුම් නිෂ්පාදනය සඳහා භාවිතා කරන රෙදි වලින් 60% ක් පමණ දේශීයව නිෂ්පාදනය කෙරේ. වසර ගණනාවක් පුරා මෙම කර්මාන්තය විසින් ඇඟලුම් වටිනාකම් දාමයේ ඉහළ කෙළවරේ පොහොසත් පාරිභෝගික පදනමක් වර්ධනය කර ගත් අතර, එය සම්මත පිරිමි කමිස සහ කලිසම් යන 'මූලික ඇඟලුමේ' lingerie iy intimate wear යන 'විලාසිතා මූලික' ඇඟළුම් දක්වා විකාශනය වී ඇත. එය දැන් පැළඳිය හැකි තාක්ෂණය සහ තවත් බොහෝ දේ සමඟ වඩාත් නවීනත්වය කරා ගමන් කරයි.  මෙම ක්‍රියාවලියේදී විශාල ඇඟලුම් සමාගම් සන්නාම හිමිකරුවන්ගේ නිර්මාණ කණ්ඩායම් සමඟ සමීපව කටයුතු කිරීම සඳහා තමන්ගේම නිර්මාණ මධ්‍යස්ථාන පිහිටුවා ඇත. බොහෝ විශාල සමාගම් පරිගණක ආශ්‍රිත නිෂ්පාදන සහ ඉලෙක්ට්‍රොනික සවි කිරීම්වල ද නිරත වේ. කෙසේ වෙතත්,ශ්‍රී ලංකාවේ ඇඟලුම් අංශයේ අඛණ්ඩ වර්ධනය සහ ගෝලීය තරඟකාරිත්වය සඳහා මුහුණ දීමට ශක්තිමත් ප්‍රතිපත්ති සහ නායකත්ව කැපවීමක් අවශ්‍ය වන සැලකිය යුතු අභියෝගවලට මුහුණ දෙයි.

[15] REFERENCE

[16] Prema-chandra, Athokorale, "Rethinking Sri Lanka's Industrial Strategy" 2023.

## උසස් තාක්ෂණය

ශ්‍රී ලංකාවේ අපි අපේ තරුණ තරුණියන් සඳහා නිර්මාණය කිරීමට බලාපොරොත්තු වන අනාගතය ඔවුන් ජීවත් වීමට ප්‍රිය කරන එකකි. ඔවුන්ට නව ක්ෂේත්‍රවල වැඩ කිරීමට හෝ ව්‍යවසායකයන් වීමට, ධනය ඇති කිරීමට, ජීවිතය භුක්ති විඳීමට සහ යහපත කිරීමට හැකි ස්ථානයකි. මෙම දේශය ගෝලීය තාක්ෂණයේ සහ නවෝත්පාදනයේ කේන්ද්‍රස්ථානයක් බවට පත් කිරීමට අපි සෑම උත්සාහයක්ම ගන්නෙමු. අපගේ රජය විසින් ඉදිරි වසර පහ ඇතුළත ශ්‍රී ලංකාව මීළඟ Google" Samsung හෝ Tesla හි උපන් ස්ථානය බවට පරිවර්තනය කිරීමට අපගේ තරුණ තාක්ෂණික ව්‍යවසායකයින්ට උපරිම සහාය දක්වන්නෙමු.

අපි තොරතුරු තාක්ෂණයෙන් ඔබ්බට වෙනත් ක්ෂේත්‍ර ගණනාවකට තාක්ෂණය කෙරෙහි අවධානය යොමු කරන්නෙමු, එය කෘෂිකාර්මික ක්ෂේත්‍රය නම්; ක්ෂේත්‍ර අධීක්ෂණයේ සිට ආහාර සැපයුම් දාමය ජෛව තාක්ෂණය සහ ෂ භාවිතයෙන් ගොවිතැන වඩාත් කාර්යක්ෂම කිරීම, ජෛව තාක්ෂණයේ දී නම්; මිනිස් සෞඛ්‍යය වැඩි දියුණු කිරීමට අදහස් කරන නව නිෂ්පාදන ක්‍රම සහ ජීවීන් සංවර්ධනය කිරීම සඳහා ජීව විද්‍යාව භාවිතා කිරීම, නැනෝ තාක්ෂණයේ දී; නැනෝ පරිමාණයෙන් පරමාණු සහ අණු හැසිරවීමෙන් ව්‍යුහයන් සහ උපාංග සැලසුම් කිරීම, නිෂ්පාදනය කිරීම සහ භාවිතා කිරීම හෝ පැළඳිය හැකි තාක්ෂණය; උපාංග ලෙස පැළඳිය හැකි, ඇඳුම්වල තැන්පත් කළ හැකි, පරිශීලකයාගේ සිරුරේ තැන්පත් කළ හැකි, හෝ සම මත ඒච්චදද ලෙස කොටා ගත හැකි ඉලෙක්ට්‍රොනික උපාංග නිෂ්පාදනය කිරීමට සහ තවත් බොහෝ නවෝත්පාදන ක්ෂේත්‍ර ද වේ. ඵලදායිතාව කිහිප ගුණයකින් වැඩි කිරීම සඳහා තාක්ෂණය භාවිතා කරන තවත් බොහෝ ක්ෂේත්‍ර ද තිබේ.

අපට ප්‍රයෝජන ගත හැකි තවත් වැදගත් අවස්ථාවක් වන්නේ අපගේ ග්‍රැෆයිට් විභවය අගුළු හැරීමයි. ශ්‍රී ලංකාව ලෝකයේ පිරිසිදුම ඉල්ලම් ග්‍රැෆයිට් ඇති අතර එහි සංශුද්ධතාවය 99% කි. ඓතිහාසික වශයෙන් ප්‍රමුඛ සැපයුම්කරුවෙකු වුවත් වර්තමානයේ එහි නිෂ්පාදනය ගෝලීය වෙළඳපොලෙන් 1%කට වඩා අඩුය. මෙම අධි-පිරිසිදු ග්‍රැෆයිට්, ඉලෙක්ට්‍රොනික උපකරණ, ඉදිකිරීම් ද්‍රව්‍ය, තීන්ත, ප්ලාස්ටික්, ජල පිරිපහදු කිරීම සහ ලිහිසි තෙල් වැඩි දියුණු කරන ද්‍රව්‍යයක් වන ග්‍රැෆීන් නිෂ්පාදනය සඳහා වඩාත් සුදුසු වේ. ග්‍රැෆීන්ට ලිතියම්-අයන බැටරිවල ආයු කාලය දීර්ඝ කිරීමට සහ ආරෝපණ කාලය වේගවත් කිරීමටද හැකිය. අමු ග්‍රැෆයිට් ඉහළ වටිනාකමින් යුත් ග්‍රැෆීන් බවට සැකසීමෙන් ශ්‍රී ලංකාවට මෙයින් ප්‍රයෝජන ගත හැකිය. ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ ආයතනය (SLINTEC) ග්‍රැෆීන් තාක්ෂණය පිළිබඳ දේශීය ආරම්භකයන් සමඟ සහයෝගයෙන් කටයුතු කරයි. අගය එකතු කරන ලද සැකසුම්, තිරසාර භාවිතයන් සහ ප්‍රධාන ග්‍රැෆීන් පාරිභෝගිකයින් සමඟ හවුල්කාරිත්වය කෙරෙහි අවධානය යොමු කිරීම නව වෙළඳපල විවෘත කර විශ්වාසදායක සැපයුම්කරුවෙකු ලෙස ශ්‍රී ලංකාවේ ස්ථාවරය තහවුරු කළ හැකිය. සැපයුම් තීරණාත්මක ද්‍රව්‍ය භාවිතය පිළිබඳ නීති සම්පාදනය කිරීම සහ වගකිවයුතු භාවිතයන් ප්‍රවර්ධනය කිරීම මගින් අපගේ රජය මෙම පරිවර්තනයට පූර්ණ සහාය ලබා දෙනු ඇත.

### ස්වයංක්‍රීය ප්‍රවාහනය, ගුවන් සේවා සහ රොබෝ තාක්ෂණය සඳහා සිතියමට ශ්‍රී ලංකාව ඇතුළත් කිරීම.

"පසුගිය වසර කිහිපය තුළ, Qbits හි අපි පර්යේෂණ හා සංවර්ධනයේ සැලකිය යුතු දියුණුවක් ලබා ඇත්තෙමු. අපගේ අති නවීන පද්ධතිය ඩ්‍රෝන යානාවලට අභ්‍යන්තර කැමරා භාවිතයෙන් ස්වයංක්‍රීය තීරණ ගැනීමට ඉඩ සලසයි. මෙම ඩ්‍රෝන යානාවලට සංකීර්ණ පරිසරයන් තුළ සම්පූර්ණයෙන්ම තනිවම ගමන් කළ හැකි අතර weaving between trees and manoeuvring through narrow spaces වැනි හැකියාවන්ද ඇත. අපගේ මීළඟ පියවර වන්නේ මෙම ඩ්‍රෝන යානා රළු භූමි ප්‍රදේශවල වේගය වේගවත් සහ මන්දගාමී කරමින් ඉක්මන් තීරණ ගනිමින් අධික වේගයෙන් ක්‍රියා කිරීමට වැඩි දියුණු කිරීමයි. මීට අමතරව, ඩ්‍රෝනයට අවහිර මාර්ගයක් හමු වුවහොත්, එය භූමිය පිළිබඳ පූර්ව දැනුමකින් තොරව පවා නැවත විශ්ලේෂණය කර එහි ගමන් මග වෙනස් කරයි. අපගේ ඇල්ගොරිතමය visual odometry" sensor fusion" localization and mapping" obstacle detection" and path planning ඇතුළුව තීරණාත්මක කාර්යයන් හසුරුවයි. මෙම හැකියාවන් ඊළඟ පරම්පරාවේ ඩ්‍රෝන යානා සහ අභ්‍යන්තර AI සහිත රොබෝ සඳහා අත්‍යවශ්‍ය වේ. අපගේ පද්ධතිය අප විසින් නිර්මාණය කර සංවර්ධනය කරන ලද custom carrier board මත ධාවනය වේ. එය 2 GHzට ආසන්න වේගයකින් ක්‍රියාත්මක වන CUDA cores 384ක්, Tensor cores 48ක්, 6-core CPU එකක් සහ TOPs 21කින් සමන්විත ආකර්ෂණීය අභ්‍යන්තර සැකසුම් බලයක් ඇත. ආචාර්ය හර්ෂ සුබසිංහ, තාක්ෂණ ව්‍යවසායක CodeGen, AiGrow" Vega" ChargeNet" Qbits ආදියෙහි නිර්මාතා (අවසර සහිතව ප්‍රකාශනය කර ඇත)

| මැදිහත්වීම | කාලරාමුව |
|---|---|
| **ස්ථාවර වෙළඳ සහ ආයෝජන ප්‍රතිපත්තිය:** | M |
| ☎ අපගේ දැක්ම වන්නේ ශ්‍රී ලංකාවේ ආර්ථිකය ගෝලීය නිෂ්පාදන ජාලයන් වෙත අවශ්‍ය ආරක්ෂාව සමඟ ඒකාබද්ධ කිරීමයි. මේ අනුව, අපි මෙම උපාය මාර්ගයට කැපවී නිෂ්පාදිත අපනයන දිරිගැන්වීම සඳහා ස්ථාවර ප්‍රතිපත්ති සන්නිවේදනය කරන්නෙමු. එකී ප්‍රතිපත්ති සංශෝධනය කිරීමට පෙර සියලුම පාර්ශවකරුවන් සමඟ උපදේශන ක්‍රියාවලියක් මෙයට ඇතුළත් විය යුතුය.<br>☎ බදු දිරිගැන්වීම් ප්‍රධාන වශයෙන්ම රටකට ආයෝජන තීරණ ගෙන එන්නේ නැති බවත්, කලාපය තුළ ශ්‍රී ලංකාව තරඟකාරී වීමට නම්, කාලානුරූපී සහ නිශ්චිත දිරිගැන්වීම් අවශ්‍ය බවත් අපි තේරුම් ගනිමු. සෘජු විදේශ ආයෝජන ආකර්ෂණය කර ගැනීම සඳහා දිරිගැන්වීමේ පැකේජයක් ලබා දීමට අපගේ රජය සහතික විය යුතුය. Advance capital allowances සමහර විට 300% දක්වා ලබා ගත හැක.<br>☎ දැනට පවතින් අගය එකතු කිරීම් (value addition) පිළිබඳ ප්‍රතිපත්තියෙන් සැලකිය යුතු ලෙස ඉවත්වීමකදී අපි අවම (30%) අගය එකතු කිරීමේ අවශ්‍යතාවය ඉවත් කර ඒ වෙනුවට භාග " fraction value addition" පිළිගනිමු. GMVC ඒකාබද්ධ කිරීමට අපගේ ව්‍යවසායකයින්ට බාධා කරන යල්පැන ගිය භාවිතයන් අපට දිගටම පවත්වාගෙන යා නොහැක. Taking into consideration the unique nature of the gem and jewellery industry, we shall arrive at a meaningful method of dealing with the import of rough stone and tax on profits.<br>☎ මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයේ ඇති සුවිශේෂී ස්වභාවය සැලකිල්ලට ගනිමින්, රළු ගල් ආනයනය කිරීම සහ ලාභ මත බදු සම්බන්ධයෙන් කටයුතු කිරීමේ අර්ථවත් ක්‍රමවේදයකට අපි එළඹෙමු.<br>☎ අපනයන නිෂ්පාදකයින් සඳහා අතරමැදි යෙදවුම් කඩිනමින් ප්‍රසම්පාදනය කිරීම සඳහා සඳහාතීරු බදු සහන පහසුකම් (duty rebate facilities) නැවත වරක් සුමට ලෙස ක්‍රියාත්මක කිරීමට අපේ රජය කඩිනම් පියවර ගනු ඇත.<br>☎ ගොඩනැගිලි සහ කර්මාන්ත ශාලා පුළුල් කිරීමට අවශ්‍ය ඉදිකිරීම් ද්‍රව්‍ය සහ ඊට අදාළ අනෙකුත් ද්‍රව්‍ය සඳහා වන'සෘණ ලැයිස්තු' (Negative list) සීමා කිරීම් සහ ආරක්ෂණවාදී ක්‍රියාමාර්ග (වීර් ඒරසමේ) ප්‍රකාශිත සැලැස්මක් මත ඉවත් කරනු ලැබේ. (වෙළඳ ප්‍රතිපත්තිය 6.1 පරිච්ඡේදයේ වඩාත් සවිස්තරාත්මකව විස්තර කර ඇත) | |
| **විදේශ ආයෝජන ආකර්ෂණය කර ගැනීම සහ අලෙවිකරණ කාර්ය මණ්ඩලයේ ධාරිතාව වර්ධනය කිරීම** | S M L |
| ☎ ලොව පුරා සිටින ආයෝජකයින් ආකර්ෂණය කර ගැනීම සඳහා ආයෝජන ප්‍රවර්ධන ව්‍යාපාරයක් සිදු කිරීමට ද අපි අවධාරණය කරන්නෙමු. භූ දේශපාලන වාසි සහ නැගී එන ගෝලීය දේශපාලන පෙළගැස්ම මත ශ්‍රී ලංකාවට FID ලැබීම ප්‍රවර්ධනය කිරීමට සහ ඔවුන් ක්‍රියා කරන රටවල ඒ සඳහා වෙළඳපල සෙවීමට සම්බන්ධයෙන් දූත මණ්ඩල ප්‍රධානීන් හෝ ජ්‍යෙෂ්ඨ රාජ්‍ය තාන්ත්‍රිකයින් සඳහා 'ආර්ථික රාජ්‍ය තාන්ත්‍රිකත්වය' පිළිබඳ සති 18 ක මාර්ගගත සහ භූමියේ (දූත මෙහෙයුම් සිදු කරන රාජ්‍යයේ) වැඩසටහනක් විදේශ අමාත්‍යාංශය, මුදල් අමාත්‍යාංශය, වාණිජ දෙපාර්තමේන්තුව (හෝ ජාත්‍යන්තර වෙළඳාම සඳහා නව කාර්යාලය), ආර්ථික කොමිසම සහ මහ බැංකුවේ සහයෝගීතාවයෙන් හාවඩ් විශ්ව විද්‍යාලයේ කෙනඩි පාසලේදී ආරම්භ කෙරේ.(මෙම වැඩසටහන 2017 දී ආරම්භ කරන ලද නමුත් පසුව එය නතර විය.)<br>☎ විදේශීය ආයෝජකයින් සඳහා ශ්‍රී ලංකාවේ ආයෝජනය ආකර්ශනීය කිරීම සඳහා 'ගෝල්ඩන් වීසා වැඩසටහනක්' හඳුන්වා දෙනු ලැබේ: අවම ආයෝජන සීමාවකට යටත්ව වසර 10ක් දක්වා දීර්ඝ කාලීන පදිංචිය සඳහා වීසා.<br>☎ GMVC ආයෝජන ප්‍රවර්ධනය කිරීම අරමුණු කර ගනිමින් උසස් තත්ත්වයේ නිෂ්පාදකයෙකු ලෙස අපගේ ප්‍රතිරූපය ගොඩනැගීම සඳහා රජයේ ආයෝජන ප්‍රවර්ධන ව්‍යාපාරයට ශ්‍රී ලංකාවේ සාර්ථක විදේශ ආයෝජන සමාගම්වල ජ්‍යෙෂ්ඨ විධායකයින් සම්බන්ධ කර ගැනීමේ වැඩසටහනක් සකස් කෙරේ. | |

| මැදිහත්වීම | කාලරාමුව |
|---|---|
| ☎ දේශපාලන හේතූන් මත චීනයෙන් පිටවන ආයෝජන ශ්‍රී ලංකාවේ සිදුකිරීමට ආරාධනා කිරීම සඳහා හැකි ඉහළම දේශපාලන මට්ටමින් යුතු විශේෂ ඒකකයක් ස්ථාපිත කළ යුතුය. | |
| **ආර්ථික කොමිසමේ ඉන්දියාව සහ චීන ඒකක**<br>☎ GMVC තුළ ඒකාබද්ධ වීම සඳහා ඉන්දියාවෙන් සහ චීනයෙන් ඍෂ ලබා ගැනීම සඳහා සුවිශේෂී ඒකක දෙකක් ඌ හි පිහිටුවනු ලැබේ. සම්පූර්ණ EPZ පිහිටුවීමේ සිට පවතින නිෂ්පාදන ජාලයන් සමඟ ඒකාබද්ධ වීම දක්වා ක්ෂේත්‍ර කිහිපයක් හමුවීමට ඔවුන්ට ණජෂි ලබා දෙනු ඇත. ඉදිරි වසර කිහිපය සඳහා දකුණු ඉන්දියාව ඉලක්කම් දෙකකින් වර්ධනය වීමට (grow at double digit levels) නියමිත බැවින් දකුණු ඉන්දියාව පදනම් කරගත් GMVC සමඟ ඒකාබද්ධ වීමට සැලකිය යුතු විභවයක් ඇත. චයිනා මර්චන්ට් හම්බන්තොට වරායට යාබද හම්බන්තොට කර්මාන්ත කලාපය හිස්ව පවතී. මෙම කලාපයට චීන ඍෂ සෙවීම සඳහා චීන ඒකකයට විශේෂ අධිකාරියක් (special authority) ලබා දෙනු ඇත. | S M |
| **Port city - කොළඹ**<br>☎ Port city ආර්ථික කොමිෂන් සභාව (PCEC) දැන් සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක වන අතර PCEC පනත බොහෝ දුරට ක්‍රියාත්මක වේ. කෙසේ වෙතත්, Port city වෙත ඍෂ ගෙන ඒම නොසලකා හැර ඇත. මෙම තත්ත්වය නිවැරදි කළ යුතුය. ඒ සඳහා, සාකච්ඡා කරන ලද වෙළඳ සහ ආයෝජන ප්‍රතිපත්ති සංශෝධනවලට අමතරව මෙම අභියෝගාත්මක කාර්යය භාර ගැනීම සඳහා PCEC වෙත නිවැරදි කාර්ය මණ්ඩලයක් බඳවා ගැනීම අපි සහතික කරමු. ඔවුන්ට වරාය නගරයට පිටතින් ඇති ව්‍යාපාර හානි කිරීමකින් තොරව මෙය ප්‍රවර්ධනය කිරීමට සිදුවනු ඇත.<br>☎ PCEC පනතට දැනට පවතින බාධා ඉවත් කිරීම සඳහා අවශ්‍ය සංශෝධන අපි සිදු කරන්නෙමු. සේවා සඳහා විශේෂ ආර්ථික කලාපයක් වශයෙන් පෝර්ට් සිටිය ආසියානු කලාපීය තාක්ෂණික මධ්‍යස්ථානයක් බවට පත් කිරීමට අපි අපේක්ෂා කරමු.<br>**ගෝලීය ආයෝජකයින්ගේ අවස්ථාවන්ට සහභාගී වීම සහ ඒවා සඳහා සත්කාරකත්වය සැපයීම.** මූල්‍ය ශක්තිය ඇති තැනැත්තන් පමණක් ආයෝජනය ගැන සලකා බලයි. එබැවින් ශ්‍රී ලංකාවට ආයෝජකයින් ගෙන ඒම සඳහා අප විසින් නිරන්තරයෙන් විදේශයන්හි සිදු වන එවැනි අවස්ථාවන්ට සහභාගී වීම සහ එවැනි අවස්ථාවන්ට සත්කාරකත්වය දැක්වීම සිදුකළ යුතුය. උදාහරණයක් ලෙස, පසුගිය මැයි මාසයේදී ලන්ඩනයේ පැවති ඨකදශ්ක Wealth Conference සඳහා බිලියනපතියන් 250 කින් සහභාගී වූ අතර අවසානයේ ඩොලර් බිලියන 18 ක් ආයෝජනය කර ඇත. ඒ හා සමාන අවස්ථාවන් සංවිධානය කිරීමට අපි සැලසුම් කරමු. | S M |
| **ශ්‍රී ලංකාව ව්‍යාපාර කිරීමට සුදානම් සහ උනන්දු බව ලෝකයට ප්‍රදර්ශනය කිරීම:**<br>'Ease of doing Business index' නවතා දමා ඇති බැවින්, එය නව දර්ශකයකින් ප්‍රතිස්ථාපනය කර වඩා හොඳ තත්ත්වයකට පැමිණීමට අපි මෙය අවස්ථාවක් කර ගනිමු. මේ සඳහා අපි වඩාත් නිවැරදි ව්‍යවසායකත්ව දත්ත සමඟ ලෝක බැංකුව විසින් පෝෂණය කරන 'Global Entrepreneurship Monitor' හි කොටසක් වීමට කමිටුවක් සකස් කරමු. මෙමගින් අපට ශ්‍රී ලංකාවේ ව්‍යවසායකත්වය පිළිබඳ වඩා හොඳ අවබෝධයක් ලැබෙනු ඇති අතර මෙම දත්ත ව්‍යවසායක සංස්කෘතියක් වැඩිදියුණු කිරීම සඳහා ප්‍රතිපත්ති සම්පාදනය පොහොසත් කරනු ඇත. මෙම සම්බන්ධිත ජාලය ශ්‍රී ලාංකේය ව්‍යවසායකයින්ට (විශේෂයෙන් ආරම්භක) ජාත්‍යන්තර අරමුදල් වෙත ප්‍රවේශ වීමට අවස්ථාව සලසා දෙනු ඇත (Angel අරමුදල් ආදිය,) | S M |

| මැදිහත්වීම | කාලරාමුව |
|---|---|
| **වෙළඳ ලිහිල්කරණය සහ නිදහස් වෙළඳ ගිවිසුම්:** අපගේ අවධානය යොමු වන්නේ වෙළඳ සහ ආයෝජන ප්‍රතිපත්ති ඒකපාර්ශ්වික ලිහිල්කරණය කෙරෙහි ය. ඒවා ද්විපාර්ශ්වික හෝ බහුපාර්ශ්වික නිදහස් වෙළඳ ගිවිසුම් (FTA) වලට වඩා උසස් බව අපි විශ්වාස කරමු.<br><br>☎ කෙටිකාලීනව අපි නිදහස් වෙළඳ ගිවිසුම් කිහිපයක් සම්බන්ධයෙන් දැනටමත් ආරම්භ කර ඇති සාකච්ඡා අඛණ්ඩව පවත්වාගෙන යන්නෙමු. නමුත් එහිදී අපි ස්ථිරව හා කැපවී සිටින්නේ ඔවුන් දෙපාර්ශවයටම සාධාරණ අන්‍යෝන්‍ය ප්‍රතිලාභයක් ගෙන එන්නේ නම් පමණි. අපි විශාල රටවල් සමඟ අසමමිතික පදනමක් මත සාකච්ඡා කරන්නෙමු. මෙම සාකච්ඡා සඳහා අපගේ උනන්දුව පෙන්වීම කිරීම සඳහා අපගේ රජය හැකි උපරිම සම්පත් යොදවනු ඇත. වාණිජ දෙපාර්තමේන්තුවේ පුහුණු කාර්ය මණ්ඩලය සමඟ ඇති ගැටළු පිළිබඳව අපි දැනුවත්ව සිටින අතර ධෂම හි පවතින දක්ෂතා අවශෝෂණය කර ප්‍රයෝජනයට ගැනීමට අපි වග බලා ගන්නෙමු.<br><br>☎ EU සහ UK සමග විස්තීර්ණ වෙළඳ ගිවිසුම් සඳහා සාකච්ඡා ආරම්භ කිරීමෙන් EU GSP¬ සහ UK DCTS අහිමි වීම සඳහා අපි සූදානම් වෙමු. (6.1 පරිච්ඡේදයේ වෙළඳ ලිහිල්කරණය හි වැඩිදුර තොරතුරු දක්වා ඇත.) | S M |
| **පර්යේෂණ සහ සංවර්ධනය:** අපි තොරතුරු යුගයේ සිට දැනුම් යුගයට සංක්‍රමණය වෙමින් නව තාක්ෂණික යුගයක හිණිපෙත්තේ සිටිමු. ලෝකය සරල යෙදුම්වල සිට බුද්ධිමත් ඉදවී  වෙත, ස්ථිතික වෙබ් අඩවිවල සිට ගතික AI-ධාවන අන්තර්ක්‍රියා දක්වා සහ සාම්ප්‍රදායික CPU වල සිට විශේෂිත AI චිප් දක්වා ගමන් කරන විට, සෑම කර්මාන්තයක්ම පෙර නොවූ විරූ පරිවර්තනයක් සඳහා සූදානම් වේ. ස්වයංව රිය පදවන කාර් (Self-driving cars), EVTOL, පියාඹන කාර් සහ බුද්ධිමත් ස්වයංක්‍රීය රොබෝවරු තවදුරටත් අනාගතය පිළිබඳ සිහින නොව ක්ෂිතිජයේ යථාර්ථයන් වේ. Humanoids සහ දියුණු AI පැමිණීම අපගේ ලෝකය තවදුරටත් විප්ලවීය වෙනසකට භාජනය කරනු ඇත. නිෂ්පාදන ආශ්‍රිත පර්යේෂණ සහ පුහුණුව සඳහා අපි විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතනවලට අරමුදල් සපයන්නෙමු. අපි පර්යේෂණ සහ නවෝත්පාදන සඳහා ආයතනික සහ හොඳින් ඉලක්ක කරගත් දිරිගැන්වීම් ලබා දෙන්නෙමු. | M |
| ☎ SLINTEC මාදිලියේ රාජ්‍ය සහ පෞද්ගලික අංශයන් සම්බන්ධීකරණය වූ වාණිජකරණයට සම්බන්ධ පර්යේෂණ සාර්ථක යැයි අප විශ්වාස කරන නමුත් එයට වැඩිමනත් සහයෝගයක් අවශ්‍ය වේ. SLINTEC ඔවුන්ගේ පර්යේෂණ කළඹ (portfolio) පුළුල් කිරීමට සහ තවත් එවැනි දෙමුහුන් (hybrid) ආයතන කිහිපයක් පිහිටුවීමට අවශ්‍ය පරිදි තවදුරටත් සම්පත් සැපයීමට අපි කටයුතු කරන්නෙමු.<br><br>☎ පර්යේෂණ, සංවර්ධන සහ හඳුනාගත් නිපුණතා පුහුණුව තුළ නිෂ්පාදන වත්කම් (productive assets) සඳහා 200% දක්වා වැඩි දියුණු කළ ප්‍රාග්ධන දීමනාවක් (capital allowance) ලබා දීමෙන් තාක්ෂණ සමාගම් සඳහා පර්යේෂණ සහ සංවර්ධනය සඳහා ශක්තිමත් පදනමක් සකස් කිරීම අපගේ සැලසුමයි. නවෝත්පාදන සහ ස්වයංක්‍රීයකරණය (automation) සඳහා අවශ්‍ය ආයෝජන ප්‍රවර්ධනය කිරීම සඳහා පවතින සහ නැගී එන තාක්ෂණික කර්මාන්තය සඳහා මූලික වන බුද්ධිමය දේපළ අයිතිවාසිකම් සඳහා වන මැඩ්රිඩ් ප්‍රොටෝකෝලය (Madrid Protocol) වෙත ප්‍රවේශ වීම අපි වේගවත් කරමු. (Madrid Protocol යනු තම මව් රටෙන් පිටත වෙළඳ ලකුණු ලියාපදිංචි කිරීම සඳහා වන ගෝලීය යාන්ත්‍රණයකි. එය වෙළඳ ලකුණුවලට (Trade marks) ජාත්‍යන්තර පිළිගැනීම සහ ආරක්ෂාව සහතික කිරීමට උත්සාහ කරන සමාගම් විසින් දරනු ලබන කාලය, අපහසුතාවය සහ පිරිවැය අඩු කරයි.) | |
| **පරිපාලනය සහ සම්බන්ධීකරණය වැඩි දියුණු කිරීම:**<br><br>අදාළ රාජ්‍ය දෙපාර්තමේන්තු සහ ආයතනවල, විශේෂයෙන්ම අලුතින් පිහිටුවන ලද ආර්ථික කොමිෂන් සභාව (කලින් BOI), දේශීය ආදායම්, රේගු සහ අපනයන සංවර්ධන මණ්ඩලය සහ අපනයන නිෂ්පාදන කර්මාන්තයේ ක්‍රියාකාරිත්වයට අදාළ අනෙකුත් ආයතනවල පරිපාලන කාර්‍යපටිපාටි සම්බන්ධීකරණය කිරීම සඳහා ශක්තිමත් යාන්ත්‍රණයක් අපි ස්ථාපිත කරමු. කාර්යක්ෂමතාව සහ විනිවිදභාවය වැඩි දියුණු කිරීම සඳහා ඩිජිටල්කරණය භාවිතා කිරීම.මේ සඳහා ජාතික තනි කවුළුවක් (National Single Window) හැකි ඉක්මනින් නිර්මාණය කිරීම අපගේ අරමුණයි. | M L |

| මැදිහත්වීම | කාලරාමුව |
|---|---|
| **නැව්ගත කිරීම ලිහිල් කිරීම (Liberalization of shipping')**<br><br>නාවුක කර්මාන්තය ලිහිල් කිරීම පිළිබඳ විවාදය බොහෝ කාලයක් තිස්සේ පවතී. මේ සම්බන්ධයෙන් තීරණයක් ගෙන අප ඉදිරියට යා යුතුය. . FDI entrance policy හි දක්වා ඇති පරිදි නියෝජිතායතනයේ සහ ඒ ආශ්‍රිත ව්‍යාපාරවල නියමිත අවම ආයෝජනයක් සිදුකිරීමට යෝජනා කරන්නේ නම්, නැව් නියෝජිතායතන ව්‍යාපාරයේ කොටස්වලින් (equity) 50% කට වඩා වැඩි ප්‍රමාණයක් ප්‍රධානීන්ට (principals) ලබා දීම සඳහා නැව් නියෝජිතායතන බලපත්‍ර පනත සංශෝධනය කිරීම පිළිබඳව අපි නැව් ව්‍යාපාරයේ සියලුම පාර්ශවකරුවන් සමඟ අවසාන වටයේ සාකච්ඡාවක නිරත වෙමු. දැනට පවතින නියෝජිතායතන ව්‍යාපාරයට සෘණාත්මක බලපෑමක් ඇති නොකර ජාත්‍යන්තර වෙළඳාම සඳහා තවදුරටත් කාර්යක්ෂමතාවයක් ඇති කිරීම මෙහි අරමුණයි. තවද, නැව් නියෝජිතායතනවලට ගෙවිය යුතු ගාස්තු නියාමනය කිරීමට වරාය ඇමැතිවරයාට බලය පැවරීමට නීති සංශෝධනය කිරීමට අපි විරුද්ධ වූයෙමු. තරඟයක් ගෙන ඒම සඳහා අපි මෙම නීති සංශෝධනය කරන්නෙමු. | S |

## 6.4 සේවා-ප්‍රධාන ආර්ථික ධාවකය

ශ්‍රී ලංකාවේ සේවා කර්මාන්තය තුළ සංචාරක, සැපයුම්, විදුලි සංදේශ සහ තොරතුරු තාක්ෂණ වැනි විවිධ ක්ෂේත්‍ර ඇතුළත් වන අතර එය ආර්ථිකයේ ප්‍රධාන භූමිකාවක් ඉටු කරයි. මේ අතරින්, තොරතුරු තාක්ෂණ/ඊජව් අංශය 2022 දී ජාතියේ සමස්ත අපනයන සඳහා 7.4% ක දායකත්වයක් ලබා දෙමින් වර්ධනයේ සහ නවෝත්පාදනයේ ප්‍රමුඛයා ලෙස ඉදිරියට පැමිණ ඇත. මෙම ප්‍රගතිය මෙසේ තිබියදීත්, ශ්‍රී ලංකාවේ තාක්ෂණික යටිතල පහසුකම් නොදියුණුව පවතින අතර,එමගින් අභියෝගයක් එල්ල කරන අතරම අවස්ථාවක් ද ඉදිරිපත් කරයි. ශ්‍රී ලංකාවේ ගතික (dynamic) සේවා කර්මාන්තය ගෝලීය ඩිජිටල් බලාගාරයක් බවට පරිවර්තනය කිරීම සමගි ජන බලවේග රජයක් අපේක්ෂා කරයි. දේශීය වෘත්තිකයන් ගෝලීය ගනුදෙනුකරුවන් සමඟ සම්බන්ධ වන කාර්යබහුල මාර්ගගත වෙළඳපොළක් සහ සංචාරකයින් නව්‍ය මාර්ගගත වේදිකා හරහා අත්දැකීම් වෙන්කරවා ගැනීම ගැන සිතා බලන්න. වෙබ් සංවර්ධකයින්, ග්‍රැෆික් නිර්මාණකරුවන්, දත්ත විශ්ලේෂකයින් සහ අනෙකුත් පුහුණු ශ්‍රමිකයින්ට ගෝලීය ඩිජිටල් ආර්ථිකයෙන් ප්‍රතිලාභ ලබා ගැනීමට අවස්ථාව ලැබේ. මෙමගින් නව රැකියා අවස්ථා, විශේෂයෙන්ම කාන්තාවන් සඳහා පමණක් නොව, ගෝලීය වෙළඳපොළට ශ්‍රී ලංකාව ඒකාබද්ධ කිරීමෙන් ආර්ථික වර්ධනයට ද එය හේතු වනු ඇත. මෙම දැක්ම සාක්ෂාත් කර ගත හැක්කේ ඩිජිටල් ලෙස සපයනු ලබන සේවාවන් සඳහා සමෘද්ධියමත් පරිසර පද්ධතියක් පෝෂණය කිරීමින් අපගේ ස්වාභාවික හා සංස්කෘතික වත්කම් අති නවීන තාක්ෂණය සමඟ ඒකාබද්ධ කිරීමෙනි.

### තොරතුරු තාක්ෂණ සහ ඊ-වාණිජ්‍යය (E-Commerce) දියුණු කිරීම

ජීවිතයේ ඉදිරියට යාමට තොරතුරු තාක්ෂණය ඉතා වැදගත් බව අපි පසුගිය වසර හතර තුළ විපක්ෂයේ සිට ඔප්පු කර ඇත්තෙමු. මෙය අප සිදුකලේ අපගේ සක්වලි වැඩසටහන මගින් සෑම පාසලකටම ස්මාර්ට් පන්ති කාමරයක් ස්ථාපිත කරමින් පාසල් 385කට දායකත්වය ලබා දීමෙනි. ගෝලීය වෙළෙඳපොළ තුළ ඇති අභියෝගවලට සාර්ථකව මුහුණ දීම සඳහා තොරතුරු තාක්ෂණ කුසලතාවලින් සිසුන් සන්නද්ධ කිරීමට අපගේ කැපවීම ප්‍රකාශ කල යුතුමය. ආර්ථිකය සම්බන්ධයෙන් ගත් කල, සෑම ස්ථානයකම පවතින DPI හඳුන්වාදීම ඊ-වාණිජ්‍යය සහ තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ දැවැන්ත අවස්ථා නිර්මාණය කරනු ඇත. මෙතෙක් ලබා ගත නොහැකි සේවාවන් ලබා ගැනීමට එමගින් හැකි වනු ඇත. මේවාට ප්‍රාදේශීය සභාව දක්වා රජයේ සෑම තරාතිරමකම රජයෙන් සපයන පුරවැසි සේවා සිය ගණනක් සහ, ව්‍යාපාර සහ ව්‍යාපාර සහ පාරිභෝගිකයින් අතර තවත් දහස් ගණනක් ඇතුළත් වේ. සීමාව විය යුත්තේ සිහින දැකීමේ හැකියාව පමණි.

ප්‍රතිපත්තිමය දෘෂ්ටිකෝණයකින් රෙගුලාසි සරල කිරීම, නවකයින් සඳහා බාධක අඩු කිරීම සහ ව්‍යාපාර සඳහා මෙහෙයුම් විධිමත් කිරීම වඩාත් තරඟකාරී භූ දර්ශනයක් නිර්මාණය කරනු ඇත. ජාත්‍යන්තර ප්‍රමිතිවලට අනුකූලව, විශේෂයෙන්ම ගෙවීම් සැකසීමේදී, පාරිභෝගික සහ වෙළඳ විශ්වාසය ඉහළ නංවමින්, ආරක්ෂිත, ගෝලීය වශයෙන් පිළිගත් ගෙවීම් ද්වාර ඒකාබද්ධ කිරීමට ශ්‍රී ලංකාවට හැකිය.

**අවසාන සැතපුම දක්වා බෙදාහැරීමේ සේවා සහ ජාත්‍යන්තර ප්‍රමිතියෙන් යුත් ගබඩා ඇතුළුව ජාතික සැපයුම් ජාලය වැඩිදියුණු කිරීම තරඟකාරිත්වය පවත්වා ගැනීම සඳහා අත්‍යවශ්‍ය වේ. රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වය හරහා ඊ-වාණිජ්‍යය අපනයන මධ්‍යස්ථාන (e-commerce Export Hubs) සංවර්ධනය කිරීම හරහා, නවෝත්පාදනය සහ කාර්යක්ෂමතාව පෝෂණය කරමින් උසස් යටිතල පහසුකම් සහිත සංකේන්ද්‍රිත ක්‍රියාකාරකම් කලාප (concentrated zones of activity) නිර්මාණය කරනු ඇත' 'ඩිජිටල් අපනයන ශූර යෝජනා ක්‍රමයි (Digital Export Champion Scheme) මගින් දේශීය ව්‍යාපාර ඩිජිටල් අලෙවිකරණය සහ ජාත්‍යන්තර පරිචයන් පිළිබඳව පුහුණු කරනු ලබන අතර, ඔවුන්ට ගෝලීය වෙළෙඳපොළ වෙත ඉහළ නැගීමට සහ ප්‍රවේශ වීමට එය උපකාරී වේ.**

**සමෘද්ධියමත් IT/BPM ආරම්භක පද්ධතියක් පෝෂණය කිරීම ද වැදගත් වේ. ශ්‍රී ලංකාවේ ෂඛ-ඊඡඑ අංශය සැලකිය යුතු සහ වේගවත් වර්ධනයක් අත්කර ගෙන ඇති අතර, ආදායම ඇමරිකානු ඩොලර් බිලියන 1.3 ඉක්මවමින් පුද්ගලයින් 80,000 කට අධික සංඛ්‍යාවක් සේවයේ යොදවා ඇති අතර, ශ්‍රී ලංකාවේ සේවා අපනයන ආදායමෙන් 12%ක් සඳහා දායක වේ.**

**මෘදුකාංග සංවර්ධනය සහ දත්ත විශ්ලේෂණ වැනි අදාළ කුසලතා වලින් ශ්‍රම බලකාය සන්නද්ධ කිරීම සඳහා අධ්‍යාපනය සහ පුහුණුව සඳහා ආයෝජනය කිරීම ද ඉතා වැදගත් වේ. ආරම්භකයන්, ස්ථාපිත සමාගම්, අධ්‍යයන ආයතන සහ රාජ්‍ය ආයතන අතර සහයෝගීතාවය වර්ධනය කිරීම මගින්, ගෝලීය ඩිජිටල් ආර්ථිකයේ ප්‍රමුඛයා ලෙස ශ්‍රී ලංකාව ස්ථානගත කරනු ඇත.**

| මැදිහත්වීම | කාලරාමුව |
|---|---|
| **තාක්ෂණයේ නවෝත්පාදන සහ පර්යේෂණ සහ සංවර්ධනය දිරිමත් කිරීම:** උසස් තාක්ෂණය සඳහා වන මැදිහත්වීම්වලට අමතරව තොරතුරු තාක්ෂණ සහ ඊ-වාණිජ්‍ය කර්මාන්තයට මානව සම්පත් උත්තේජනය කිරීමට අපි නොමසුරුව සහාය ලබා දෙන්නෙමු. විශේෂයෙන්,<br>☎ නව්‍ය අදහස් සහ විසඳුම් සඳහා ජාතික මට්ටමේ තරඟ සහ අභියෝගතා දියත් කිරීමෙන් දක්ෂතා සෙවීමට සහ ආරම්භ කිරීමට සහාය ලබා දීම.<br>☎ ආරම්භක මධ්‍යස්ථාන පිහිටුවීමෙන් සහ ශිෂ්‍යයන් විසින් මෙහෙයවන ආරම්භක ව්‍යවසායන් ප්‍රවර්ධනය කිරීමෙන් අධ්‍යයන ආයතනවලට ව්‍යවසායකත්වය ඒකාබද්ධ කිරීම. ප්‍රායෝගික ව්‍යවසායකත්ව වැඩසටහන් පිළිබඳ කෙටි කාලීන පාඨමාලා නිර්මාණය කර ඒවායේ අවසාන දිනයේදී "ආයෝජක දිනයක්" සංවිධානය කර ශිෂ්‍ය ආරම්භකයන්ට ආයෝජකයන්ගෙන් "බටැක මෙබී" ලබා ගැනීම සඳහා  දේශීය හා විදේශීය විශ්ව විද්‍යාල අතර සහයෝගීතාව ගොඩනැගීමේ උත්සාහයන් දෙගුණ කරන්නෙමු.<br>☎ ආරම්භක සඳහා, මූලික අදහසේ සිට වරදච්දඑහවසබට දක්වා සහ ඉන් ඔබ්බට විස්තීරණ සහය ලබා දීම.<br>☎ නවෝත්පාදන ශක්‍ය ව්‍යාපාර බවට පරිවර්තනය කිරීමට පහසුකම් සැලසීම සඳහා තාක්ෂණ ව්‍යාපාර ඉන්කියුබේටර් (technology business incubators) නිර්මාණය කරන්න.<br>☎ දේශීය මෘදුකාංග සංවර්ධනය සහ දැනටමත් පවතින මෘදුකාංග සමාගම් සංවර්ධනය කිරීමට දිරිගැන්වීම් ලබා දීම, ප්‍රගතිය නිරීක්ෂණය කිරීම සහ ඒ අනුව දිරිගැන්වීම් අලුත් කිරීම. | S M |

## ශ්‍රී ලංකාව සැපයුම් මධ්‍යස්ථානයක් බවට පත් කිරීම

**කොළඹ සහ ත්‍රිකුණාමලයේ ගැඹුරු ජලය ඇති වරායන් සහිත ශ්‍රී ලංකාවේ උපායමාර්ගික පිහිටීම, අපගේ වෙරළේ සිට නාවික සැතපුම් 12 ක් තුළ ගෝලීය වෙළඳ පරිමාවෙන් 50% කට වඩා වැඩි ප්‍රමාණයක් ගමන් කරන බව සලකන විට ඉන්දියන් සාගරයේ සැපයුම් මධ්‍යස්ථානයක් බවට පත්වීමට එම කරුණු ඉමහත් විභවයක් ලබා දෙයි. කෙසේ වෙතත්, කොළඹ වරාය ගෝලීය වශයෙන් එහි තරඟකාරිත්වය පවත්වා ගැනීමට අරගල කරමින් සිටී: මේ සඳහා සැලකිය යුතු තාක්ෂණික පරිවර්තනයක් සහ උපායමාර්ගික සන්ධාන අවශ්‍ය වේ.**

**අපගේ දැක්ම වන්නේ ක්‍රියාවලි විධිමත් කිරීම, නිෂ්කාශන කාලය අඩු කිරීම සහ වරාය යටිතල පහසුකම් නවීකරණය කිරීම අරමුණු කරගත් ඩිජිටල් වරාය මුලපිරීම මගින් මෙහෙයවනු ලබන ශ්‍රී ලංකාව සැපයුම් බලාගාරයක් බවට පරිවර්තනය කිරීමයි. ප්‍රධාන ක්‍රියාවලි ස්වයංක්‍රීය කිරීම සහ අති නවීන තාක්ෂණයන් ඒකාබද්ධ කිරීම මගින් ශ්‍රී ලංකාවේ වරායන් ජාත්‍යන්තර නැව් මාර්ග වෙත වඩාත් ආකර්ශනීය කළ හැක. මීට අමතරව, ත්‍රිකුණාමලයේ ස්වාභාවික ගැඹුරු ජල වරාය පුළුල් කිරීමේ සැලකිය යුතු විභවයක් පවතින අතර,**

කොළඹ-ත්‍රිකුණාමලය ආර්ථික කොරිඩෝව (කඹෑක) මගින් ප්‍රධාන වරායන් සහ වෙළඳපල සමඟ නිෂ්පාදන මධ්‍යස්ථාන සම්බන්ධ කරන අත්‍යවශ්‍ය සාධකයක් ලෙස සංවර්ධනය කිරීමට සැලසුම් කර ඇත.

ප්‍රධාන නැව් සන්ධාන ආකර්ෂණය කර ගැනීම සඳහා, ශ්‍රී ලංකාව උපායමාර්ගික හවුල්කාරිත්වයන් ගොඩනගා ගත යුතු අතර ගෝලීය ජාල සමඟ වඩා හොඳින් ඒකාබද්ධ වීමට එහි පිරිනැමීම් (දෛරෙසබට) සකස් කළ යුතුය. අපි මෙම සන්ධාන සමඟ සහයෝගීතාවයට ප්‍රමුඛත්වය දෙන්නෙමු, ඔවුන්ගේ අවශ්‍යතා සහ උවමනා අවබෝධ කර ගැනීම සහ ස්මාර්ට් ගමන් පහසුකම් පද්ධති හරහා කාර්ය මණ්ඩලය සහ භාණ්ඩ ප්‍රවාහනය විධිමත් කිරීම ද සිදු කරන්නෙමු. ගෝලීය වටිනාකම් දාමයන් සමඟ ඒකාබද්ධ වීම පිළිබඳ සාකච්ඡාව මෙහිදී ද අදාළ වේ.

ශ්‍රී ලංකාව ඉන්දියන් සාගරයේ සමෘද්ධියමත් සැපයුම් මධ්‍යස්ථානයක් බවට පත් කිරීම සැලකිය යුතු ආදායමක් උත්පාදනය කරනවා පමණක් නොව ඉහළ වැටුප් සහිත රැකියා උත්පාදනය කිරීම, අපගේ ආර්ථිකය නංවාලීම සහ ගෝලීය සමුදීය භූ දර්ශනයේ ප්‍රධාන ධාවකයා ලෙස ශ්‍රී ලංකාවේ තත්ත්වය එමගින් ස්ථාවර කරනු ඇත.

## ආර්ථික වර්ධනය සඳහා සංචාරක කර්මාන්තය පුනර්ජීවනය කිරීම.

සංචාරක ව්‍යාපාරය ඓතිහාසික වශයෙන් ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ මුල් ගලක් වී ඇති අතර, එමගින් තුන්වන විශාලතම විදේශ විනිමය උපයන රට ලෙස ද ශ්‍රේණිගත කර ඇත. කෙසේ වෙතත්, Covid-19 වසංගත හා ආර්ථික අභියෝග හේතුවෙන් 2020 දී එය දැඩි පසුබෑමකට ලක්වූ අතර, සංචාරක සැපයුම් දාමය අඩාල විය. සංචාරක ව්‍යාපාරය පුනර්ජීවනය කිරීම සඳහා ශ්‍රී ලංකාව නැවත ගමනාන්ත සන්නාමකරණය (ෆිඑසබ්එසදබ රුඉර්බාසබට) සහ ඩිජිටල් පරිවර්තනය තුළින් වෙනස්කම්වලට භාජනය විය යුතුය.

සංචාරක කර්මාන්තය බලගැන්වීම සඳහා සංස්කෘතික උරුමයන්, ස්වභාවික සුන්දරත්වය සහ අද්විතීය අත්දැකීම් වැනි මිල පදනම් නොවන උපාය මාර්ග භාවිතා කිරීමට අපි කර්මාන්තයට උපකාර කරන්නෙමු. මේ මගින් රටට සුවිශේෂී අනන්‍යතාවයක් ඇති කර ගත හැකි අතර අව්‍යාජ සහ සැගවී ගිය අත්දැකීම් සොයන සංචාරකයින්ට ආරාධනා කළ හැකිය. ඉලක්කගත වෙළඳපල සමඟ සමගාමී වන උපාය මාර්ගික අලෙවිකරණ ව්‍යාපාර, කතන්දර කීම (story telling) සහ අත්දැකීම් සහිත සංචාරක අවස්ථා පිරිනැමීම් මෙයට ඇතුළත් වේ. විශේෂිත වෙළෙඳපොලවල් සඳහා පහසුකම් සැලසීම සහ අධ්‍යාත්මික සංචාරක, ආයුර්වේද සංචාරක, සහ සුවතා සංචාරක වැනි සුවිශේෂී සංචාරක අංශ සංවර්ධනය කිරීමෙන්, ශ්‍රී ලංකාවට අද්විතීය සහ පුද්ගලාරෝපිත (personalised) අත්දැකීම් සොයන ඉහළ වටිනාකමක් ඇති සංචාරකයින් ආකර්ෂණය කර ගත හැකිය. ඉහළ පිළිගත් ජාත්‍යන්තර සූදු සන්නාමයක් සහිත ශ්‍රී ලංකාවේ ප්‍රථම ඒකාබද්ධ නිවාඩු නිකේතනයත් සමඟ මෙරටට පැමිණෙන සංචාරකයින් සංඛ්‍යාවේ තවදුරටත් වර්ධනයක් අපේක්ෂා කළ හැකිය. කෙසේ වෙතත්, සියලුම කැසිනෝ සූදු නියාමකයක් යටතට ගෙන ඒම සහ ඊට අදාල නීති සම්පාදනය කර නොපමාව ක්‍රියාත්මක කළ යුතු බව අපගේ දැඩි ස්ථාවරයයි.

සංචාරක කර්මාන්තය සඳහා ඩිජිටල් පරිවර්තනයක් සිදුකිරීම අත්‍යවශ්‍ය වේ. මෙයට ඩිජිටල් විසඳුම් හරහා වීසා ක්‍රියාවලි විධිමත් කිරීම, දේශසීමා පාලනය සහ ආරක්ෂක පියවර යන අංග ඇතුළත් වේ. මීට අමතරව, ෂබඑැරබැඑ දෆ Things (IoT), කෘතිම බුද්ධිය (AI) සහ බ්ලොක්චේන් වැනි තාක්ෂණයන් උපයෝගී කරගනිමින් ස්මාර්ට් ගමනාන්ත සංවර්ධනය කිරීම හරහා සංචාරක ප්‍රවාහයන් කළමනාකරණය කිරීම, පුද්ගලාරෝපිත අත්දැකීම් නිර්මාණය කිරීම, සහ කාර්යක්ෂමව සම්පත් කළමනාකරණය සහතික කරයි. ඩිජිටල් ගෙවීම් පද්ධති පුළුල් ලෙස භාවිතා කිරීම ප්‍රවර්ධනය කිරීම හරහා මුදල් හුවමාරු කිරීමේ අවශ්‍යතාවය සහ ෛඑව ගාස්තු ඉවත් කිරීම මගින් සංචාරක අත්දැකීම වැඩිදියුණු කරනු ඇත. ශ්‍රම බලකාය සඳහා ඩිජිටල් කුසලතා පුහුණු වැඩසටහන් සඳහා ආයෝජනය කිරීම සහ සංචාරක ව්‍යාපාරය කේන්ද්‍ර කරගත් ආරම්භක ව්‍යාපාර(ඒ්රඑමච) සඳහා සහාය වීම ක්ෂේත්‍රය තුළ නවෝත්පාදනයන් පෝෂණය කරනු ඇත.

ශ්‍රී ලංකාවේ හෝටල් යටිතල පහසුකම් සාමාන්‍යයෙන් වයස වසර 15-20 පැරණි වන අතර, මාලදිවයින සහ තායිලන්තය වැනි කලාපීය ප්‍රතිවාදීන් සමඟ තරඟ කිරීමේදී මෙම අභියෝගවලට මුහුණ දීමට සිදු වෙයි. පහසුකම් නවීකරණය කිරීමට සහ තරඟකාරිත්වය වැඩි කිරීමට උපාය මාර්ගික ආයෝජන අවශ්‍ය වේ. එසේම, පාරිසරික සංචාරක ව්‍යාපාරය (eco-tourism) කෙරෙහි ඇති ගෝලීය ප්‍රවණතාවය හඳුනා ගනිමින්, තිරසාර සංචාරක භාවිතයන්හි ප්‍රමුඛයා වීමේ හැකියාව ශ්‍රී ලංකාවට ඇත. පරිසර හිතකාමී සංචාරක ව්‍යාපාර ප්‍රවර්ධනය කිරීම සහ වගකීම් සහගත පාරිසරික භාවිතයන් සහතික කිරීම මගින් ශ්‍රී ලංකාව සවිඥානික සංචාරකයින් සඳහා ඉහළම ගමනාන්තයක් ලෙස ස්ථානගත කිරීම අපගේ අරමුණයි.

| මැදිහත්වීම | කාලරාමුව |
|---|---|
| **සංචාරක කර්මාන්තය ප්‍රතිසංස්කරණය කිරීම** | |
| **රෙගුලාසි:** ක්ෂේත්‍රයේ ආරම්භකයින් (startups) සහ සංචාරක කර්මාන්තයේ තාක්ෂණය මත පදනම් වූ සමාගම් සඳහා ප්‍රවේශ බාධක ඉවත් කිරීම සඳහා රෙගුලාසි ප්‍රතිසංස්කරණය කිරීම: විශේෂයෙන්ම ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය (SLTDA) යටතේ ව්‍යාපාර ලියාපදිංචිය සඳහා දැඩි අවශ්‍යතා සංශෝධනය කිරීම. | S |
| **මූල්‍ය සහය:** සංචාරක කර්මාන්තය සදහා ඉහළ අදියර 3 යටතේ ණය ලබා දී ඇති හෙයින්, බැංකු විසින් ණය සහන දීමනා හෝ පැරේට් ක්‍රියාමාර්ග ආරම්භ කිරීමේදී මෙම ප්‍රධාන විදේශ විනිමය උත්පාදන අංශය සඳහා විශේෂ සැලකිල්ලක් දැක්වීමට අපි සැලසුම් කරමු. මෙම දේපලවල "debt to equity swaps" සඳහා නීති සංශෝධනය කිරීමට ද අපි සැලසුම් කරමු. | S |
| **යටිතල පහසුකම් ආයෝජනය:** උසස් තත්ත්වයේ අත්දැකීම් ලබා දීම සහතික කිරීම සඳහා සංචාරක කර්මාන්තයේ නවීකරණය, නවාතැන් වැඩිදියුණු කිරීම් සඳහා දිගු කාලීන ආපසු ගෙවීමේ කොන්දේසි සහිත දිගු කාලීන අරමුදල් සක්‍රීය කිරීමට අපි කටයුතු කරන්නෙමු. | M |

## 6.5 ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍යම ප්‍රමාණයේ ව්‍යවසාය (MSMEs) සහ ආරම්භකයින් (START-UPS)

ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍යම ප්‍රමාණයේ ව්‍යවසාය (MSMEs) ශ්‍රී ලංකාවේ ආර්ථිකයට අත්‍යවශ්‍ය වන අතර, ව්‍යවසායන්ගෙන් 80% කින් පමණ එය සමන්විත වන අතර, දළ දේශීය නිෂ්පාදිතයට 52% ක දායකත්වයක් සපයන අතර, රැකියාවලින් 45% ක් සපයයි. ඔවුන්ගේ මෙතරම් වැදගත්කම තිබියදීත්, ශ්‍රී ලංකාවේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය ප්‍රධාන වශයෙන් අවිධිමත් ලෙස ක්‍රියාත්මක වන අතර, වර්ධනය සහ තරඟකාරිත්වය අඩාල කරන විවිධ අභියෝගවලට ද මුහුණ දෙයි. අපගේ දැක්ම නවෝත්පාදනය, වර්ධනය සහ රැකියා උත්පාදනය පෝෂණය කරන විශිෂ්ට වීඑෘ පද්ධතියක් නිර්මාණය කිරීම කෙරෙහි අවධානය යොමු කරයි. මෙයට වීඑෘ සංවිධිත කාර්මික අංශවලට සම්බන්ධ වටිනාකම් දාමයන් වෙත ඒකාබද්ධ කිරීම, වෙළඳපල ප්‍රවේශය වැඩි දියුණු කිරීම, තාක්ෂණ හුවමාරුව සහ ධාරිතාව ගොඩනැගීම ඇතුළත් වේ.

වීඑෘ වල ඵලදායිතාව සහ ගෝලීය තරඟකාරිත්වය වැඩිදියුණු කිරීම සඳහා අපි වෘත්තීය අධ්‍යාපනය සහ පුහුණු වැඩසටහන් ප්‍රතිසංස්කරණය කරන්නෙමු. පුහුණු පහසුකම් වැඩිදියුණු කිරීම, කර්මාන්තයේ ප්‍රවීණයන් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම සහ ආධුනිකත්ව සහ රැකියා පුහුණුව සඳහා හවුල්කාරිත්වයන් ඇති කිරීම මෙයට ඇතුළත් වේ. ජනගහනයෙන් 50%කට වැඩි කාන්තාවන් සිටියද ඔවුන් නියෝජනය කරන්නේ ව්‍යවසායකයින්ගෙන් 25%ක් පමණි. ධාරිතා වර්ධනය, මූල්‍ය ප්‍රවේශය සහ ජාලකරණ අවස්ථා තුළින් වීඑෘ වල කාන්තාවන්ට සහ තාරුණ්‍යට සහාය වීම සඳහා විශේෂ මුලපිරීම් හඳුන්වා දෙනු ලැබේ.

MSME අංශය මුහුණ දෙන මූල්‍ය ගැටලු සහ සමගි ජන බලවේග රජයක් යටතේ යෝජිත විසඳුම් පිළිබඳ සාකච්ඡාව 2.3 (NPL) අර්බුදය සමඟ කටයුතු කිරීමේදී මූල්‍ය ස්ථාවරත්වය සහතික කිරීම) හි ඇත. කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ට මෙන්ම අනෙකුත් අයටද 'සංවර්ධන බැංකුකරණය' පිළිබඳ ගැටලුව 9.3 හි විස්තර කර ඇත (ප්‍රාග්ධනය: ගලා ඒම ඉහළ නැංවීම සහ දේශීය ණය වෙළෙඳපොළ ශක්තිමත් කිරීම). ඉහත කරුණු වලින් ඔබ්බට අපි පහත මැදිහත්වීම් සැලසුම් කරමු:

☎ **පරාටේ ක්‍රියාත්මක කිරීම් අත්හිටුවීම දීර්ඝ කිරීම**

2024 දෙසැම්බර් 15 වැනි දින සිට තවත් මාස 6කට පරාටේ ක්‍රියාත්මක කිරීම අත්හිටුවීම අපි සැලසුම් කරමු. ඉන්පසුව, ණය අයකර ගැනීමේ ශේෂයක් සහ ව්‍යවසාය සහාය මත පදනම්ව, නෛතික හා මූල්‍ය ව්‍යුහයන් ඇතුළත් අර්බුදයට ස්ථිර විසඳුමක් සඳහා මූල්‍ය ආයතන සහ භාණ්ඩාගාරය සමඟ එක්ව කටයුතු කරන්නෙමු.

## ආරම්භකයන් (Startups) සඳහා විප්ලවයක් නිර්මාණය කිරීම

අපගේ අනාගත රජය තුළ ව්‍යවසායකත්වය පෝෂණය කිරීම ආර්ථික වර්ධනයට සහ රැකියා උත්පාදනයට කේන්ද්‍රීය වනු ඇත.මෙහිදී තීරනාත්මක සම්පත් දෙකක් කෙරෙහි අවධානය යොමු කරමින් ශ්‍රී ලංකාව තුළ් ඒරවමව විප්ලවයක් ඇති කිරීමට අපි සැලසුම් කරමු.එම සම්පත් නම් කුසලතා සහ අරමුදල් ය. අරමුදල් අගුළු හැරීම සඳහා අපි Angel අරමුදල් වැනි මුල්-අදියර ආයෝජන සඳහා ප්‍රවේශය වැඩි දියුණු කරන අතර ප්‍රාග්ධනය සහ දක්ෂ ව්‍යවසායකයින් ආකර්ෂණය කර ගැනීමට ප්‍රතිපත්ති සාදන්නෙමු. අපි ශක්තිමත් නිෂ්පාදනයක් සහ බුද්ධිමය දේපල (IP) පද්ධතියක් සංවර්ධනය කරන්නෙමු, IP සහ පේටන්ට් බලපත්‍ර නීති වැඩිදියුණු කරන අතර විදේශ ආයෝජන ඇද ගැනීමට හිතකර බදු සහ නියාමන රාමුවක් ස්ථාපිත කරන්නෙමු.

විදේශීය ආයෝජකයින් සඳහා බදු බැර කිරීම් සඳහා ද්විත්ව බදු වැළැක්වීමේ ගිවිසුම් (DTAA) භාවිතා කිරීමට අපි ඔවුන්ට හැකියාව ලබා දෙන්නෙමු. අතිරේක වශයෙන්, ද්විත්ව බදුකරණය ඉවත් කිරීම සහ carried interest එක capital gains ලෙස වර්ගීකරණය කිරීම මගින් VC අරමුදල් කළමනාකරණය සඳහා ඉහළ වෘත්තිකයන් ආකර්ෂණය කර ගැනීම සඳහා අපි නීති ප්‍රතිසංස්කරණය ගෙන එන්නෙමු. මෙම ප්‍රවේශය ශ්‍රී ලංකාව ආරම්භක ආයෝජන සහ VC ක්‍රියාකාරකම් සඳහා දියුණු මධ්‍යස්ථානයක් ලෙස ස්ථාපිත කරනු ඇත.

| මැදිහත්වීම | කාලරාමුව |
|---|---|
| **ව්‍යවසායකත්ව අධ්‍යාපනය:** වෘත්තීය සහ උසස් අධ්‍යාපන ආයතනවලට ව්‍යවසායකත්ව විෂයමාලා හඳුන්වා දීම. උපදේශකත්වය සහ මග පෙන්වීම ලබා දීම සඳහා සාර්ථක ව්‍යවසායකයින් සහ කර්මාන්ත නායකයින් සමඟ සම්බන්ධ වීම. තාක්ෂණික සහ මූල්‍ය සාක්ෂරතාව ඉහළ නැංවීම සඳහා "ග්‍රාමීන් බැංකුවේ ගම්මාන දුරකථන වැඩසටහන" වැනි සාර්ථක වැඩසටහන්වලින් පසු ආදර්ශ මුලපිරීම්.<br><br>**මූල්‍ය අවහිර කිරීම ඉවත් කරන්න:** අපි සම්ප්‍රදායික මූල්‍ය ප්‍රභවයන්ගෙන් ඔබ්බට ගොස් නව අරමුදල් ප්‍රභවයන් නිර්මාණය කිරීම සඳහා නීති සංශෝධනය කරන්නෙමු. | M |
| Tailored Financial Products<br><br>☎ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් (SMEs) සඳහා විශේෂිත ණය නිෂ්පාදන සහ කොටස් මූල්‍යකරණ විකල්පයන් (equity financing) නිර්මාණය කිරීමට මූල්‍ය ආයතන සමඟ කටයුතු කරන්න.<br><br>☎ ඉහළ වර්ධනයක් සහිත ව්‍යාපාර ප්‍රාග්ධන (VC) පද්ධතියක් නිර්මාණය කිරීම සඳහා (සාර්ථක ආරම්භයක් සහිත ව්‍යවසායකයන් සිටින බොහෝ රටවලට එවැනි යාන්ත්‍රණ ඇත), ආයෝජකයින් වෙත ආපසු ලබා දෙන ඉතිරි ශේෂය සමඟ ප්‍රභවයෙන් බදු අඩු කිරීමට VC වලට ඉඩ සලසන බදු අවසර පත්‍ර ඇතුළත් නව ව්‍යුහයන් පිළිබඳව රජයට උපදෙස් දීම සඳහා විශේෂ කාර්ය සාධක බලකායක් පිහිටුවීමට අපි සැලසුම් කරමු. | M |
| **'දේශීය දේ මිලට ගන්න' ව්‍යාපාරය:** ජාත්‍යන්තර වශයෙන් තරඟකාරී වීමට උදවු කරන අතරම දේශීයව හිමිකාරත්වයක් සහිත ව්‍යාපාර ප්‍රවර්ධනය කිරීම සහ සහාය දීම සඳහා ව්‍යාපාරයක් දියත් කිරීම. | S M |
| **දේශීය මූලාශ්‍ර සඳහා දිරි දීමනා** (Incentives for Local Sourcing)**:** දේශීය කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ගෙන් ප්‍රභවයන් සඳහා රාජ්‍ය ආයතන සහ විශාල සමාගම් සඳහා දිරිගැන්වීම් සහ preferential procurement policies පිරිනමන්න. | M |
| **මූල්‍ය සාක්ෂරතා ප්‍රවර්ධනය:** මූල්‍ය සාක්ෂරතාව සහ වගකීම් සහිත ආයෝජන භාවිතයන් වැඩිදියුණු කිරීම සඳහා අධ්‍යාපනික ව්‍යාපාර සහ වැඩමුළු පැවැත්වීම. | M |
| **දේශීය කොටස් හුවමාරුව:** කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට හිමිකරු ප්‍රාග්ධනය (equity capital) රැස් කිරීමට, නවෝත්පාදනයට සහය වීමට සහ කලාපීය ආර්ථික සංවර්ධනය උත්තේජනය කිරීමට වේදිකාවක් සැපයීම සඳහා, කොළඹ කොටස් වෙළෙඳපොළ තුළ දේශීය හුවමාරුවක් ස්ථාපිත කිරීම. ලැයිස්තුගත කිරීමේ ක්‍රියාවලිය සරල කර දේශීය හිමිකාරිත්වය, සාධාරණ වැටුප් සහ තිරසාර ප්‍රමිතීන් සඳහා නිර්ණායක සැකසීම. | M L |
| **මූල්‍ය ප්‍රවේශය වැඩි දියුණු කිරීම:** ඇපකර අවශ්‍යතා සහ ඉහළ පොලී අනුපාත ආමන්ත්‍රණය කිරීමෙන් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා මූල්‍ය ප්‍රවේශය වැඩි දියුණු කිරීම. හිතකර කොන්දේසි යටතේ පුද්ගලික ආයෝජන ප්‍රවර්ධනය කිරීම සහ සෘජු විදේශ ආයෝජන ආකර්ෂණය කර ගැනීම සඳහා ක්ෂේත්‍රය ශක්තිමත් කිරීම සඳහා සංශෝධිත ක්ෂුද්‍ර මූල්‍ය පනතක් ක්‍රියාත්මක කිරීම. | M |

## 6.6 හරිත සංවර්ධනය: දේශගුණික ක්‍රියාකාරී යෝජනාවලිය

**අපගේ හරිත සෞභාග්‍ය වැඩසටහන හරහා තිරසාර ශ්‍රී ලංකාවක් අපි අපේක්ෂා කරමු. අපගේ උපාය මාර්ගයේ හරය වන්නේ දේශගුණික විපර්යාස බලපෑම් සඳහා වන ජාතික අනුවර්තන සැලැස්ම** (National Adaptation Plan (NAP) **දෙර** Climate Change Impacts) **වේ.එහිදී අවදානමට ලක්විය හැකි ප්‍රජාවන් ආරක්ෂා කිරීම සහ තිරසාර සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා ශක්තිමත් අනුවර්තනයක් සහ ඔරොත්තු දීමේ හැකියාවක් ගොඩනැගීම මෙම සැලැස්ම අවධාරණය කරයි.**

**අපගේ ප්‍රවේශය වන්නේ දේශීය ප්‍රජාවන් සහ පෞද්ගලික අංශය ඒකාබද්ධ කරමින්** blue carbon credits **සහ ජාත්‍යන්තර අරමුදල් භාවිතා කරමින් දේශගුණයට ඔරොත්තු දෙන යටිතල පහසුකම් සඳහා සහාය වීමයි.** NAP **මගින් පුනර්ජනනීය බලශක්තියට ප්‍රමුඛත්වය දීම, සම්පත් වෙන් කිරීම ප්‍රශස්ත කිරීම සහ සියල්ල ඇතුළත් වර්ධනය ප්‍රවර්ධනය කිරීම කෙරෙහි අවධානය යොමු කරන අතරම අධ්‍යාපනය සහ වෘත්තීය පුහුණුව තුළින් මානව ප්‍රාග්ධනය වැඩි දියුණු කිරීමද එයට ඇතුළත් වේ. එය ක්‍රියාත්මක කිරීමෙන් ආයෝජන ආකර්ෂණය කර ගැනීම, රැකියා උත්පාදනය කිරීම සහ තිරසාර සංවර්ධනය සහතික කිරීම අපගේ අරමුණයි.**

| මැදිහත්වීම | කාලරාමුව |
|---|---|
| **වැඩිදියුණු කළ පාලනය:** NAP සඳහා ජාතික කේන්ද්‍රස්ථානය ලෙස දේශගුණික විපර්යාස ලේකම් කාර්යාලය ශක්තිමත් කිරීම, ආංශික (sectoral) සහ හරස් කැපීමේ (cross-cutting) ක්‍රියා සඳහා යාන්ත්‍රණ සංවර්ධනය කිරීම. | M L |
| **නවෝත්පාදන අරමුදල්:** දේශගුණික අනුවර්තන ව්‍යාපෘති සඳහා CSR අරමුදල් ආකර්ෂණය කර ගැනීම සඳහා රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්ව භාර අරමුදලක් ස්ථාපිත කිරීම සහ දේශගුණික මුලපිරීම්වලට සහාය වීම සඳහා ඊකමෑ ඪ්රඉදබ කරාසවී උත්තේජනය කිරීම. | M L |

# 07 රාජ්‍ය අංශය කළමනාකරණය සහ ඩිජිටල්කරණය

## 7.1 රාජ්‍ය අංශය ප්‍රතිසංස්කරණය කිරීම

සෞඛ්‍ය, අධ්‍යාපනය සහ සමාජ සේවා යන අංශයන්හි කාර්යක්ෂම සහ සාධාරණ මහජන සම්පාදනය ආර්ථික සංවර්ධනයේදී සහ සිවිල් ආරක්ෂාවේදී සඳහා ඉතා වැදගත් වේ. මෙම සේවාවන් සැපයීමේ වගකීම ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශය සතුය. එහෙත් එය මිලියන 1.5 කට ආසන්න සේවකයින් පිරිසක් සිටින දැවැන්ත අංශයක් වුවද, අතිච්ඡාදනය වන භූමිකාවන් (overlapping roles), අතිරික්ත සේවකයන් සහ අඩු ගෙවීම් වලින් පීඩා විඳියි. රාජ්‍ය ප්‍රසම්පාදනයේ සිට සේවා සැපයීම දක්වා දූෂණ සහ වගවීමේ ගැටළු විසඳීමට දශක ගනනාවක ප්‍රතිසංස්කරණ අපොහොසත් වී ඇත. රාජ්‍ය අංශය සදහා බඳවා ගැනීම් සඳහා දේශපාලන මැදිහත්වීම් බොහෝ විට මැතිවරණ පොරොන්දු මගින් මෙහෙයවනු ලබන අතර, මහා පරිමාණ සේවක පිරිසක් ඇතිවීම සඳහා එය හේතු වී ඇත, රාජ්‍ය අංශයේ රැකියා හිමිකම් පිළිබඳ හැඟීමක් ඇති කරයි, එහි ප්‍රතිඵලයක් ලෙස සමහර විට සම්පූර්ණයෙන්ම අසාධාරණ ඉල්ලීම් සඳහා වැඩ වර්ජන සහ අකුරට වැඩ කිරීම් සිදු කරයි.

නායකත්වයෙන් පටන් ගෙන රාජ්‍ය අංශයේ වැඩ සංස්කෘතියේ සම්පූර්ණ ප්‍රතිසංස්කරණයක අවශ්‍යතාවය පවතී. ඛණ්ඩනය සහ අතිරික්තය අවම කිරීම සඳහා කැබිනට් මණ්ඩලය සහ අමාත්‍යාංශ විධිමත් කිරීම පළමු පියවරකි. දළ වශයෙන් අමාත්‍යාංශ 27ක තාර්කික ව්‍යුහගත කිරීමක් අපි යෝජනා කරමු. අනුපිටපත් (duplications) සහ අනවශ්‍ය නිලධාරී සම්බන්ධතා ඉවත් කිරීම සහ අමාත්‍යාංශ සහ නියෝජිතායතන අතර සම්බන්ධීකරණය වැඩිදියුණු කිරීම මගින් කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සහ වියදම් හා නාස්තිය අවම කරනු ඇත.

පරිපාලන ප්‍රතිසංස්කරණ ඇතුළත් කිරීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ විෂය පථය පුළුල් කිරීම සහ ස්වාධීන නියාමන ආයතන ශක්තිමත් කිරීම, අධීක්ෂණය සහ කළමනාකරණය සඳහා අත්‍යවශ්‍ය වේ. ධෘ සහ විශ්‍රාම වැටුප් ප්‍රතිසංස්කරණ මෙම උත්සාහයට සහාය වනු ඇත. ඉතා ඉහළ ගෙවීම් අනුපාත සහිත අරමුදල් නොලබන රාජ්‍ය අංශයේ විශ්‍රාම වැටුප් තවදුරටත් තිරසාර නොවන අතර රාජ්‍ය අංශය සඳහා පමණක් නොව ජාතික මට්ටමින් අරමුදල් සපයන විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම වෙත ගමන් කළ යුතුය.

| මැදිහත්වීම | කාලරාමුව |
| --- | --- |
| **රාජ්‍ය අංශයේ බඳවා ගැනීම්:** රාජ්‍යය, සන්නද්ධ හමුදාවන් සහ රාජ්‍ය ව්‍යවසායයන් හරහා පුද්ගල අවශ්‍යතා පිළිබඳ පුළුල් විගණනයක් සිදු කිරීම. ඕනෑම පහළ මට්ටමේ බඳවා ගැනීමක් දැනට පවතින රාජ්‍ය සේවක සංඛ්‍යාවෙන් (හරිත පත්‍රයෙන්) බඳවා ගැනීමට ප්‍රමුඛත්වය දිය යුතුය. ආරක්ෂක වියදම් නැවත පරීක්ෂා කිරීම සහ නැවත තක්සේරු කිරීම. | S |
| KPIs: සාර්ථකත්වය මැනීමට සහ කාර්ය සාධනය වැඩි දියුණු කිරීමට රාජ්‍ය අංශය සඳහා ප්‍රතිඵල මත පදනම් වූ ණාෂෂ සංවර්ධනය කරන්න. | M |
| **ධාරිතා ගොඩනැගීම:** රඳවාගෙන සිටින රාජ්‍ය අංශයේ සේවකයින්, විශේෂයෙන් ඉහළ මට්ටමේ කාර්ය මණ්ඩලය සඳහා ධාරිතා ගොඩනැගීමේ නියැලීම සහ මධ්‍ය වෘත්තිකයන් රාජ්‍ය සේවා භූමිකාවන් සඳහා බඳවා ගැනීමේ යාන්ත්‍රණයන් ස්ථාපිත කිරීම. | M |
| **මූල්‍ය කළමනාකරණය:** රාජ්‍ය අංශය මුදල් පදනම් ගිණුම්කරණයේ සිට උපචිත පදනම් ගිණුම්කරණය වෙත ක්‍රමානුකූලව මාරු කිරීම. | L |

## 7.2 රාජ්‍ය අංශය ඩිජිටල්කරණය සඳහා මුලපිරීම

ඩිජිටල්කරණය දැනට පවතින තත්ත්වයට වඩාත්ම ප්‍රතිඵලදායී විසඳුම වේ.එමගින් කාර්යක්ෂමතාව ඉහළ නැංවීම, දූෂණය අවම කිරීම සහ සේවා ප්‍රතිපාදන පිරිවැය අඩු කිරීම සිදුකළ හැකිය. මෙම ඉතුරුම් මගින් වැඩිදියුණු කළ සේවා සැපයීම සමඟ ඒකාබද්ධව, පුරවැසියන් මත බදු බර අඩු කළ හැකි අතර, ආර්ථික ප්‍රකෘතිය සහ තිරසාර වර්ධනයක් ඇති කළ හැකිය. රාජ්‍ය අංශයේ ප්‍රතිසංස්කරණ සම්බන්ධ කරමින් වඩාත් ප්‍රතිචාරාත්මක, වගවීමක් සහිත සහ කාර්යක්ෂම රජයක් නිර්මාණය කිරීම සඳහා මූල්‍ය වගකීම් සහ ආර්ථික ඔරොත්තු දීමේ හැකියාව සඳහා ඩිජිටල්කරණය ක්‍රියාත්මක කිරීම අත්‍යවශ්‍ය වේ.

ඩිජිටල් පොදු යටිතල පහසුකම් (The Digital Public Infrastructure (DPI)) සඳහා මුලපිරීම මෙම පරිවර්තනය සඳහා කේන්ද්‍රීය වන අතර, එමගින් 'Lanka Stack' නමින් විවෘත API කට්ටලයක් නිර්මාණය කිරීම අරමුණු කර ගෙන ඇත. මෙම අන්තර් ක්‍රියාකාරී වේදිකාව පොදු යහපත පිණිස ක්‍රියා කරනු ඇති අතර, රාජ්‍ය සහ පෞද්ගලික අංශයන්ට පුරවැසියන්ගේ වන විවිධ දෛනික ගැටලු විසඳීමට වැඩසටහන් එකිනෙක මත තැබීමට එමගින් ඉඩ සලසයි.

DPI සංරචක තුනකින් සමන්විත වනු ඇත: එක් එක් පුද්ගලයාගේ අනන්‍යතාව සත්‍යාපනය කළ හැකි හඳුනාගැනීමක්; වටිනාකම (ගෙවීම්) මාරු කිරීමට සහ ලැබීමට ඇති හැකියාව; සහ පුද්ගලික දත්ත කැමැත්තෙන් බෙදාගැනීම වේ.

DPI මගින් රාජ්‍ය අංශයේ සම්පූර්ණ පරිවර්තනයක් සිදු කරනු ඇත. පුද්ගල රෙජිස්ට්‍රාර්වරයාගෙන් පටන්ගෙන, DPI වේදිකාව රජය, ව්‍යාපාර සහ පුරවැසියන් අතර සෑම ගනුදෙනුවක් සඳහාම මූලික අතුරු මුහුණත බවට පත්වනු ඇත. මෙහි මුල් සේවාවන් වනුයේ නිවාස සඳහා සියලු වර්ගවල රාජ්‍ය අනුග්‍රහය සඳහා මුදල් ලබා දීම සඳහා සුබසාධන ප්‍රතිලාභ මණ්ඩලය සමඟ කාර්යක්ෂම සමාජ ආරක්ෂණ ජාල බෙදාහැරීමේ මොඩියුලයක් ක්‍රියාත්මක කිරීම, සහ බදු, ගාස්තු, දඩ ඇතුළු සියලු වර්ගවල රාජ්‍ය ගාස්තු ගෙවීමේ ක්‍රම ආදිය වේ. එක් එක් ගැටළුව සඳහා වෙන වෙනම විසඳුම් වෙනුවට, බෙදාගත් තාක්ෂණික සංරචක විවිධ යෙදුම් හරහා නැවත භාවිතා කරනු ඇත.

ඉන්දියාවේ 'ආධාර් වැඩසටහනේ ආභාෂය ඇතිව, අපි පළමුව ආදායම් එකතු කිරීම, ප්‍රතිලාභ මාරු කිරීම සහ පොදු ප්‍රසම්පාදනය තුළ දූෂණය තුරන් කිරීම සඳහා විශේෂාංග ක්‍රියාත්මක කරන්නෙමු. ෘෂෂ වැලඳ ගැනීම කාර්යක්ෂම, ආරක්ෂිත දත්ත හැසිරවීම, සේවා බෙදා හැරීම වැඩිදියුණු කිරීම සහ කැමැත්ත මත පදනම් වූ දත්ත හුවමාරුව හරහා පුරවැසියන්ගේ පෞද්ගලිකත්වය ආරක්ෂා කරයි. ඩිජිටල්කරණයට ප්‍රමුඛත්වය දීම හරහා රාජ්‍ය අංශය අති නවීන තාක්ෂණය සමඟ පෙළගස්වන අතර,එමගින් ශ්‍රී ලංකාවේ පාලනය වඩාත් ඵලදායී, විනිවිදභාවයෙන් යුතු සහ දූෂණයට එරෙහිව ඔරොත්තු දෙනනක් බවට පත් කරයි.

DPI සහ Lanka Stack පුද්ගලික දත්ත හුවමාරු කර ගැනීම, පෞද්ගලිකත්ව ආරක්ෂාව සහතික කිරීම සහ බාධාවකින් තොරව මූල්‍ය අන්තර්ක්‍රියා සක්‍රීය කිරීම සඳහා කැමැත්ත මත පදනම් වූ පද්ධතියක් බවට පරිණාමය වනු ඇත. අවසානයේදී, එය දිනපතා මිලියන සංඛ්‍යාත ජනතාවක් අතර පුළුල් පරාසයක රාජ්‍ය සහ පුද්ගලික ගනුදෙනු සඳහා සහාය වනු ඇත; එය ඔබේ නිවසේ වාඩි වී වාහන ලියාපදිංචිය සඳහා ගෙවීමේ සිට, ප්‍රදර්ශනාගාරයෙන් පිටවීමට පෙර රූපවාහිනියක් මිලදී ගැනීමට බැංකුවක් සමඟ සාකච්ඡා කිරීම දක්වා විහිදී යනු ඇත.

DPI යොදා ගැනීම හරහා, අපි ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශය පරිවර්තනය කිරීම, සේවා සැපයීම වැඩිදියුණු කිරීම සහ විනිවිද පෙනෙන, වගවීම සහ කාර්යක්ෂම පාලන පද්ධතියක් නිර්මාණය කිරීම අරමුණු කරමු.

කෘතිම බුද්ධිය (AI) උත්තේජනය කිරීම ද මෙහිදී වැදගත් වේ. AI හි ප්‍රධාන ලක්ෂණයක් වන්නේ රටා (patterns) හඳුනා ගැනීමට සහ විශාල දත්ත කට්ටල වලින් ප්‍රතිඵල පුරෝකථනය කිරීමට ඇති හැකියාවයි. මෙමගින් රාජ්‍ය අංශයේ දත්ත වඩාත් සවිස්තරාත්මක විශ්ලේෂණයක් කිරීමට, ප්‍රවණතා හඳුනා ගැනීමට, ප්‍රතිඵල අපේක්ෂා කිරීමට සහ සාක්ෂි පදනම් කරගත් ප්‍රතිපත්ති සංවර්ධනය කිරීමට රජයන්ට ඉඩ සලසයි. තත්කාලීන දත්ත සහ පුරෝකථන විශ්ලේෂණ සැපයීමෙන්, ෂ හට රාජ්‍ය ප්‍රතිපත්තිවල සඵලතාවය සැලකිය යුතු ලෙස ඉහල නැංවිය හැක.

### සෞඛ්‍ය සේවා අංශයේ ඩිජිටල් නවෝත්පාදනය: 1990 සුව සැරිය

1990 සුවසැරිය ශ්‍රී ලංකාවේ රාජ්‍ය සේවාවන්හි ඩිජිටල්කරණයේ පරිවර්තනීය බලය සඳහා කදිම නිදසුනකි. එහි සාර්ථකත්වයට කේන්ද්‍රීය වන්නේ හදිසි අවස්ථා සඳහා ලබා ගත හැකි වේගවත්ම ගිලන්රථය යෙදවීමට අති නවීන ඇල්ගොරිතමවල බාධාවකින් තොරව ඒකාබද්ධ කිරීමයි,එය සමීපත්වයට වඩා වේගය සහ කාර්යක්ෂමතාවයට ප්‍රමුඛත්වය දෙයි. මෙම ප්‍රවේශය 1990 සුවසැරිය ගෝලීය වශයෙන් වඩාත්ම ඩිජිටල් දියුණු සහ වේගවත්ම ගිලන්රථ සේවාවක් ලෙස ලෝක බැංකුවේ පිළිගැනීමක් ලබා ඇත (ටකදශ්‍රකකහ (Innovating for Better Health" Saving Lives( Sri Lanka's Ambulance Story" Martin Raiser" Vice President දෙර South Asia, March 2024).) ඒ සඳහාම වෙන්වූ යෙදවුමක් හරහා වැදගත්ම ස්ථාන ලුහුබැඳීමේ තාක්ෂණය (advanced location tracking technology) භාවිතා කිරීම හදිසි සේවා ඉක්මන් සහ නිවැරදිව යැවීමට හැකි වන පරිදි ඇමතුම්කරුවන්ගේ ස්ථාන නිවැරදිව හඳුනා ගැනීම සහතික කරයි.

එපමනක් නොව, 1990 සුව සැරිය මෙහෙයුම් සූදානම සඳහා වූ කැපවීම, සවිස්තරාත්මකව සහ ක්‍රියාශීලී නඩත්තු උපාය මාර්ග කෙරෙහි එහි සියුම් අවධානය යොමු කිරීම තුළින් පැහැදිලි වේ. 'සම්බන්ධිත ගිලන්රථ (Connected Ambulance) නියමු ව්‍යාපෘතියේ AI සහ මිශ්‍ර රියැලිටි තාක්ෂණයන් හඳුන්වාදීම හදිසි ප්‍රතිකාර තවදුරටත් වැඩිදියුණු කරයි. මෙම නවෝත්පාදනය මගින් ශ්‍රී ලංකාවේ හදිසි වෛද්‍ය ප්‍රතිකාරයන්හි විප්ලවීය වෙනසක් ඇති කරමින් ප්‍රවහනය අතරතුරදී රෝගීන්ට ප්‍රතිකාර ලබා දීමට අභ්‍යන්තර හදිසි වෛද්‍ය තාක්ෂණවේදීන්ට (EMTs) එමගින් ඉඩ සලසයි. මෙම උසස් තාක්ෂණයන් හරහා, 1990 සුව සැරිය මෙහෙයුම් කාර්යක්ෂමතාව විශාල ලෙස වැඩිදියුණු කර ඇති අතර, හදිසි සෞඛ්‍ය සේවා ඔප්පු කිරීමේ තාක්ෂණය (emergency healthcare proving technology) ලබා දීම, නිසි ලෙස භාවිතා කළහොත්, ශ්‍රී ලංකාවේ රාජ්‍ය සේවා සැපයීම වැඩිදියුණු කිරීමට එය උපකාරී වනු ඇත.

| මැදිහත්වීම | කාලරාමුව |
|---|---|
| **DPI:** පුද්ගල රෙජිස්ට්‍රාර් හි දැනටමත් පවතින වාර්තා ඩිජිටල් ලෙස පරිවර්තනය කිරීමෙන් ෘජෂ ව්‍යාපෘතිය සැලසුම් කිරීම, සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම අදියර වශයෙන් ආරම්භ කිරීම. සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලය (WBB) සමඟ ක්‍රියාත්මක කිරීම ආරම්භ කර ආදායම් අධිකාරීන් සහ වෙනත් සේවාවන් වෙත යොමුවීම. පළමු නව මුදල් හුවමාරු ව්‍යාපෘති අතර, ආදායම සහ/හෝ අංශය අනුව තෝරාගත් පුද්ගලයන් සඳහා ඉන්ධන සහනාධාරය සැපයීම සඳහා විය යුතුය: සුළු හා මධ්‍ය පරිමාණ කෘෂිකර්මාන්තය, ධීවර කර්මාන්තය යනාදිය. කාලයත් සමඟ DPI 'Lanka Stack' හරහා සියලු ආකාරයේ සේවාවන් සඳහා පුළුල් ආර්ථිකයක් බවට පත්වනු ඇත. | S |
| **පද්ධති ප්‍රවේශය:** අවම ප්‍රතිරෝධී හෝ වඩාත්ම දිරිමත් කරන ලද සේවාවන් සමඟින් ආරම්භ කර සමස්ත රාජ්‍ය අංශයේ පද්ධති පුරා විගණන ක්‍රියාවලි ප්‍රතිනිර්මාණය සහ ඩිජිටල්කරණය කිරීම. | M |
| **ඩිජිටල්කරණය:** සෞඛ්‍ය සහ ඉඩම් වාර්තා වැනි වාර්තා ඩිජිටල්කරණය කිරීමට දැනට සිටින කාර්ය මණ්ඩලය භාවිතා කිරීම. | M |
| **ඩිජිටල් සත්‍යාපනය (Digital verification):** ඉහළ විශ්වාසනීය, හානි නොවන ලියකියවිලි නිර්මාණය කිරීම සඳහා උප්පැන්න සහ විවාහ සහතික සඳහා ඩිජිටල් ලෙස අත්සන් කරන ලද,ෘසෘ කේත හඳුන්වා දීම. මෙය ක්ෂණික ඩිජිටල් සත්‍යාපනයට ඉඩ සලසන අතර නිල සත්‍යාපන ක්‍රියාවලීන් සදහා පුරවැසියන්ගේ කාලය සහ පිරිවැය අඩු කරයි. | S |
| **පුරවැසි සම්බන්ධතා වේදිකාව (Citizen engagement platform):** පුරවැසියන් සම්බන්ධ කර ගැනීමේ මෙවලමක් ලෙස සේවය කිරීම සඳහා එහඨදඩ වේදිකාවක් (ඉන්දියාවට සමාන) සංවර්ධනය කිරීම, රජයට පුරවැසියන් සමඟ සම්බන්ධ වීමට සහ ප්‍රතිපත්ති සහ වැඩසටහන් සඳහා ආදානය ඉල්ලා සිටීමට ඉඩ සලසයි. විනිවිදභාවය සහ මහජනතාව සමඟ සම්බන්ධ වීම ප්‍රවර්ධනය කිරීම සඳහා රාජ්‍ය මට්ටම් සහ ප්‍රතිපත්ති ක්ෂේත්‍ර හරහා තාක්ෂණික භාවිතයේ සුසංයෝගය සහතික කිරීම. | M |

# 08 බලශක්ති සහ උපයෝගිතා ප්‍රතිසංස්කරණ

වර්තමානය වන විට මෙම ක්ෂේත්‍රයේ පවතින අසාර්ථකභාවය, විශේෂයෙන්ම විදුලි බල ක්ෂේත්‍රයේ පවතින අසාර්ථකභාවය එය නවමු මාවතකට යොමුකරවීම සඳහා කඳිම අවස්ථාවක් උදා කරයි. අපගේ දැක්මට අනුව මේ සඳහා හේතු වූ මූලය වන්නේ ඇත්තේ කලක පටන් අනවශ්‍ය යෝජනා දිරිමත් කිරීමයි. මෙම ගනුදෙනු දේශපාලකයන්ට සහ නිලධාරීන්ට රාජ්‍ය ප්‍රතිපත්ති හැසිරවීමට, ලාභදායී ව්‍යාපෘති ප්‍රමාද කිරීමට, පාරදෘශ්‍ය ප්‍රසම්පාදනවලට බාධා කිරීමට සහ ඉංජිනේරු තීරණවලට පවා බලපෑම් කිරීමට ඉඩ සැලසීය.

## 8.1 කාර්යක්ෂම සහ විනිවිදභාවයෙන් යුතු බලශක්ති වෙළෙඳපොලක්

බලශක්ති ක්ෂේත්‍රය සම්බන්ධයෙන් අපගේ ප්‍රවේශය වනුයේ පුද්ගලික අභිමතය අවම කරන, පාරදෘශ්‍යභාවයෙන් යුතු, ස්වයංක්‍රීය පද්ධති ක්‍රියාවට නැංවීම කෙරෙහි අවධානය යොමු කරන, හැසිරවීම සඳහා ඇති හිඩැස් වසා දමන, සහ අනවශ්‍ය යෝජනා ගෙන එන 'ඩීල් සාදන්නන්' සඳහා දිරිගැන්වීම් ඉවත් කිරීමයි. මෑතකදී නීතිගත කරන ලද ශ්‍රී ලංකා විදුලි බල පනත විදුලිබල ක්ෂේත්‍රයේ ප්‍රතිසංස්කරණ සඳහා පදනමක් සකසන බව අපි විශ්වාස කරමු. කෙසේ වෙතත්, නිෂ්පාදනය හා බෙදා හැරීමේ තරගයක් නිර්මාණය කිරීම අත්‍යවශ්‍ය වන අතර, ඒකාධිකාරී බලය සහ අකාර්යක්ෂමතාවය හේතුවෙන් පාරිභෝගිකයින් සහ කර්මාන්ත අධික බලශක්ති පිරිවැයේ බර දරා නොගත යුතුය. අපි පිරිවැය පරාවර්තක විදුලි ගාස්තුවලට (cost-reflective electricity tariffs) සහාය දෙමු, නමුත් මෙම පිරිවැය බලශක්ති මිලදී ගැනීමේ ගිවිසුම්වල දූෂණය සහ අකාර්යක්ෂමතාව බැහැර කළ යුතුය.

අපි නව පනතේ යෝජිත ව්‍යුහය නැවත තක්සේරු කර ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියේ කාර්යක්ෂමතාව සහ පිරිවැය ඵලදායීතාවය ඉහළ නැංවීම සඳහා සංශෝධන නිර්දේශ කරන්නෙමු. අපගේ ප්‍රමුඛතා අතර සාධාරණ විදුලි වෙළඳපොලක් ස්ථාපිත කිරීම, පාරිභෝගික අවශ්‍යතා ආරක්ෂා කිරීම, වගවීම වැඩිදියුණු කිරීම සහ කර්මාන්තය දේශපාලනීකරණයෙන් ඉවත් කිරීම ඇතුළත් වේ. තරගකාරී විදුලි කර්මාන්තයක් සහතික කිරීම සඳහා ගෝලීය වශයෙන් පිළිගත් ක්‍රමවේදයන් අනුගමනය කරමින් තරගකාරී විරෝධී භාවිතයන් (anti-competitive practices), ඒකාධිකාරය, කුමන්ත්‍රණ සහ අධිපති තනතුරු අනිසි ලෙස භාවිතා කිරීම වැළැක්වීමට ද නියාමකයාට එමගින් බලය ලැබේ.

| මැදිහත්වීම | කාලරාමුව |
|---|---|
| **විදුලිය තුළ ගාස්තු සැකසීම**<br>☎ ඇතැම් ගාස්තු සංශෝධනය කර ඇතත්, භාවිතා කරන ක්‍රමවේදයේ සම්පූර්ණ විනිවිද භාවයක් නොමැත. මිල සංශෝධන තීරණය කළ යුත්තේ දේශපාලනඥයන් නොවේ; පවතින නියාමන යාන්ත්‍රණය නීතියට අනුව මහජන උපදේශන සමඟ භාවිතා කළ යුතුය.<br>☎ උපයෝගිතා සපයන්නන්ට නාස්තියෙන් හා දූෂණයෙන් තොරව වියදම් පරාවර්තක ගාස්තු (cost-reflective electricity tariffs) අය කිරීමට ඉඩ දිය යුතුය,<br>☎ අයවැයේ පාරදෘශ්‍ය රේඛා අයිතම (transparent line item) ලෙස සපයා ඇති, අවශ්‍යතා ඇති අය සඳහා ඉලක්කගත සහනාධාර සහතික කිරීම. අපි මෙම ඉලක්කගත සහනාධාර සෘජු මුදල් හුවමාරු හරහා ලබා දීමට සැලසුම් කරමු.<br>☎ ඉහත සඳහන් කළ පාරදෘශ්‍ය සූත්‍රය මත මාස හයකට වරක් ගාස්තු ස්වයංක්‍රීයව සංශෝධනය කිරීම. ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ (PUCSL) විසින් මිල සූත්‍රයේ සියලුම වියදම් වලංගු කරන අතර අවසාන පරිශීලක ගාස්තු ලැයිස්තුව අනුමත කරනු ඇත. | S |

| මැදිහත්වීම | කාලරාමුව |
| --- | --- |
| **ඉන්ධන නියාමනය:** නීති සම්පාදනය, මිල සහ තත්ත්ව නියාමනය ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ (PUCSL) වෙත පැවරීම හරහා සියලුම ඛනිජ තෙල් නිෂ්පාදන ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ (PUCSL) නියාමනය යටතට ගෙන ඒම. මෙය මෑතකාලීනව නව අධිකාරියකට මාරු කළ  නීති සංශෝධන නිවැරදි නොවේ.<br><br>☎ රජය පසුගිය වසර කිහිපය තුළ අඛණ්ඩව පවතින සුවිගත සහ සම්පූර්ණ පිරිවැය පරාවර්තක ඉන්ධන මිල සූත්‍රයෙන් බැහැර වී ඇත.එමගින්  වෙළඳපල මිල සූත්‍ර මිලට වඩා ඉහළ අගයක් ගෙන ඇති අතර, එයින් පෙන්නුම් කරන්නේ සැලකිය යුතු අමතර ආදායමක් භාණ්ඩාගාරයට එකතු විය හැකි බවයි. අපි මේ සම්බන්ධයෙන් අවශ්‍ය වෙනස්කම් සිදු කරන්නෙමු. | M |

## 8.2 පුනර්ජනනීය බලශක්තිය

**සමගි ජන බලවේගය අපේක්ෂා කරනුයේ ශ්‍රී ලංකාව කලාපීය පුනර්ජනනීය බලශක්ති බලාගාරයක් බවට පත්කිරීමේ අරමුණින් 2030 වන විට පුනර්ජනනීය බලශක්ති උත්පාදනය සඳහා වන ඉලක්කය සපුරාලීම පමණක් නොව එය ඉක්මවා යාමයි. අපි සුළං සහ සූර්ය බල ධාරිතාව වේගයෙන් ව්‍යාප්ත කිරීමටත්, ස්වභාවික සම්පත් ප්‍රයෝජනයට ගනිමින් ගෝලීය, කලාපීය සහ දේශීය බලශක්ති නිෂ්පාදකයන් සමඟ හවුල්කාරිත්වය ඇති කිරීමටත් සැලසුම් කරමු. අපගේ ඉලක්කය වන්නේ සාර්ක් රටවල් හා ඉන් ඔබ්බට ඒකාබද්ධ වෙමින් ශ්‍රී ලංකාව පුනර්ජනනීය බලශක්තියේ ශුද්ධ අපනයනකරුවෙකු බවට පත් කිරීමයි. මෙය සාක්ෂාත් කර ගැනීම සඳහා, අපි ක්ෂේත්‍රය විධිමත් කරන සහ ස්ථාවර රෙගුලාසි සහ සාර්ව ආර්ථික ස්ථාවරත්වය තුළින් ආයෝජන ආකර්ෂණය කරන පුළුල් බලශක්ති ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කරන්නෙමු. අපි පාරදෘශ්‍ය හා තරඟකාරී ප්‍රසම්පාදන ක්‍රියාවලීන්ට ප්‍රමුඛත්වය දෙන අතර අති නවීන තාක්ෂණයන් සහ යටිතල පහසුකම් සඳහා ආයෝජනය කරන්නෙමු. අපගේ දැක්මේ තීරණාත්මක අංගයක් වන්නේ පුනර්ජනනීය බලශක්තිය වෙත ගමන්කිරීම හරහා සැලකිය යුතු අඩු පිරිවැයක් යටතේ බලශක්තිය නිෂ්පාදනය කිරීමට ශ්‍රී ලංකාවට ඇති හැකියාවයි. තරඟකාරී බලශක්ති පිරිවැය සමඟින්, අපට අපගේ කාර්මික අංශය නංවාලීමට, බලශක්ති-අවශ්‍ය කර්මාන්ත ආකර්ෂණය කර ගැනීමට සහ ගෝලීය වෙළෙඳපොළ තුළ අපගේ සමස්ත ආර්ථික තරඟකාරිත්වය වැඩි දියුණු කළ හැකිය.**

| මැදිහත්වීම | කාලරාමුව |
| --- | --- |
| **නිෂ්පාදනය:** දැනටමත් අවසන් කර ඇති ශක්‍යතා අධ්‍යයනයන් මත පදනම්ව සුළං සහ සූර්ය බලශක්තිය කෙරෙහි අවධානය යොමු කරමින්, 2030 වන විට පුනර්ජනනීය ප්‍රභවයන්ගෙන් 70%ක් බලශක්තිය උත්පාදනය කිරීමට ඉලක්ක කිරීම. මෑත අධ්‍යනයන් සුළඟ සඳහා විශාල විභවයක් යෝජනා කරයි; වෙරළේ (shore) 21 GW සහ අක්වෙරළ (offshore) 56 GW. අපි පහත සඳහන් දේ සහතික කරමු:<br><br>☎ බද වෙරළ ආශ්‍රිත ව්‍යාපෘති සඳහා ඉඩම් ලබා ගැනීමේ හැකියාව සහ අක්වෙරළ සුළං සංවර්ධන සඳහා තරඟකාරී අනුමැතිය.<br><br>☎ භූගත සූර්ය බලශක්තිය ස්ථාපනය කිරීමේදී සහ හැකි සියලුම ස්ථාන හරහා පාවෙන සූර්ය උපාංග (floating solar reservoirs) ස්ථාපනය කිරීමේදී අවහිරතා ඉවත් කිරීම සඳහා සාකච්ඡා වේගවත් කිරීම.<br><br>සුළං ගොවිපලවල් දේශීය වන සතුන්ට, විශේෂයෙන්ම පක්ෂීන්ට සහ පරිසර පද්ධතිවලට අහිතකර බලපෑම් ඇති කළ හැකිය. මේ සම්බන්ධයෙන් පරිපූර්ණ පාරිසරික ඇගයීම් සිදු කරනු ලබන අතර ප්‍රාදේශීය ප්‍රජාවන් මෙම ගැටළු විසඳීමට සම්බන්ධ වනු ඇත.<br><br>☎ ඉදිරි ආයෝජන පිරිවැය ලිහිල් කිරීමට සහ බලශක්ති මිලදී ගැනීමේ ගිවිසුම්වල (PPA) දිගුකාලීන අක්‍රීය වීමේ අවදානම අඩු කිරීමට ජාත්‍යන්තර හවුල්කරුවන් සමඟ සහයෝගයෙන් නව්‍ය මූල්‍ය යාන්ත්‍රණ සැපයීම.<br><br>☎ සුළං සහ සූර්ය බලය හරහා වරින්වර පවත්නා බලශක්තිය ලබා ගැනීමට ජාල යටිතල පහසුකම් (grid infrastructure) වැඩිදියුණු කිරීම. | S<br>M L |
| **නියාමනය:** ආයතනික රාමු ශක්තිමත් කරන අතරම ස්ථාවර නීති, රෙගුලාසි සහ සාර්ව ආර්ථික ස්ථාවරත්වය ස්ථාපිත කිරීම. බලශක්ති මිලදී ගැනීමේ ගිවිසුමේ පැහැර හැරීම් වැළැක්වීම සඳහා ශක්තිමත් ඇපකර ලබා දීම, එමගින් ආයෝජක විශ්වාසය නැවත ලබා ගැනීම. | M |

# 09 සාධක වෙළෙඳපොළ ප්‍රතිසංස්කරණ

## 9.1 ශ්‍රමිකː කුසලතාවයෙන් යුක්ත සහ තරඟකාරී ශ්‍රම බලකායක් බිහි කිරීම

ශ්‍රී ලංකාවේ දිගුකාලීන සාර්ථකත්වය සඳහා නිපුණතාව සහිත සහ තරඟකාරී ශ්‍රම බලකායක් වර්ධනය කිරීම අත්‍යවශ්‍ය වේ. ලෝක බැංකුවට අනුව ශ්‍රී ලංකාවේ දරුවන්ට වඩා හොඳ අධ්‍යාපනයක් සහ සෞඛ්‍ය සේවාවක් ලබා දීමෙන් 60%ක ඉහළ ඵලදායිතාවයක් ලබා ගත හැකිය. ශ්‍රී ලංකාව සෞඛ්‍ය අතින් විශිෂ්ට වන අතර, එහි අධ්‍යාපනික ප්‍රතිඵල වියට්නාමය වැනි තරඟකරුවන්ට වඩා පසුගාමී ය. ගෝලීය වශයෙන් තරඟ කිරීමට ශ්‍රී ලංකාවට නවීන ආර්ථිකයට සරිලන ශ්‍රම බලකායක් අවශ්‍ය වේ. දකුණු ආසියාව හා සසඳන විට ශ්‍රී ලංකාව සෞඛ්‍ය හා ප්‍රාථමික අධ්‍යාපනය අතින් හොඳින් ක්‍රියාත්මක වුවද, උසස් අධ්‍යාපනය, පුහුණුව සහ ශ්‍රම වෙළෙඳපොළ කාර්යක්ෂමතාවය සැලකිය යුතු දියුණුවක් අවශ්‍ය වේ. වැඩ ආචාර ධර්ම(උදරන ඇඑයසජ), සීමාකාරී කම්කරු රෙගුලාසි සහ ශ්‍රම බලකායේ කුසලතා, ප්‍රතිසංස්කරණ සඳහා ප්‍රධාන ක්ෂේත්‍ර වේ.

මානව ප්‍රාග්ධන සංවර්ධනයේ වැදගත්කම හඳුනා ගනිමින්, අධ්‍යාපනික ප්‍රතිඵල වැඩිදියුණු කිරීම, රැකියාවට අදාළ කුසලතා වර්ධනය කිරීම සහ නවෝත්පාදනයන් පෝෂණය කිරීම ඉලක්ක කරගත් ප්‍රතිපත්තිවලට අපගේ රජය ප්‍රමුඛත්වය දෙනු ඇත. තරඟකාරී ශ්‍රම බලකායක් ගොඩනැගීම සඳහා අධ්‍යාපනයේ ගුණාත්මක භාවය සහ ප්‍රවේශ්‍යතාව ඉහළ නැංවීම ඉතා වැදගත් වේ. හෙට දවසේ රැකියා සඳහා අවශ්‍ය කුසලතා ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකාය සතු බව සහතික කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කෙරේ. මීට අමතරව, නවෝත්පාදන සහ ව්‍යවසායකත්වය මෙහෙයවන පරිසරයක් පෝෂණය කිරීම ආර්ථික වර්ධනය සඳහා අත්‍යවශ්‍ය වේ.

විශේෂයෙන්ම දක්ෂ වෘත්තිකයන් විශාල වශයෙන් රට හැරයාමත් සමඟ ශ්‍රී ලංකාව තීරණාත්මක අභියෝගයකට මුහුණ දෙයි. 2022 දී, 300,000 කට අධික පිරිසක් විදේශ රැකියා අපේක්ෂාවෙන් රට හැර ගිය අතර, ජාතියේ ඵලදායිතාවයට සහ බදු පදනමට තර්ජනයක් වන සැලකිය යුතු බුද්ධි ගලනයක් එමගින් ඇති කළේය. මෙයට පිළියමක් ලෙස, විස්තීරණ අධ්‍යාපනය සහ පුහුණු වැඩසටහන් හරහා නිපුණ ශ්‍රම බලකායක් වර්ධනය කිරීමටත්, තරඟකාරී වැටුප් සහ වෘත්තීය සංවර්ධන මාර්ග ස්ථාපිත කිරීම සඳහා පුද්ගලික අංශය සමඟ සහයෝගයෙන් ආකර්ශනීය රැකියා අවස්ථා නිර්මාණය කිරීමටත්, ජාතික සංවර්ධනය වෙනුවෙන් ශ්‍රී ලාංකීය ඩයස්පෝරාව ඔවුන්ගේ විශේෂඥතාව සහ ජාල උපයෝගී කර ගනිමින් ඔවුන් සම්බන්ධ කර ගැනීමටත් අපි සැලසුම් කරමු.

අනාගත ශ්‍රම බලකාය සඳහා සිසුන් සූදානම් කිරීම සඳහා ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්‍රමය අනුගත විය යුතුය. ෆින්ලන්තය, සිංගප්පූරුව සහ වියට්නාමය වැනි රටවල සාර්ථක ආකෘති සහයෝගීතාවයේ වැදගත්කම, ලිහිල් ඉගෙනුම් පරිසරයන් සහ පාසල් ආහාර සහ සෞඛ්‍ය සේවා වැනි මූලික අවශ්‍යතා සපුරාලීම පෙන්නුම් කරයි. මෙම ක්‍රියාවලියේදී ගුරුවරුන් ඉටු කරන තීරණාත්මක කාර්යභාරය අපි හඳුනා ගනිමු. අපි විස්තීරණ පුහුණුව සහ සම්පත් හරහා ගුරුවරුන් සවිබල ගන්වමු, තරඟකාරී වැටුප් සහ දිරිගැන්වීම් සමඟින් ඉහළ දක්ෂතා ගුරු වෘත්තියට ආකර්ශනය කර ගැනීමට සහ විශේෂයෙන් අඩු පහසුකම් සහිත ප්‍රදේශවල සුදුසුකම් ලත් ගුරුවරුන් රඳවා තබා ගැනීම කෙරෙහි අවධානය යොමු කරන්නෙමු. තර්කානුකූල සහ සාධනීය විවේචනාත්මක චින්තනය (Crtical Thinking), නවෝත්පාදනය සහ අනුවර්තනය වීම පෝෂණය කිරීම සඳහා විෂය මාලාව නවීකරණය කිරීම ද වැදගත් වේ. මීට අමතරව, අපි සාර්ථකත්වය සඳහා ශක්තිමත් පදනමක් සැපයීම සඳහා මුල් ළමාවිය සංවර්ධන වැඩසටහන් සඳහා ආයෝජනය කරන්නෙමු.

ඉදිරි වසර පහ තුළ තාක්ෂණික, හරිත හා සැපයුම් දාම පරිවර්තනයන් ගෙන එන බැවින්, මෙම නැගී එන ඉල්ලීම් සපුරාලීම සඳහා ශ්‍රී ලංකාව සිය කුසලතා සංවර්ධන වැඩසටහන් සඳහා අනුගත විය යුතුය. රැකියා අනාගත වාර්තාව (2023) මගින් විශ්ලේෂණ කුසලතා, නිර්මාණාත්මක චින්තනය, AI, විශාල දත්ත සහ නායකත්වය වැනි ප්‍රති-නිපුණතා සඳහා ප්‍රධාන ක්ෂේත්‍ර හඳුනා ගනී. මේවා රාජ්‍ය අනුග්‍රහය ලබන කුසලතා සංවර්ධන වැඩසටහන් කෙරෙහි අවධානය යොමු කළ යුතුය. තරඟකාරිත්වය ඉහළ නැංවීම සඳහා ශ්‍රම බලකායේ වැඩ ආචාර ධර්ම වැඩිදියුණු කිරීම ද ඉතා වැදගත් වේ.

පවතින ආර්ථික අර්බුදය තුළ පුරුෂ සහ කාන්තා යන දෙඅංශයෙන්ම ශ්‍රම බලකායේ සහභාගීත්වය අඩු වී ඇත. කාන්තාවන් අතර ඉහළ අධ්‍යාපන මට්ටමක් තිබියදීත්, පසුගිය දශක දෙක තුළ දැනටමත් අඩු කාන්තා සහභාගීත්ව අනුපාතය 30-35% පමණ වේ. මෙම ගැටළුව විසඳීම සඳහා, වත්මන් වැඩ කරන කාන්තාවන්ගේ සැබෑ අවශ්‍යතා මත පදනම්ව නීති සංශෝධනය කිරීම, කළමනාකරණ භූමිකාවන්හි සිටින කාන්තාවන් සඳහා උපදේශන සහ කුසලතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ ශ්‍රම

**බලකාය තුළ කාන්තාවන් වඩාත් හොඳින් ආකර්ෂණය කර ගැනීමට සහ රඳවා තබා ගැනීමට නම්‍යශීලී කාර්‍ය විධිවිධාන** (flexible **අදරන** arrangements) **ගවේෂණය කිරීම අවශ්‍ය වේ. මෙම නම්‍යශීලී කාර්‍ය විධිවිධානවලට සහාය වීම සඳහා පවතින කම්කරු නීති යාවත්කාලීන කළ යුතුය.**

| මැදිහත්වීම | කාලරාමුව |
|---|---|
| **ශ්‍රම වෙළඳපොළ ප්‍රතිසංස්කරණය කිරීම සහ පුළුල් කිරීම** | |
| **අවම වැටුප් සංශෝධනය:** ජාතික අවම වැටුප් පනතට අවශ්‍ය රෙගුලාසි මත පදනම්ව සියලුම පාර්ශවකරුවන් සමඟ සාකච්ඡා කර අවම වැටුප මසකට රුපියල් 25,000 දක්වා සංශෝධනය කිරීමට අපි යෝජනා කරමු. සටහන: අවම වැටුප මසකට රුපියල් 17,500 දක්වා වැඩි කිරීමට රජය මෑතකදී තීරණය කළේය. කෙසේ වෙතත් මෙය දරිද්‍රතා රේඛාවට ඉහලින් සිටීමට අවම වියදම් අවශ්‍යතාවය අනුව ප්‍රමාණවත් ජීවන වැටුපක් නොවේ. | S M |
| **ශ්‍රම ප්‍රතිසංස්කරණ:** පුද්ගලික අංශය කේන්ද්‍ර කරගත් සංවර්ධන උපාය මාර්ගයට අනුකූලව ශ්‍රම වෙළඳපොළ ප්‍රතිසංස්කරණවලට අදාළ ප්‍රධාන කේන්ද්‍රීය ගැටලුව වන්නේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා තීරනාත්මක වන ශ්‍රමිකයන්ගේ සහයෝගය ලබා ගැනීම සඳහා යාන්ත්‍රණයක් සැලසුම් කරන්නේ කෙසේද යන්නයි. ක්ෂණික ප්‍රතිලාභීන් (අවම වශයෙන් ශ්‍රමිකයන්ගේ දෘෂ්ටිකෝණයෙන්) සේවායෝජකයින් වන අතර විශාල වශයෙන් ශ්‍රමිකයන්ට සහ මහජනතාවට වාසි (ඉහළ වෙළඳපල තීරණය කරන ලද වැටුප් සහ වඩා හොඳ රැකියා අපේක්ෂාවන් අනුව) සැලකිය යුතු ප්‍රමාදයක් සමඟ පැමිණේ. එබැවින්, ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා, දෙපාර්ශවයටම එනම් ශ්‍රමිකයන්ට සහ සේවායෝජකයින්ට ප්‍රතිලාභ බෙදා ගැනීමට සාධාරණ අවස්ථාවක් ඇති බව සහතික කිරීමට යාන්ත්‍රණයක් සැලසුම් කිරීම අවශ්‍ය වේ.'සමාජ වෙළෙඳපොළ ආර්ථිකයකි' පිළිබඳ අපගේ දෘෂ්ටිවාදය ශ්‍රමිකයන්ගේ ගෞරවයට ඉහළ වටිනාකමක් ලබා දෙන අතර ඒ අනුව දෙපාර්ශවයටම ජයග්‍රාහී විසඳුමක් ගැන අපට විශ්වාසය. | M |
| **ආගමන ප්‍රතිසංස්කරණ:** අභ්‍යන්තර කුසලතා අත්පත් කර ගැනීම සඳහා 1948 අංක 20 දරන සංක්‍රමණ හා විගමන පනත සංශෝධනය කිරීම. මෙම ප්‍රතිසංස්කරණ මගින් වීසා ක්‍රියාවලිය ලිහිල් කරන අතර එමගින් ආරම්භක ව්‍යාපාරවල, විශේෂයෙන්ම තොරතුරු තාක්ෂණ අංශයේ වර්ධනයට සහාය වනු ඇත. ප්‍රධාන ප්‍රතිසංස්කරණ අතරට ශ්‍රී ලාංකික සම්භවයක් ඇති පුද්ගලයන්ට සහ ඔවුන්ගේ පවුල්වලට ස්ථිර නේවාසික වීසා ලබා දීම, එක්සත් ජනපදයේ ඊබී-5 වැඩසටහනට සමාන ආයෝජන වීසා බලපත්‍රයක් හඳුන්වා දීම, H1B වීසා බලපත්‍රයට සමාන පුහුණු වීසා වැඩසටහනක් සහ ශ්‍රී ලාංකික නොවන කම්කරුවන්ට වසර දෙකක් දක්වා නේවාසික වීසා දීර්ඝ කිරීම ඇතුළත් වේ. international start-up founder, සේවකයින් සහ ආයෝජකයින් සඳහා ප්‍රංශ ටෙක් වීසා හා සමාන නව වේගවත් වැඩසටහනක් හඳුන්වා දෙනු ඇත. | M |
| **ශ්‍රම බලකායේ කාන්තාවන්:** මාතෘ නීති වැඩිදියුණු කිරීම, පීතෘ නීති හඳුන්වාදීම සහ දිවා සුරැකුම් මධ්‍යස්ථාන සඳහා ජාතික ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම, රජයේ ආයතනවල දිවා සුරැකුම් ස්ථාපිත කිරීම ඇතුළුව ශ්‍රම බලකායේ කාන්තා සහභාගීත්වය ප්‍රවර්ධනය කිරීම. | S |
| **විදේශික දායකත්වය:** ශ්‍රී ලාංකික විදේශිකයන් ආර්ථිකයට දායක වීමට දිරිගැන්වීම සඳහා ප්‍රතිපත්ති සැලසුම් කිරීම, පුහුණු ශ්‍රමිකයින් සඳහා දිරිගැන්වීම් සහ විදේශිකයන් ලෙස ඔවුන්ගේ ප්‍රතිරූපය වැඩිදියුණු කිරීම. | S |
| **මානව ප්‍රාග්ධනය සංවර්ධනය හා රඳවා තබා ගැනීම** | |
| **විෂයමාලා ප්‍රතිසංස්කරණ:**<br>☎ අනාගත රැකියා ඉල්ලීම් සහ වර්තමාන ඉහළ වැටුප් සහිත මාර්ගගත රැකියා සපුරාලීම සඳහා අධ්‍යාපන 4.0 මූලධර්ම සමඟ සමපාත වූ ජාතික අධ්‍යාපන රාමුවක් සැලසුම් කිරීම. මෙම ක්‍රමය දේශීය හා ජාත්‍යන්තර අධ්‍යාපන නායකයන්ගෙන් සමන්විත කමිටුවක් විසින් සකස් කරනු ලබන අතර, ගුරුවරුන්ගේ ගෞරවය සහ ස්වාධිපත්‍යය සහතික කිරීම සහ ගුරු වෘත්තියේ උසස් තත්ත්වය ශක්තිමත් කිරීම සිදු කෙරේ. | S M L |

| මැදිහත්වීම | කාලරාමුව |
| --- | --- |
| ☎ කුඩා වයසේදීම ඉගැන්වීමේ විකල්ප මාධ්‍යයක් ලෙස ඉංග්‍රීසි භාෂාව හඳුන්වා දීමට සහ සියලුම පාසල්වලට ඖෑඑ අධ්‍යාපනය ලබා දීමට සැලසුම් කිරීම ආරම්භ කිරීම. මේ සඳහා ගෝලීය වශයෙන් පිළිගත් ඉගෙනුම් වේදිකා හඳුන්වා දෙනු ලැබේ. | M L |
| **වෘත්තීය සහ තාක්ෂණික අධ්‍යාපනය:** කාර්මික විප්ලවය 4.0 සහ මධ්‍යකාලීන කුසලතා ප්‍රමුඛතා කෙරෙහි අවධානය යොමු කරමින් පුද්ගලික අංශය සමඟ සහයෝගීතාවයෙන් ආධුනිකත්ව සහ රැකියා ස්ථානයේ පුහුණු (දබ-එයැ-වදඉ) යෝජනා ක්‍රම හරහා වෘත්තීය සහ තාක්ෂණික අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම. | M |
| **පර්යේෂණ සහ සංවර්ධනය:** නවෝත්පාදනය කෙරෙහි නව අවධානයක් යොමු කරමින් පර්යේෂණ සහ සංවර්ධනය සඳහා දිරිගැන්වීම් සෑදීම. විශ්ව විද්‍යාල සහ පර්යේෂණ ආයතන සඳහා මූල්‍ය සහ මූල්‍ය නොවන දිරිගැන්වීම් ලබා දීම සහ ප්‍රතිපත්තිමය මැදිහත්වීම් හරහා පුද්ගලික අංශයේ දායකත්වය දිරිමත් කිරීම. මෙම මුලපිරීම් සඳහා සහාය වීම සඳහා අවශ්‍ය අංශ වෙත පුහුණු ශ්‍රමය ආකර්ෂණය කර ගැනීමට පහසුකම් සැලසීම. | L |

## 9.2 භූමිය-ඵලදායිතාවය වැඩි දියුණු කිරීම සහ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම

කෘෂිකර්මාන්තයට සැලකිය යුතු ඉඩම් වෙන්කිරීමක් සහ එම අංශයේ ජනගහනයෙන් 26.5% ක රැකියා ප්‍රමාණයක් තිබියදීත්, අඩු ඵලදායිතාව හේතුවෙන් කෘෂිකර්මාන්තය දළ දේශීය නිෂ්පාදිතයට දායක වන්නේ 7.5% ක් පමණි. ඉඩම් ඵලදායිතාව ඉහළ නැංවීම සහ ඉඩම් අයිතිය තහවුරු කිරීම ඉලක්ක කරගත් ජාතික ඉඩම් ප්‍රතිසංස්කරණ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට අපගේ රජය කැපවී සිටී. දැනට ක්‍රියාත්මක බිම් සවිය වැඩසටහන සම්පූර්ණ කරමින් ඩිජිටල් ඉඩම් ලේඛනාගාරයක් නිර්මාණය කිරීම ප්‍රධාන ප්‍රමුඛතාවයක් වනු ඇත. මෙම ඩිජිටල් පරිවර්තනය ශ්‍රී ලංකාවේ ඉඩම් ඵලදායි ලෙස භාවිතයට බාධාවක් වන තීරණාත්මක ගැටලුවලට විසඳුම් ලබා දෙනු ඇත. පුරවැසියන්ට, ව්‍යාපාරවලට සහ රාජ්‍ය ආයතනවලට ප්‍රතිලාභ සැලසෙන ඉඩම් සම්බන්ධ ගනුදෙනු සඳහා එය ආරක්ෂිත වේදිකාවක් සපයනු ඇත. රජයේ ඉඩම් සඳහා වන ඩිජිටල් ලේඛනයක් මගින් භාවිත නොකළ සහ වෙන් කර ඇති ඉඩම් ඵලදායී ලෙස නිරීක්ෂණය කිරීමට බලධාරීන්ට හැකියාව ලැබේ. ඩිජිටල්කරණය සඳහා වන එක් ප්‍රවේශයකට තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය මගින් පහසුකම් සපයන National Spatial Database Infrastructure තුළ ඉඩම් දත්ත කැඩැස්තර සිතියමකට ඒකාබද්ධ කිරීම ඇතුළත් වේ.

ශ්‍රී ලංකාවේ ජීවනෝපාය වැඩිදියුණු කිරීම, තිරසාර කෘෂිකාර්මික භාවිතයන් ප්‍රවර්ධනය කිරීම, ආහාර සුරක්ෂිතතාව ඉහළ නැංවීම සහ දේපළ අයිතිවාසිකම් පුළුල් කිරීම සඳහා ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරන "උරුමය" ඉඩම් බෙදාදීමේ වැඩසටහන අපි අඛණ්ඩව ක්‍රියාත්මක කරන්නෙමු. විශේෂයෙන්ම ඉහළ අවශ්‍යතා ඇති ප්‍රදේශවල ඉඩම් කැබලි හඳුනාගෙන වැඩි ප්‍රමාණයක් ලබා දීමෙන්, ප්‍රතිලාභීන් සංඛ්‍යාව ඉහළ නැංවීම රජයේ අරමුණයි. උරුමය වැඩසටහනේ ශක්තිමත් පදනම මත ගොඩනැගෙමින්, SJB රජය පවුල් සවිබල ගැන්වීම, කෘෂිකාර්මික ඵලදායිතාව ඉහළ නැංවීම සහ ජාතියේ සමස්ත සමෘද්ධිය සඳහා දායක වීමට කැපවී සිටී.

| මැදිහත්වීම | කාලරාමුව |
|---|---|
| **ඩිජිටල් ඉඩම් ලේඛනය:** GPS/GDS තාක්ෂණය ඇතුළු ඩිජිටල් දත්ත පද්ධතියක් හඳුන්වා දීම සඳහා 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත (බිම්සවිය පනත) සංශෝධනය කිරීම. ආයෝජනය සඳහා ඌන උපයෝගිතා ඉඩම් (underutilized land) හඳුනා ගනිමින් විස්තීර්ණ ඉඩම් තොගයක් මෙමගින් නිර්මාණය වනු ඇත. දේපල හිමිකම් ප්‍රතිපාදන විධිමත් කිරීම, ඉඩම් වෙළඳපල ක්‍රියාකාරකම් සහ ආයෝජන ඉහළ නැංවීම සඳහා මාර්ගගත ඉඩම් බැංකුවක් සහ විද්‍යුත් ලේඛනාගාරයක් පිහිටුවීම ද ප්‍රතිසංස්කරණයට ඇතුළත් වේ. | S M |
| **ඉඩම් බෙදා හැරීම:** කෘෂිකාර්මික ඵලදායිතාව ඉහළ නැංවීමට සහ ජීවනෝපාය වැඩිදියුණු කිරීමට උරුමය ඉඩම් බෙදාදීමේ වැඩසටහන රට පුරා ව්‍යාප්ත කරන්න. | S M L |
| **නීතිමය වෙනස්කම්:** 1972 ඉඩම් ප්‍රතිසංස්කරණ පනත වෙනස් කිරීම හරහා රාජ්‍ය මැදිහත්වීම පොදු දේපළවලට සීමා කිරීම, පරිමාණ ආර්ථිකයන් සක්‍රීය කිරීම සඳහා කෘෂිකාර්මික ඉඩම්වල සීමාවන් සංශෝධනය කිරීම සහ ඉඩම් අත්පත් කර ගැනීමේ නඩු වලදී අභියාචනා කිරීමේ අයිතිය සමඟ වෙළඳපල මත පදනම් වූ අගය එකතු කිරීමේ යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම. | M |

## 9.3 ප්‍රාග්ධනය: ගලා ඒම වැඩි කිරීම සහ දේශීය වෙළෙඳපොළ ශක්තිමත් කිරීම

අපේ රජය ප්‍රාග්ධන ගලා ඒම ඉහළ නැංවීමට සහ දේශීය ප්‍රාග්ධන වෙළෙඳපොළ ශක්තිමත් කිරීමට ප්‍රතිසංස්කරණ කඩිනමින් ක්‍රියාත්මක කරයි. සෘජු විදේශ ආයෝජන (FDI) වැඩි දියුණු කිරීම සහ ආර්ථික වර්ධනය උත්තේජනය කිරීම සඳහා ප්‍රධාන රෙගුලාසි ප්‍රතිසංස්කරණය කරනු ඇත. 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ සංශෝධන මගින් විදේශ විනිමය පාලනයන් සංශෝධනය කෙරෙන අතර, විදේශ ආයෝජකයින් හා සමාන ඇපකර සහිතව non-resident vehicles හරහා ආයෝජනය කිරීමට පුරවැසියන්ට ඉඩ සැලසේ. 6.1 වගන්තියේ සාකච්ඡා කර ඇති පරිදි EC (BOI) වඩාත් විවෘත, ආකර්ශනීය සහ ස්ථාවර ආයෝජන පරිසරයක් නිර්මාණය කිරීම සඳහා ප්‍රතිසංස්කරණය කරනු ලැබේ.

ශ්‍රී ලංකාවේ සංවර්ධනයට සහාය වීම සඳහා විශ්‍රාම වැටුප් හා අර්ථසාධක අරමුදල්වලින් දිගුකාලීන අරමුදල් ලබා ගැනීම ඉතා වැදගත් වේ. මෙම අරමුදල් ඵලදායි ලෙස යෙදවීමට දැනට පවතින සංවර්ධන සහ වාණිජ බැංකු යොදා ගත යුතුය. මෙම ප්‍රවේශය විදේශීය පරිත්‍යාගශීලීන්, සහනදායි යාන්ත්‍රණ සහ ශක්තිමත් ආයතනික ණය වෙළඳපොළක් මගින් පරිපූරක (supplemented) කළ හැකිය.

| මැදිහත්වීම | කාලරාමුව |
|---|---|
| **ආයතනික ණය වෙළඳපොළ සංවර්ධනය කිරීම සහ බැංකු සංවර්ධනය සඳහා දිගුකාලීන අරමුදල් බැංකු වෙත ලබා දීම:** ශ්‍රී ලංකාවේ මූල්‍ය වෙළෙඳපොළ, අත්‍යවශ්‍යයෙන්ම වාණිජ සහ විශේෂිත බැංකු සහ මූල්‍ය සහ කල්බදු සමාගම්වලට දිගුකාලීන සංවර්ධන ඉලක්ක කරගත් සහ ව්‍යාපෘති මත පදනම් වූ ණය සැපයීම සඳහා දිගුකාලීන අරමුදල් නොමැත. මෙම ගැටළුවට පිළිතුර ලෙස තවත් සංවර්ධන බැංකුවක් පිහිටුවීම පමණක් අපට නොපෙනේ. සෘජු මැදිහත්වීම සඳහා සැබෑ දිගුකාලීන පෞද්ගලික ණය වෙළෙඳපොළක් හරහා මෙන්ම ණය දීම සඳහා බැංකු වෙත දිගුකාලීන අරමුදල් ලබා ගැනීම සඳහා අරමුදල් අතිරික්ත ආයතන සමඟ දිගුකාලීන අරමුදල් හිග ආයතන ගැලපීම සඳහා තිරසාර හා ශක්තිමත් යාන්ත්‍රණයක් නිර්මාණය කිරීමට අපි යෝජනා කරමු.<br><br>☎ මෙය සිදු කළ යුත්තේ විශ්‍රාම වැටුප් අරමුදල්, අර්ථසාධක අරමුදල, රක්ෂණ අරමුදල් වැනි දේ වෙළෙඳපොළ අංශයට වඩාත් සක්‍රියව සහභාගී වීමට දිරිගැන්වීම් මෙන්ම රෙගුලාසි සංශෝධනය කිරීමෙනි.<br>☎ නවෝත්පාදන සහ වර්ධනය සඳහා තීරණාත්මක මූල්‍ය අනුග්‍රහය සපයමින් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සහ ආරම්භකයින් සඳහා සහාය වීම සඳහා ස්ථිර ජාතික ණය ඇපකර ආයතනයක් (national credit guarantee institution) පිහිටුවීම. සටහන: අපි දැනටමත් මෙම සම්බන්ධයෙන් බහුපාර්ශ්වික සංවර්ධන ආයතන සමඟ සාර්ථක සාකච්ඡා පවත්වා ඇත. | M |

# 10 ශක්තිමත් සමාජ ආරක්ෂණ ජාලය

දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය සහ වෙළඳපල යාන්ත්‍රණය වැඩිදියුණු කිරීමේ ප්‍රතිසංස්කරණ හරහා ධනය නිර්මාණය කිරීම යනු ශ්‍රී ලංකාව සංවර්ධනය කිරීමේ අපගේ සැලැස්මේ එක් අංගයක් පමණි. අනෙක් අංගය වන්නේ එම ධනය සාධාරණ ලෙස බෙදා හැරීම හෙවත් ආර්ථික සාධාරණත්වයයි. ශ්‍රී ලංකාව වර්ධනය අතින් හොඳින් ක්‍රියාත්මක නොවෙනවා පමණක් නොව බෙදා හැරීමේ දී ඊටත් වඩා නරක තත්වයකට පත් වී ඇත.

ආර්ථික අර්බුදයට මොහොතකට පෙර නිල දත්ත යෝජනා කළේ ශ්‍රී ලාංකිකයන්ගෙන් ඉහළම 1% ජාතික ආදායමෙන් 15%ක් භුක්ති විඳින අතර, ඉහළම 20% සඳහා එය 51%ක් වන බවයි. ජාතික ආදායමෙන් පහළම 20%ට හිමි වන්නේ 5%ක් පමණි. UNDP විසින් මෑතකදී කරන ලද අධ්‍යයනයකින් හෙළි වූයේ ධන අසමානතාවය ඊටත් වඩා අයහපත් බවත්, ඉහළම 1% සතුව මුළු පුද්ගලික ධනයෙන් 31%ක් සහ පහළම 50% සතුව 4%ක් පමණක් ඇති බවත්ය. පෙර නොවූ විරූ ආර්ථික අර්බුදය දිළිඳු හා අවදානමට ලක්වූවන්ට තවදුරටත් බලපෑ අතර, අපගේ ආර්ථික පුනර්ජීවන සැලැස්මේ ඔවුන්ගේ ආරක්ෂාව සහ බලගැන්වීම ප්‍රධාන ප්‍රමුඛතාවයක් බවට පත් කළේය. 2024 ලෝක බැංකු සංවර්ධන යාවත්කාලීනයට අනුව දරිද්‍රතාවය 2021 දී 13.1% සිට 2023 දී 25.9% දක්වා දෙගුණ වී ඇත. මේ අනුව බලන විට, ශ්‍රී ලංකාවේ සමාජ සුබසාධන වැඩසටහන් විෂය පථය සහ අරමුණු සාක්ෂාත් කරගැනීම යන දෙකෙහිම මුළුමනින්ම ප්‍රමාණවත් පරිදි සාර්ථක නැත.

ක්ෂනික අර්බුදයට මුහුණ දීම සඳහා රජය විසින් 2023 දී, (අසාර්ථක) සමෘද්ධි යෝජනා ක්‍රමයේ මුදල් හුවමාරු භූමිකාව වෙනුවට " අස්වසුම" සමාජ ආරක්ෂණ වැඩසටහන සුබසාධන ප්‍රතිලාභ මණ්ඩලයේ අධීක්ෂණය යටතේ (WBB) හඳුන්වා දෙන ලදී. අස්වැසුමෙහි හි අරමුණු තුනක් ඇත: ඇතුළත් කිරීමේ සහ බැහැර කිරීමේ දෝෂ අවම කිරීම, පරිපාලන කාර්යක්ෂමතාව වැඩි කිරීම සහ සමාජ ආරක්ෂණයේ ඛණ්ඩනය (fragmentation) ඉවත් කිරීම වේ. කෙසේ වෙතත්, සමාජ ආරක්ෂණ රාමුව තුළ දුප්පතුන්ගේ තීරණාත්මක අවශ්‍යතා සහ පද්ධතිමය ගැටළු විසඳීමට රජය අසමත් වී ඇති අතර එම කරුණු තුනෙන්ම අසාර්ථක වී ඇත.

## "ජනසවිය" වැනි දිළිඳුකම පිටුදැකීමේ නව වැඩසටහනක්

වසර කිහිපයක් දක්වා මුදල් ලබා දීමෙන් දිළිඳුකම අවසන් නොවේ. දරිද්‍රතාවය නිවැරදිව වටහා ගත යුතුය. අධ්‍යාපනය, සෞඛ්‍ය ප්‍රමිතීන් සහ ජීවන තත්වයේ ප්‍රතිඵල ලෙස මනිනු ලබන බහුමාන දරිද්‍රතාවය වඩාත් සාකල්‍ය ආකාරයකින් ගැටළු විසඳීම සඳහා සලකා බැලීම සුදුසුය.

ආදායම් හා ධන අසමානතාවය පිළිබඳ ගැටළු ආමන්ත්‍රණය කිරීම ඉතා බරපතල රාජ්‍ය ප්‍රතිපත්තිමය කාරණයකි. සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම මගින් ආදායම් උත්පාදන ක්‍රියාකාරකම්වල නියැලීම සඳහා ආධාර ලබන්නන් දිරිමත් කළ යුතු බව අපි මූලික වශයෙන් විශ්වාස කරමු. දිළිඳුකම පිටුදැකීමේ යෝජනා ක්‍රම මගින් දිළිඳු තැනැත්තන්ට නිශ්චිත කාල සීමාවක් තුළ දිළිඳුකමෙන් මිදීමට උපකාර කළ හැක්කේ එවිටය. මුදල් වැය කිරීමෙන් දුප්පත්කම තුරන් කළ නොහැක.

මේ අනුව, අපි පෞද්ගලික අංශය සමඟ ඒකාබද්ධව සුබසාධනලාභීන්ට රැකියා සඳහා කුසලතා සහ සුදුසුකම් ලබා ගැනීමටත්, පවතින රැකියා අවශ්‍යතා සමඟ ඔවුන්ව ගලපා ගැනීමටත්, සාමාන්‍යයෙන් රැකියා උත්පාදනය කරන ආර්ථිකයක් තුළ දිළිඳුකමින් මිදීමටත් ඔවුන්ට සහාය වීම අපගේ ස්ථාවරයයි. ආධාරය කාලානුරූපී විය යුතුය. එය සහභාගීත්ව ආකෘතියක් ලෙස ව්‍යුහගත කෙරෙන අතර කාන්තා සහභාගිත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා ස්ත්‍රී පුරුෂ සමාජභාවය කේන්ද්‍රගත වනු ඇත. නිකම්ම මුදල් ලබා දීම වෙනුවට, ලබන්නන් විසින් ප්‍රාදේශීය ප්‍රජා සංවර්ධන ක්‍රියාකාරකමකට හෝ නිපුණතා පුහුණුවකට සහභාගී වී පරිභෝජනය සඳහා දී ඇති මුදලක් ලබා ගැනීමට අවශ්‍ය වන අතර ඉතිරිය අනාගත ආයෝජනය සඳහා අනිවාර්ය පදනමක් මත ඉතිරි කළ යුතුය.

මේ අනුව, සමාජ ආරක්ෂණ ජාල යෝජනා ක්‍රමය ඉහළට සමාජ සංචලනය සඳහා පහසුකම් සපයන අතරම අවදානමට ලක්විය හැකි පුද්ගලයින් ආරක්ෂා කරන එකක් බවට පරිවර්තනය කිරීම සඳහා මූල්‍ය ආධාර සපයන යෝජනා ක්‍රමයක් බවට අපි වර්තමාන යෝජනා ක්‍රමය සම්පූර්ණයෙන්ම ප්‍රතිසංස්කරණය කරන්නෙමු.

## සහනාධාර බෙදා හැරීම තුළ ආර්ථික සාධාරණත්වය ඇති කිරීම

ශ්‍රී ලාංකිකයන් දශක ගණනාවක් තිස්සේ සමාජ ආරක්ෂණ ක්‍රමයක් ලෙස සහනාධාර මත දැඩි ලෙස රඳා පවතී. බොහෝ රජයන් කාලසීමාව හෝ ප්‍රතිඵලය පිළිබඳ කිසිදු සීමාවකින් තොරව නාමික වශයෙන් සහනාධාරවල වටිනාකම අඛණ්ඩව වැඩි කර ඇත. සහනාධාර ජනප්‍රිය වන අතර මැතිවරණ ජයග්‍රහණය සඳහාද එය භාවිතා කරන නමුත්, මූල්‍යමය වශයෙන් මෙන්ම සමානාත්මතාවයේ දෘෂ්ටිකෝණයකින් ද එමගින් දැඩි පසුබෑමක් ඇත. ඒවා අතර ප්‍රධාන වන්නේ සාමාන්‍ය මිල අඩුකිරීම් ලාභදායී නොවීම, එමගින් අධි පරිභෝජනය දිරිමත් කිරීම සහ ප්‍රධාන වශයෙන් ධනවතුන්ට සුබසාධනයේ අසමානතාවය වැඩි වීම ය. අපගේ සිදුවීමේදී, මෙම ගැටළුව සාධාරණත්ව ගැටළු වලින් ඔබ්බට ගිය ආකාරය අපි දුටුවෙමු. එවැනි සාමාන්‍ය ඉලක්ක රහිත සහනාධාර හේතුවෙන් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සහ ලංකා විදුලිබල මණ්ඩලය විසින් සිදු කරන ලද දැවැන්ත පාඩු හේතුවෙන් සමස්ථ බැංකු පද්ධතියටම බලපාන පරිදි විශාල ණය සමුච්චයක් ඇති විය. මෙම පාඩු අපගේ ණය ගෙවීමේ නොහැකියාවට බෙහෙවින් දායක විය.

කලින් සහනාධාර ලබා දුන් උපයෝගිතා සඳහා පිරිවැය මත පදනම් වූ මිලකරණ යාන්ත්‍රණය (cost-based pricing mechanism) පිළිගනිමින් සහ අඩු ආදායම මත ගෙවීමේ හැකියාව කෙරෙහි අවධානය යොමු කිරීම පමණක් ප්‍රමාණවත් නොවන බව සඳහන් කරමින් අපගේ රජය සහනාධාර බෙදා හැරීමේ ප්‍රතිසංස්කරණ ආරම්භ කරනු ඇත්තේ සමාජයේ වැඩි සමානාත්මතාවය සහ ආර්ථික සාධාරණත්වය ඇති කිරීම සඳහා අවශ්‍යතා ඇති අය ඉලක්ක කර ගනිමිනි. අදියර වශයෙන් අපි ඉලක්කගත පවුල් සඳහා විවිධ ආකාරයේ සහනාධාර සෘජු මුදල් හුවමාරු ලෙස සිදු කරන්නෙමු. පවුල් ඉලක්ක කිරීම පරීක්ෂණ ක්‍රම මත පදනම් විය යුතු අතර දැනට පවතින ජන සංගණනය එහි ආරම්භක ලක්ෂ්‍යය වනු ඇත. කාලයාගේ ඇවෑමෙන් සාමාන්‍ය සහනාධාර හොඳින් සැලසුම් කළ සහ ලාභදායී ශක්තිමත් සමාජ ආරක්ෂණ ජාලයක් මගින් ප්‍රතිස්ථාපනය (replaced) කළ යුතුය.

## ජනගහනය වයස්ගත වීම සහ ඇතුළත් විශ්‍රාම වැටුප් ප්‍රතිසංස්කරණ (Population ageing and inclusive pension reform)

ජනගහනය වයස්ගත වීමේ පීඩනය ශ්‍රී ලංකාවට දැනටමත් දැනෙමින් තිබේ. වැඩිහිටි යැපුම් අනුපාතය (old-age dependency ratio) හෙවත් වැඩකරන ජනතාවගේ කොටසට වඩා අවුරුදු 60 (65) ට වැඩි ජනගහනයේ කොටස, නිදහස ලබන විට 5% සිට වර්තමානය වන විට 18% දක්වා වැඩි වී ඇති අතර එය 2050 වන විට 50% ඉක්මවනු ඇතැයි පුරෝකථනය කර ඇත. ඉහළ යන සෞඛ්‍ය පිරිවැයත් සමඟ, ජ්‍යෙෂ්ඨ පුරවැසියන් කක්ෂ හෝ භක්ෂ වලින් පිළිබිඹු වන පරිභෝජන කූඩයට (consumption basket) වඩා වෙනස් තත්ත්වයකට මුහුන දෙයි.එය සෙසු ජනගහනයට සාපේක්ෂව සැබෑ ආදායමේ තියුනු පහත වැටීමකට තුඩු දෙයි. මීට අමතරව, වැඩිහිටි ජනගහනයෙන් 50% කට වඩා වැඩි පිරිසකට මාසික විශ්‍රාම වැටුපක් නොමැති අතර, එමගින් ප්‍රශ්නයට විසඳුම් සෙවීමේ බලවත් අවශ්‍යතාවය ඉස්මතු කරයි.

කෙටි කාලීනව, දිළිඳු වැඩිහිටි ප්‍රජාවට හොඳින් ඉලක්ක කරගත් මුදල් ප්‍රතිලාභ ලබා දීම සහ ස්ථාවර තැන්පතු පොලී ආදායම මත යැපෙන මධ්‍යම පාන්තික වැඩිහිටියන්ට පොලී සහනාධාරයක් ලබා දීම අවශ්‍ය වේ. ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා වන වත්මන් පොලී සහනාධාර යෝජනා ක්‍රමය දුර්වල ලෙස ඉලක්ක කර ඇති අතර ධනවත්ම පුද්ගලයන් ද ඊට ඇතුළත් වේ. මීට අමතරව, අත්‍යවශ්‍ය වයෝවෘද්ධ ඖෂධවල මිල අඩු කිරීම ද ඉතා වැදගත් වේ.

දිගුකාලීන තිරසාරභාවය සඳහා, අපි ශ්‍රී ලංකාවේ විශ්‍රාම වැටුප් ක්‍රමයේ විස්තීර්ණ ප්‍රතිසංස්කරණයක් යෝජනා කරමු. මෙයට රාජ්‍ය සේවා සේවකයන්, පෞද්ගලික අංශයේ සේවකයන් සහ විදෙස්ගත ශ්‍රමිකයින් ඇතුළු සියලුම පුරවැසියන්ට ප්‍රවේශ විය හැකි විශ්වීය, දායක විශ්‍රාම වැටුප් ක්‍රමයක් (contributory pension scheme) නිර්මාණය කිරීම ඇතුළත් වේ. රාජ්‍ය සේවකයින් දායක නොවී විශ්‍රාම වැටුප් ලබන දැනට පවතින ආකෘතිය මූල්‍යමය වශයෙන් තිරසාර නොවන අතර ප්‍රතිසංස්කරණ අවශ්‍ය වේ.

මෙම විශ්‍රාම වැටුප් ක්‍රමය මගින් විශ්‍රාමිකයින්ට ඔවුන්ගේ ප්‍රතිලාභ ලැබෙන ආකාරය, එකවර ගෙවීම්, සාමාන්‍ය විශ්‍රාම වැටුප් ගෙවීම් හෝ මේ දෙකේම එකතුවක් හරහා නම්‍යශීලී බවක් ලබා දෙනු ඇත. සේවක අර්ථසාධක අරමුදලේ දායකයින්ට විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ රඳවා ගනිමින් විශ්‍රාම වැටුප් අරමුදලට ඔවුන්ගේ ශේෂයෙන් කොටසක් හෝ සම්පූර්ණයෙන් මාරු කිරීමට ඉඩ දිය හැකිය. මෙම යෝජනා ක්‍රමය මගින් ශ්‍රම වෙළඳපොළ නම්‍යශීලීභාවය සහ කාර්යක්ෂමතාව ප්‍රවර්ධනය කරනු ලබන්නේ එමගින් රජයේ රැකියා සඳහා ඇති ආකර්ෂණය අඩු කිරීම සහ ක්ෂේත්‍ර හරහා සහ ජාත්‍යන්තරව පවා ශ්‍රම සංචලනය (labor mobility) දිරිගැන්වීමෙනි. මෙම සංක්‍රාන්තියට සහාය වීම සඳහා, ඵලදායී විශ්‍රාම සැලසුම් සහ ආයෝජන උපාය මාර්ග සඳහා අවශ්‍ය දැනුමෙන් පුරවැසියන් සන්නද්ධ කිරීම සඳහා අපි මූල්‍ය අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක කරන්නෙමු. තරුණ සේවකයන් සඳහා ප්‍රතිසංස්කරණ හඳුන්වා දෙන අතරම විශ්‍රාම යාමට ආසන්න අය ආරක්ෂා කිරීම සඳහා ක්‍රමානුකූල සංක්‍රාන්තියක් (gradual transition) අත්‍යවශ්‍ය වේ. නිතිපතා සමාලෝචන මගින් පද්ධතියේ තිරසාරභාවය සහ කාලයත් සමඟ ඵලදායී බව සහතික කරනු ඇත.

### ආර්තව දරිද්‍රතාවය (Period Poverty) ආමණ්ත්‍රණය කිරීම- ශ්‍රී ලංකාවේ ආර්තව සාධාරණත්වය සඳහා වූ යෝජනාවකි

ආර්තව දරිද්‍රතාවය,එනම් අත්‍යාවශ්‍ය ඔසප් නිෂ්පාදන ලබා ගැනීමට හෝ ප්‍රවේශ වීමට ඇති නොහැකියාව, ශ්‍රී ලංකාවේ සැලකිය යුතු ප්‍රශ්නයක් ලෙස පවතින අතර එය කාන්තාවන්ගේ ආර්ථික හා අධ්‍යාපනික ප්‍රතිඵලවලට බලපෑම් කරයි. ශ්‍රී ලංකාවේ කාන්තාවන්ගෙන් අඩකට ආසන්න ප්‍රමාණයකට සනීපාරක්ෂක නිෂ්පාදන අවශ්‍ය වේ, නමුත් 2019 දී, ඔසප් වීමේ කාන්තාවන් සිටින නිවාසවලින් 43% ක් පමණ තවමත් සනීපාරක්ෂක තුවා මිලදී ගැනීම වාර්තා කර නැත.එය වසංගත තත්වය හා ආර්ථික අර්බුදයෙන් උග්‍ර විය හැකිය. මෙයට එරෙහිව සටන් කිරීම සඳහා, සනීපාරක්ෂක තුවා මිලදී ගැනීම සඳහා 6 ශ්‍රේණියේ සිට 13 ශ්‍රේණි දක්වා පාසල් දැරියන් මිලියන 1.2 කට රුපියල් 500 ක් වටිනා මාසික වවුචර ලබාදීමේ ඉලක්කගත මුලපිරීමක් අපි යෝජනා කරමු. වාර්ෂිකව ඇස්තමේන්තුගත රුපියල් බිලියන 7ක් වැය වන මෙම වැඩසටහන ස්වයං ඉලක්කගත යාන්ත්‍රණයක් ලෙස ව්‍යුහගත කෙරේ. පන්ති භාර ගුරුවරයා විසින් පාසල් වර්ෂය අවසානයේ (ඊළඟ වසර සඳහා) QR කේතයක් මත පදනම්ව මෙම සහනාධාරය සඳහා ලියාපදිංචි වන ලෙස ශිෂ්‍යාවගෙන් (හෝ දෙමාපියන්) ඉල්ලා සිටිය යුතුය. මෙමගින් ශිෂ්‍යාවට හෝ දෙමාපියන්ට රට පුරා තෝරාගත් අලෙවිසැල්වලින් මාසිකව අදාල නිෂ්පාදනය මිලදී ගත හැකිය. අතිශයින්ම ග්‍රාමීය ප්‍රදේශවල අපි සුදුසු බෙදාහැරීමේ ක්‍රමයක් භාවිතා කරමු. මෙම යෝජනාව පාසල් ශිෂ්‍යාවන්ගේ මාසික අවශ්‍යතා සඳහා පමණක් නොව ශ්‍රී ලංකාවේ පුළුල් ප්‍රජාව සඳහා දිගුකාලීන ආර්ථික හා සමාජීය ප්‍රතිලාභ වැඩිදියුණු කිරීම ද අරමුණු කරයි.

## සාමාජිකයින්ට වඩා හොඳ ප්‍රතිලාභ ලබා දීම සඳහා EPF අනිසි භාවිතය කිරීම නැවැත්වීම

සේවක අර්ථසාධක අරමුදල වසර ගණනාවක් තිස්සේ වංචනික පුද්ගලයින් විසින් අවභාවිත කර ඇත. බැඳුම්කර වෙළෙඳපොළේ සහ කොටස් වෙළෙඳපොළේ ක්‍රියාකාරකම් පිළිබඳ විමර්ශනය කිරීමේ 2019 ජනාධිපති කොමිෂන් සභාව විසින් බැඳුම්කර සහ කොටස් දෙකෙහිම EPF ආයෝජනවල සිදු වූ දරුණු අක්‍රමිකතා සිදුවූ බව සොයා ගන්නා ලදී. වංචා සහගත බැදුම්කර ගණුදෙණු හේතුවෙන් ඈජඅ වෙත විශාල අලාභයක් සිදුව ඇති බව කදඡ විසින් සොයාගනු ලැබුවද, මෙම මූල්‍ය අපරාධ සම්බන්ධයෙන් කිසිවකු වරදකරු වී නොමැත. මෑතක දී සමහර ප්‍රමුඛ ව්‍යාපාරිකයන් වසර 13 කට පසු කොටස් වෙළඳපොලේ ඈජඅ ගණුදෙනුවලට අදාල ඔවුන්ගේ ‘Pump and dump’ රැස් කළහ. නමුත් අර්ථසාධක අරමුදලට සිදු වූ පාඩුව අයකර නොමැත. සේවක අර්ථසාධක අරමුදල උල්ලංඝණය කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු සියලු දෙනා නීතියේ රැහැනට හසුකර ගැනීමට අපේ රජය සහතික වෙමු. ඉන් ඔබ්බට සාමාජිකයින්ගේ විශ්‍රාම අරමුදල්වලට හැකි උපරිම ප්‍රතිලාභ ලැබෙන බවට වග බලා ගැනීම සඳහා අවශ්‍ය නෛතික සහ නියාමන යටිතල පහසුකම් ක්‍රියාත්මක කිරීමට අපි කටයුතු කරන්නෙමු.

| මැදිහත්වීම | කාලරාමුව |
|---|---|
| නව වැඩසටහන ක්‍රියාත්මක වන තුරු වැඩි සුබසාධන ප්‍රතිලාභ ගෙවීම් ද සමඟින් අස්වැසුම අඛණ්ඩව පවත්වාගෙන යාම<br><br>☎ රු. 10,000/මාසිකව (රු.5,000 සිට) සංක්‍රාන්තික සහ අවධානමට ලක් වූ 960,000කට<br>☎ රු. 10,000/මාසිකව (රු. 8,500 සිට) ‘දිළිඳු’ 960,000 කට<br>☎ ‘අන්ත දිළිඳු’ කාණ්ඩයෙහි වෙනසක් නැත. ගෙවීම රු.15,000 මාසිකව 480,000කට<br><br>ආබාධ සහිත පුද්ගලයින්ට, මූලය හඳුනා නොගත් (CKDu) වකුගඩු රෝගීන්ට සහ වැඩිහිටි පුරවැසියන්ට;<br>☎ විවිධ ආබාධ සහිත පුද්ගලයින් 410,000ක් සඳහා මසකට රුපියල් 10,000 (රු. 7,500 සිට).<br>☎ කණෲම රෝගී පත් පුද්ගලයින් 50,000ක් සඳහා මසකට රුපියල් 10,000 (රු. 7,500 සිට).<br>☎ වැඩිහිටි පුරවැසියන් 820,000ක් සඳහා මසකට රුපියල් 5,000 (රු. 3,000 සිට). | S M |

| මැදිහත්වීම | කාලරාමුව |
| --- | --- |
| **"අස්වැසුම" සිට නව වැඩසටහනට සංක්‍රමණය වීමේදී, පවතින සුබසාධන යෝජනා ක්‍රම ශක්තිමත් කිරීම, ඩිජිටල්කරණය භාවිතා කිරීම, සුදුසුකම් වැඩිදියුණු කිරීම සහ උර්ර් හි ධාරිතාව වැඩි කිරීම.**<br>☎ සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලය (WBB) යටතේ සියලුම සුබසාධන යෝජනා ක්‍රම ඒකාබද්ධ කිරීම සහ අනන්‍ය ID ආකෘතියක් (DPI iy Lanka Stack) භාවිතා කරමින් ඒකාබද්ධ ප්‍රතිලාභි දත්ත ගබඩාවක් ස්ථාපිත කිරීම.<br>☎ ඇස්වසුම ප්‍රතිලාභීන්ගේ සහ ඔවුන්ගේ පවුල්වල හඳුනාගත් වියදම් කළමනාකරණය කිරීමට ඍජුෂ භාවිතා කිරීම. වසරකට අඩු ළදරුවන් සිටින පවුල් සඳහා ආහාර වවුචර ලබාදීමේ ක්‍රමවේදය පුළුල් කිරීම.<br>☎ ඇතුළත් කිරීම් සහ බැහැර කිරීමේ දෝෂ අවම කිරීම සඳහා "අස්වැසුම" සඳහා පවතින සුදුසුකම් නිර්ණායක සමාලෝචනය කර යාවත්කාලීන කිරීම. දැනට පවතින ජාතික සංගණනය නිවැරදි කිරීම සඳහා පදනම විය යුතුය. මූලික නිර්ණායකයක් ලෙස විදුලිය භාවිතය භාවිතා කරමින් ප්‍රතිලාභි ලැයිස්තුව නිතිපතා තක්සේරු කිරීම.<br>☎ ශක්තිමත් නායකත්වය සහ හිමිකාරිත්වය සහතික කිරීම සඳහා WBB වෙත සෘජුවම වාර්තා කරමින් සෑම DS කාර්යාලයකටම හොඳින් පුහුණු වූ WBB නිලධාරීන් පත් කරන්න.<br>☎ උසස් සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම සහ බහුපාර්ශ්වික නියෝජිතායතන ඇති රටවලින් විශේෂඥ දැනුම ලබා ගනිමින් අනෙකුත් රජයේ දත්ත සමුදායන් සමඟ WBIS ඒකාබද්ධ කරන්න. | S M |
| **සෘජු මුදල් ලබා දීම් ඒකාබද්ධ කිරීම:** මුදල් ලබා දීම සෘජුවම බැංකු ගිණුම් හෝ ජංගම මුදල් ගිණුම් වෙත සැපයිය යුතු අතර සියලුම වැඩසටහන් හරහා සහනාධාර තාර්කික වැඩසටහනට සම්බන්ධ කළ යුතුය. මෙය DPI පද්ධතිය Lanka Stack හරහා සක්‍රීය කෙරේ. යෝජිත ආකෘතියේ දී, නිවසකට අවශ්‍යතාවය අනුව විවිධ මුදල් ලබා දීම් ගණනාවක් ලැබිය යුතුය. උදා; ඉන්ධන සඳහා සහනාධාරයක්, පොහොර සඳහා සහනාධාරයක්, පවුලේ පාසල් යන සිසුවියට සනීපාරක්ෂක තුවා සඳහා තවත් සහනාධාරයක් සහ තවත් දේ. මත්පැන් සඳහා එම සහනාධාර අනිසි ලෙස භාවිතා කරන්නේ නම් සහනාධාර ඉවත් කිරීම සඳහා කොන්දේසි සහිත වියදම් කිරීමේ යාන්ත්‍රණයක් අපි අපේක්ෂා කරමු. | S |
| **ජනසවිය වැනි නව දිළිඳුකම පිටුදැකීමේ වැඩසටහනක්:** විස්තර කර ඇති පරිදි, සියලු දෙනාටම ජයග්‍රහණයක් නිර්මාණය කිරීම සඳහා විවිධ පාර්ශවකරුවන් සමඟ සාකච්ඡා කර නව සහභාගීත්ව වැඩසටහන ව්‍යුහගත කිරීම ආරම්භ කිරීම. අපගේ යෝජනාව වන්නේ නිවසේ සිටින හඳුනාගත් කාන්තාවක් (බිරිඳ/මව/දුව) විසින් වගකිව යුතු මාස 24ක කාලයක් සඳහා පවුලකට රුපියල් 20,000ක් ලබා දීමයි. | S M |
| **ආබාධ සහිත පුද්ගලයින් සවිබල ගැන්වීම:** මාර්ගගත අධ්‍යාපන අවස්ථා ලබා දීම සහ ආබාධ සහිත පුද්ගලයින් සඳහා නිවසේ සිට වැඩ කිරීමට සහාය වීම. | M L |
| **ප්‍රවීණ පරිපාලනය:** ප්‍රවීණයන් සම්බන්ධ සියලු කටයුතු සඳහා අපි විශේෂ කාර්යාලයක් පිහිටුවන්නෙමු. සියලුම රණවිරුවන්ට අවශ්‍ය සහාය ලබා දීම සහතික කිරීම සඳහා මෙම කාර්යාලය සියලුම රාජ්‍ය ආයතන සමඟ සම්බන්ධීකරණය කළ යුතුය. | M |
| **විශ්ව දායක විශ්‍රාම වැටුපක්** (universal contributory pension) නිර්මාණය කිරීම. අපි රාජ්‍ය සේවා සේවකයන්, පෞද්ගලික අංශයේ සේවකයන්, සහ විදෙස්ගත ශ්‍රමිකයන් ඇතුළු සියලුම පුරවැසියන්ට ප්‍රවේශ විය හැකි දායක යෝජනා ක්‍රමයක් සකස් කිරීම ආරම්භ කරමු. | M |
| **සේවක අර්ථසාධක අරමුදලේ විනිවිදභාවය වැඩි දියුණු කිරීම සඳහා නව නීති ගෙන ඒම සහ මණ්ඩලයේ සේවක නියෝජනය හඳුන්වා දීම.** විශ්‍රාමික අරමුදලේ ආයෝජන පිළිබඳ නිරන්තර වෝහාරික විගණනය අනිවාර්ය කිරීම ඇතුළුව එහි ආරක්ෂාව සහතික කිරීම සඳහාත් අරමුදලේ කළමනාකරණයට සේවක නියෝජනය ගෙන ඒම සඳහාත් අපි වත්මන් නීති සංශෝධනය කරන්නෙමු. | S M |
| **ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා තාවකාලික පොලී සහනාධාරය:** ඔවුන්ගේ ස්ථාවර තැන්පතු සඳහා වන පොලී අනුපාත පහත වැටීම හේතුවෙන් වඩාත්ම බලපෑමට ලක් වූ ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට උපකාර කිරීම සඳහා, අපි පවතින අනුපාතයට සම්බන්ධ තාවකාලික පොලී සහනාධාරයක් හඳුන්වා දෙන්නෙමු. සුදුසුකම් දැඩි ලෙස බලාත්මක කරනු ඇත. | S |

# සාරංශය: සැමට ප්‍රතිලාභ ලැබෙන මාවතක්

Blue print 3.0 මගින් ශ්‍රී ලංකාව සඳහා ජ් හි ආර්ථික දැක්ම ඉදිරිපත් කරයි: එය සමාජ සාධාරණත්වයේ ස්ථායීකරණ බලය මගින් නව්‍යකරණයට සහ තරඟකාරිත්වයට පුද්ගල නිදහස සමතුලිත වන සමාජ වෙළඳපොල ආර්ථිකයකි. ශ්‍රී ලංකාව අර්බුදයෙන් ක්‍රමානුකූලව යථා තත්ත්වයට පත්වීම තිරසාර, සමානාත්මතාවය, සියල්ල ඇතුළත් වර්ධනයක් බවට පත් කිරීම සහතික කිරීම සඳහා මෙම සමතුලිතතාවය යතුර වන බව අපි විශ්වාස කරමු.

## අඛණ්ඩතාව සහ වෙනස් වීම (Continuity and Change)

අපි දැනටමත් 2022 දී ආර්ථික අර්බුදයේ ගැඹුරින් යම් දුරකට ගොඩට පැමිණ ඇති අතර, සිදුවී ඇති ධනාත්මක වෙනස්කම් අපි පිළිගනිමු. IMF සමග ආණ්ඩුවේ ඵලදායී නියැලීම, ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ප්‍රගතිය සහ රාජ්‍ය මූල්‍ය, රාජ්‍ය ණය සහ මූල්‍ය ප්‍රතිපත්තිය පිළිබඳ ඉතා අවශ්‍ය නීති සම්පාදනය මෙයට ඇතුළත් වේ. SJB විසින් මෙම ප්‍රකෘතිමත් වීමේ මාවත අඛණ්ඩව පවත්වා ගෙන යන අතර පසුගාමී ක්ෂේත්‍ර ප්‍රතිසංස්කරණය කිරීම වේගවත් කරනු ඇති අතර එය විශේෂයෙන්ම නොනැසී පවතින දූෂණය සම්බන්ධයෙන් අදාල වේ. නමුත් ශ්‍රී ලංකාවේ ආර්ථිකය ප්‍රකෘති කිරීම එහි ජනතාවගේ පැවැත්මට හානියක් නොවන බව සහතික කිරීම සඳහා අත්‍යවශ්‍ය ඉලක්කගත වෙනස්කම් ද සිදු කරනු ඇත.

## වර්ධනයේ එන්ජින් (The Engines of Growth)

සාර්ව ආර්ථික ස්ථාවරත්වය පවත්වා ගැනීම සහ රාජ්‍ය ආදායම ඉහළ නැංවීම අපගේ යළි නැගී සිටීම සඳහා අත්‍යවශ්‍ය වන අතර, අපට තවදුරටත් වර්ධනයේ එන්ජින් නොසලකා හැරිය නොහැක. අර්බුදකාරී චක්‍රයෙන් ශ්‍රී ලංකාව ස්ථිරවම ගොඩ ගන්නා දිගු කාලීන වර්ධනයක් සඳහා, අප විසින් අපනයනය ඉලක්ක කරගත් අංශ දිරිමත් කළ යුතු අතර බාහිර නැඹුරු ප්‍රතිපත්ති (outward-oriente) චදකසපජසඞ) වැලඳ ගත යුතුය. ගෝලීය ඒකාග්‍රතාවය තුලින්, කුඩා දේශීය වෙළඳපොලක බාධාවන්ගෙන් අපි නිදහස් වෙමු. ශ්‍රී ලංකාව එහි උපායමාර්ගික ගෝලීය පිහිටීමෙන් අවසානයේ ප්‍රතිලාභ ලබන අතර, ගෝලීය වෙළඳපොළකට අයත් වීමේ ප්‍රතිලාභය ශ්‍රී ලාංකිකයන් දකිනු ඇත. "තාප්ප බිඳ දමා ලෝකයට පාලම් තැනීමෙන්" සෑම අංශයකටම - කෘෂිකර්මාන්තයේ සිට කර්මාන්ත දක්වා සේවා දක්වා - දියුණු වීමට සහ වර්ධනය වීමට අවස්ථාව ලැබෙනු ඇත.

## තිරසාර වෙනසක් සඳහා ප්‍රතිසංස්කරණ (Reforms for Sustained Change)

මෙම ගමන පහසු නොවනු ඇතිය. අපගේ සැබෑ හැකියාවන් සාක්ෂාත් කර ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ බොහෝ ව්‍යුහයන් සහ පද්ධති වෙනස් විය යුතුය. රාජ්‍ය අංශය සහ රජය සතු ව්‍යවසායන් ප්‍රතිසංස්කරණය කිරීම වැනි දේශපාලනික වශයෙන් දුෂ්කර ක්‍රියාමාර්ග ඇතුළුව රජයේ වියදම් සීමා කිරීම ද මේ සඳහා අත්‍යවශ්‍ය වේ. ඉඩම්, ශ්‍රමය සහ ප්‍රාග්ධනය යන අධික ලෙස නියාමනය කරන ලද සාධක වෙලඳපොලවල් ලිහිල් කිරීම මෙන්ම බලශක්ති සහ උපයෝගිතා වෙලඳපොලවල ප්‍රතිසංස්කරණ ද අත්‍යවශ්‍ය වේ. ප්‍රතිසංස්කරණයේ සියලුම අංශ හරහා ඩිජිටල්කරණය උත්තේජනය කිරීමෙන්, අපි සියලු අංශ හරහා කාර්යක්ෂමතාව සහ ඵලදායිතාව ඉහළ නංවන්නෙමු.

## සියලුම ශ්‍රී ලාංකිකයන්ට ජයක් (A Win For All Sri Lankans)

සියල්ල ඇතුළත් තිරසාර සංවර්ධනය ඉල්ලා සිටින්නේ ආර්ථිකයට සහභාගී වීමට සියලුම පුරවැසියන් සවිබල ගැන්වීමයි. කෙසේ වෙතත්, වෙළඳපල ආර්ථිකයන් ආදායම් විෂමතා ඇති කරන බව අපි හඳුනා ගනිමු. සමහර අසමානතාවයන් නොවැළැක්විය හැකි වුවද, අපගේ වෙළඳපල-නැඹුරු ප්‍රතිපත්ති සමග ඉලක්කගත සමාජ ආරක්ෂණ ජාලය ක්‍රියාත්මක කළ යුතුය. ශක්තිමත්, විනිවිද පෙනෙන සහ සාධාරණ සමාජ සුබසාධන පද්ධතියක් ගොඩනැගීම සැමට ප්‍රතිලාභ අත්කර ගැනීමට සහ දුෂ්කර ආර්ථික ප්‍රතිසංස්කරණ පිළිගැනීම සහතික කිරීම සඳහා අත්‍යවශ්‍ය වේ. සම්පත් වඩාත් අවශ්‍ය අය වෙත ළඟා වන බව සහතික කරමින් මුදල් ලබා දීම් හරහා සෘජු පාරිභෝගික සහනාධාර සඳහා අපි පෙනී සිටිමු. අවසාන වශයෙන්, තම පුරවැසියන් සැබවින්ම සවිබල ගැන්වීම සඳහා, රජය විසින් දූෂණයෙන් වැළකී සිටීම, යහපාලනය සහ නීතිය හා සාමය ආරක්ෂා කිරීම මගින් ඔවුන්ට ගරු කළ යුතු බව අපි පිළිගනිමු.

අද සහ මතු පරම්පරාවන් සඳහා, සියලු ශ්‍රී ලාංකිකයන් සඳහා දීප්තිමත් අනාගතයක් සඳහා අපගේ සැලැස්ම (Blue print) මෙයයි.

සජිත් ප්‍රේමදාස
சஜித் பிரேமதாச
**Sajith Premadasa**

www.sajith.lk